# 2022 නොවැම්බර් මස 25 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනී ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍රරංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2022.11.25 වන දින විශේෂ මහා සභා රැස්වීමේ කැඳවීම් නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

**<u>නගරාධිපති - ඩබ් . සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අද දින න්‍යාය පත්‍රය අනුව 2022. 10. 14 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 29 යටතේ අනුමත වාර්තාව අනුව මොරටුව මහා නගර සභාවේ 2023 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛනය අනුමත කිරීම ඉදිරිපත් කරන්න ලැබෙන අවස්ථාවේදි, පළමුව මා සම්ප්‍රදානුකූලව ප්රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් කරගන්නවා,

## <u>ඇයවැය කතාව හා ප්‍රතිපත්ති ප්‍රකාශනය - 2023</u>

ගරු ස්වාමින්වහන්ස,
ගරු අනාගාමික පූජකතුමනි,
ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි,
ගරු විපක්ෂනායක තුමනි,
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,
ගරු මහා නගර සභා මන්ත්‍රීවරියනි,
නාගරික කොමසාරිස්තුමා ඇතුලු,
නිලධාරි මහත්ම මහත්මියනි,
මාධ්‍යවේදී මහත්ම මහත්මියනි,
ගෞරවනීය මොරටුව පුරවැසියනි,

මොරටුව මහා නගර සභා ඉතිහාසයේ තවත් නොමැකෙන සටහනක් තබමින් පුරපතිවරයෙකු ලෙස අඛණ්ඩව 15 වන වරටත් අයවැය ලේඛණයක් සම්පාදනය කර ඔබ වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම මා ලද මහත් භාග්‍යයක් කොට සලකමි.

2006 වර්ෂයේදී පාලන බලය භාරගැනීමෙන් අනතුරුව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත පාලනයක් ක්‍රියාත්මකව නොපැවති වසර දෙකකට ආසන්න කාල සීමාව හැර අඛණ්ඩව මෙම ගෞරවනීය ධූරයේ රාජකාරි ඉටු කිරීමට මා හට අවස්ථාව සලසා දුන් මොරටු පුරවැසි ජනතාවට ස්තූතිය පිරිනමමින් 2023 වර්ෂය සඳහා වන අයවැය ලේඛණය ඔබ හමුවේ ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිමි.

දේශීයව හා ජාත්‍යාන්තර වශයෙන් අභියෝග ගණනාවකට අප රට මුහුණ දෙමින් පවතින පසුබිම යටතේ 2022 වර්ෂය තුල නගරයේ ජනතාවගේ සමාජ ආර්ථික සුබසාධනය උදෙසා ගත්

ක්‍රියාමාර්ග මෙන්ම එළඹෙන 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ සංවර්ධන ව්‍යාපෘති මෙන්ම අපගේ අනාගත දැක්ම පිළිබඳ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඔබ දැනුවත් කිරීමට අපේක්ෂා කරමි.

ජාතියක් වශයෙන් මේ මොහොතේ අප මුහුණ දෙමින් සිටින දුෂ්කර ආර්ථික පසුබිම යටතේ වුවද පළාත් පාලන ආයතනයක් ලෙස අප විසින් ඉටු කල යුතු සියලු සංවර්ධන හා සුබසාධන කාර්යයන් ගෙවී ගිය 2022 වර්ෂය තුලද කිසිදු පසුබෑමකින් හෝ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට මොරටුව මහා නගර සභාවට හැකි වූ බව සතුටින් සඳහන් කරමි.

විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුල රට මුහුණ දුන් ඉන්ධන අර්බුධය හේතුවෙන් මෙරට බොහෝ පලාත් පාලන ආයතන කසල බැහැර කිරීම හා අනෙකුත් මහජන සේවා සැපයීම සඳහා අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමට නොහැකිව අර්බුධයකට මුහුණ පා සිටියදී ඉන්ධන හලක් පවත්වාගෙන යන මෙරට පලාත් පාලන ආයතන 06 න් එකක් ලෙස මොරටුව මහා නගර සභාවට ඉන්ධන හිඟයකින් තොරව සියලු පුරවැසි සේවා සැපයීමට හැකිවීම මීට වසර ගණනාවකට පෙර ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන්අප ගත් දූරදර්ශී පියවරක ප්‍රතිඵලයක් බව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ ප්‍රමුඛතම කාර්යයක් වන නගරයේ භෞතික සම්පත් සංවර්ධනය, මාර්ග, කාණු ඇතුලු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පෙර වර්ෂ වල මෙන්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේද හැකි වූ අතර සමස්තයක් ලෙස මෙම වර්ෂය තුල රුපියල් මිලියන 80 ක පමණ මුදලක් ආයෝජනය කරමින් බල ප්‍රදේශය තුල මාර්ග , කාණු , පාලම් , බෝක්කු ඇතුලු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 60 ක් පමණ ඉටු කිරීමට කටයුතු කල බව සතුටින් සඳහන් කරමි.

පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ අනෙක් මුඛ්‍ය වගකීම වන බල ප්‍රදේශයේ කසල කළමනාකරණය හා මහජන සෞඛ්‍ය නංවාලීම යන ක්ෂේත්‍රයන් හි ද සුවිශාල ප්‍රගතියක් අත්කරගැනීමට 2022 වර්ෂය තුල මොරටුව මහා නගර සභාවට හැකි විය.

මුළු රටටම ආදර්ශයක් වෙමින් නගර මධ්‍යයේ පිහිටුවා ඇති ඝණ අපද්‍රව්‍ය විශේෂ කළමනාකරණ ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථකව පවත්වාගෙන යාමටත් බල ප්‍රදේශය තුල එක්රැස් වන පොලිතීන්, ප්ලාස්ටික්, වීදුරු, ආදි ප්‍රතිචක්‍රිකරණය කළහැකි අපද්‍රව්‍ය වර්ගීකරණය කර පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීමටත් ඒ තුලින් වැය බරක්ව පැවති, නොදිරන අපද්‍රව්‍ය මුදල් උත්පාදන මාර්ගයක් බවට පත් කරගැනීමටත් හැකිව ඇති අතර 2022 වර්ෂයේ පළමු මාස 10 තුල පමණක් ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල අලෙවි කිරීමෙන් රුපියල් මිලියන 5.5 ක පමණ ආදායමක් සභාවට උපයා ගැනීමට හැකිව ඇති බවත් සතුටින් සඳහන් කරමි.

තවද මෙම කසල කළමනාකරණ ව්‍යාපෘති ආරම්භ කිරීමත් සමඟ මාසිකව කරදියාන අපද්‍රව්‍ය අංගනය වෙත මොරටුව මහා නගර සභාව මඟින් බැහැර කරන ලද කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 400 කින් පමණ අඩු කරගැනීමට හැකිව ඇති බවත් එතුලින් මාසිකව රුපියල් 800,000/- ක පමණ මූල්‍යමය ඉතිරියක් අත්කරගැනීමට මෙන්ම විද්‍යාත්මක කසල කළමනාකරණ තුලින් මූල්‍යමය වශයෙන් තක්සේරු කල නොහැකි ආකාරයේ දැවැන්ත පාරිසරික වටිනාකමක් ආර්ථිකයට එකතු කිරීමටද හැකිව ඇති බව ද සඳහන් කරමි.

අප විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මේ වන විට දිවයිනේ ප්‍රමුඛතම ආදර්ශ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් බවට පත්ව ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර මාෂල් ඔෆ් ද එයාර් ෆෝස් ගරු රොෂාන් ගුණතිලක මැතිතුමාගේ මැදිහත් වීම මත එම ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා බේල් යන්ත්‍ර 03 ක් සපයා ගැනීමට 2022 වර්ෂය තුල හැකි වූ බව සඳහන් කරමි.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය තුල කළමනාකරණය කිරීම අපහසුව පැවති ගොඩනැගිලි ද්‍රව්‍ය සුන්බුන්, වීදුරු, පිඟන් මැටි ආශ්‍රිත සුන්බුන් ආදිය කළමනාකරණය කිරීම සඳහා විශේෂිත ඇඹරුම්

යන්ත්‍ර 02 ක් මේ වන විට සපයා ගෙන ඇති අතර මෙම වර්ෂය අවසාන වීමට පෙර එම යන්ත්‍ර ක්‍රියාත්මකකර ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කරමින් පවතින බවද සඳහන් කරමි.

එමෙන්ම පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය තවදුරටත් පුළුල් කරමින් එම ද්‍රව්‍ය භාවිතා කොට ප්ලාස්ටික් උපකරණ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටද සැලසුම් කර ඇති අතර ඒ යටතේ ප්ලාස්ටික් කසල බඳුන් (Garbage Bin) නිෂ්පාදනය කර බල ප්‍රදේශයේ නිවාස වෙත බෙදාදීමට නියමිත බව ද සඳහන් කරමි.

තවද මොරටුව නගරය අපද්‍රව්‍ය වලින් තොර ආදර්ශමත් නිකසල පුරවරයක් බවට පත්කිරීමේ ක්‍රියාවලියේ තවත් ඉතා වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරමින් මොරටුව මහා නගර සභාව, සෙවණත නාගරික සම්පත් මධ්‍යස්ථානය හා ඇමරිකා එක්සත් ජනපදයේ USAID ආයතනයේ පිරිසිදු නගර නිල් මුහුද (Clean cities Blue Ocean) වැඩසටහන යටතේ ඒකාබද්ධ නොදිරන කසල කළමනාකරණය විශේෂ ව්‍යාපෘතියක් පසුගිය මාසයේ ආරම්භ කල අතර ඉදිරි වර්ෂ 02 ක් තුල ක්‍රියාත්මක වීමට නියමිත එම ව්‍යාපෘතියද සමස්ත රටටම ආදර්ශමත් ව්‍යාපෘතියක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

එමෙන්ම මේ වන විට රට මුහුණ පා ඇති ආහාර අර්බුධයට පිළියමක් ලෙස රජය මඟින් ක්‍රියාත්මක හරිත දැයක් ජාතික වගා සංග්‍රාම වැඩසටහනට සමගාමීව මොරටුව මහා නගර සභාව මඟින් 'මෙහෙවර' නමින් ගෙවතු වගා සංවර්ධන හා දැනුවත් කිරීමේ වැඩසටහනක් මේ වන විට ආරම්භ කර ඇති අතර ඒ යටතේ එළවළු පැළ, වගාමළු හා කාබනික පොහොර නොමිලේ බෙදාදීම මෙන්ම ගෙවතු වගාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් මේ වනවිට බල ප්‍රදේශය තුල සාර්ථකව පවත්වාගෙන යන බව ද සඳහන් කරමි.

ඉහත කී පරිදි නගරයේ පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වලට සමගාමීව නගරයේ ජනතාවගේ අනෙකුත් මහජන උපයෝගිතා සේවාවන් තවදුරටත් සංවර්ධනය කිරීමට ද 2022 වර්ෂය තුල පියවර රාශියක් ගත් අතර එහිලා වැදගත් ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

අප පාලනය භාරගන්නා අවස්ථාව වන විට නගරයේ පුරවැසියන්ගේ පොදු විනෝද කටයුතු හා ශරීර සුවතා ව්‍යායාම ආදිය සඳහා පහසුකම් සැලසීමට කිසිදු විධිමත් ක්‍රමවේදයක් නොවූ නමුත් මේ වන විට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාන ගණනාවකදි ස්ථාපිත කිරීමට හැකිව ඇත.

ඒ යටතේ ව්‍යායාම සඳහා ඇවිදින මංතීරුවක් සහිත නගරයේ දෙවන ශරීර සුවතා උද්‍යානය ලුනාව කලපුව ආශ්‍රිතව නාගරික සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය සහිතව 2022 වර්ෂය තුල ස්ථාපිත කිරීමට හැකි විය.

එමෙන්ම කටුබැද්ද පැරණි පොදු වෙළඳ සංකීර්ණය පිහිටි භූමියේ අභිනවයෙන් ඉදිකල නව සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් කර එම ව්‍යාපෘතිය මේ වන විටත් මොරටුව මහා නගර සභාව වෙත භාර දී ඇති අතර එම වෙළඳ සංකීර්ණය මෙම වර්ෂය අවසන් වීමට පෙර ජනතා අයිතියට පැවරීමට සැලසුම් කර ඇති බවද සතුටින් සඳහන් කරමි.

එමෙන්ම නගරයේ දූවා දරුවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම පුළුල් කිරීම සඳහා කටුබැද්ද ජනසෙත පුස්තකාල සංකීර්ණය ආශ්‍රිතව නව පරිගණක අධ්‍යාපන මධ්‍යස්ථානයක් මෙම වර්ෂයේදි ආරම්භ කිරීමට හැකිවීමට අප ලද තවත් සුවිශේෂ ජයග්‍රහණයක් බව සතුටින් සඳහන් කරමි.

තවද සභාව මඟින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් පද්ධතිය තවදුරටත් පුළුල් කරමින් පසුගිය මාසයේදී කටුකුරුන්ද සාගරිකා පෙර පාසල සියළු පහසුකම් සහිත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදි.

මා මුලින් සඳහන් කල පරිදි පවත්නා ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද බදු ගෙවන ජනතාවගේ සුබවිහරණය සඳහා 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කල විශේෂ ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව ඉහත

සඳහන් කල අතර වර්ෂය තුල ක්‍රියාත්මක කල සියලු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පුළුල්ව සඳහන් කිරීමට මෙය අවස්ථාව නොවන බැවින් එළඹෙන 2023 වර්ෂය තුල සභාව මඟින් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් සඳහා මෙම අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන සලසා ඇති ආකාරය පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව 2023 වර්ෂයේ අයවැය ලේඛණය ප්‍රකාරව මොරටුව මහා නගර සභාවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ක්ෂේත්‍ර වලට අදාල ආදායම් හා වියදම් ඇස්තමේන්තු පහතින් සඳහන් කරමි.

**01. 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු ආදායම**

| | | |
|---|---|---|
| පුනරාවර්තන ආදායම | - | 1,122,604,600.00 |
| ප්‍රාග්ධන ආදායම | - | 150,321,600.00 |
| මුළු ආදායම | - | 1,272,926,200.00 |

**02. 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු වියදම**

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම | - | 1,077,853,100.00 |
| ප්‍රාග්ධන වියදම | - | 195,048,100.00 |
| මුළු වියදම | - | 1,272,901,200.00 |

මා ඉහත සඳහන් කල පරිදි නගරයේ සංවර්ධන කාර්යයන් තවදුරටත් පුළුල්ව හා විධිමත්ව ඉටු කිරීම සඳහා එළඹෙන 2023 වර්ෂය තුලදි ද ඔබ සියලු දෙනාගේ ගෞරවනිය සහයෝගය අපේක්ෂා කරමි. එමෙන්ම රට තුල මේ වන විට පැනනැගී ඇති ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද නාගරික ජනතාවගේ පොදු අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කිරීමට 2023 වර්ෂය තුලදි උපරිම ශක්තියෙන් කටයුතු කරන බවද සඳහන් කරමි.

එමෙන්ම ඉදිරි 2023 වර්ෂය තුල සභාවේ ගොඩනැඟිලි හා පොදු ස්ථාන ප්‍රශස්ත මට්ටමින් නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත් ඒ යටතේ විශේෂයෙන්ම පොදු වෙළඳසැල් ගොඩනැඟිලි බදු දීමේ දී අය කරනු ලබන ප්‍රවේශ මුදල් විශේෂිත ස්ථාවර තැන්පත් ගිණුම් වල තැන්පත් කිරීමට හා එම තැන්පත් වලින් ලැබෙන පොලී ආදායම් වලින් අදාළ ගොඩනැගිලි වල නඩත්තු කටයුතු සිදු කිරීමටත් සැලසුම් කර ඇති බව සඳහන් කරමි.

තවද මේ වන විට සාර්ථකව පවත්වාගෙන යනු ලබන සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන ගිනි භටයින් සඳහා ආරක්ෂිත ගිනි නිවාරණ ඇඳුම් සපයා ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබීම හා සෑම වසර 04 කට වරක්ම එම ආරක්ෂිත ඇඳුම් නැවත සැපයීමට සිදුවීම යන කරුණු සලකා බලා, වර්ෂ 04 කට වරක් පමණක් අයකරනු ලබන විශේෂ ගිනි නිවාරණ මුදලක් අය කිරීමටත් එම මුදල් ඉහත කී පරිදි සේවක ආරක්ෂාව හා සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට යොදා ගැනීමටත් යෙදවීමට කටයුතු කරන බව සඳහන් කරමි.

එසේම අපගේ දීර්ඝ කාලීන ඉලක්කයක්ව පවතින සභා බල ප්‍රදේශය තුල ජනනය වන කාබනික අපද්‍රව්‍ය ආශ්‍රිතව මහා පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ද ඉදිරි වසර තුල අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂා කරන බව සඳහන් කරමි.

ආරම්භයේ සඳහන් කල පරිදි දශක එකහාමාරකට ආසන්න කාලයක් මොරටුව මහා නගර සභාවේ පාලන බලය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මා හට සහාය ලබා දුන් සියලු පාර්ශව වෙත මාගේ ස්තූතිය පිරිනැමීමටද මේ අවස්ථාව උපයෝගී කොට ගනිමි.

ඒ අනුව අපට නිරන්තර උපදෙස් හා අනුශාසනා ලබාදෙන අතිපූජනීය මහා සංඝ රත්නය, ගරු පූජක ප්‍රසාදීන් වහන්සේලා ඇතුලු සියලු ආගමික නායකයින්ට මාගේ ගෞරවනීය ස්තූතිය ප්‍රකාශ කරමි.

තවද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා, හිටපු ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුලු වත්මන් රජයේ සියලු මැති ඇමතිවරුන්ට ද, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටද මාගේ ගෞරවනීය ස්තූතියි පුද කරමි.

එමෙන්ම බස්නාහිර පළාතේ ආණ්ඩුකාර මාෂල් ඔෆ් ද එයාර් ෆෝස් ගරු රොෂාන් ගුණතිලක මැතිතුමා ඇතුලු බස්නාහිර පළාත් සභාවේ සියලු නිලධාරීන් වෙතද මාගේ ස්තූතියි පිරිනමමි.

එමෙන්ම සභාවේ රාජකාරි කටයුතු සාර්ථකව ඉටු කිරීමට මා හට සහාය වන ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුලු ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමටද, විපක්ෂ නායක රවිනාත් ගුණසේකර මැතිතුමා ඇතුලු සියලු විපක්ෂ මන්ත්‍රීවරුන්ටද මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.

එසේම මොරටුව මහා නගර සභාවේ සංවර්ධන හා පරිපාලන කාර්යයන් සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා සහය ලබාදෙන සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ටද මාගේ ස්තූතිය පිරිනමමි.

ගත වූ වසර 15 ක පමණ කාලයක් නගරයේ සංවර්ධන කාර්යයන්හි අප සමඟ සිටිමින් අපට ශක්තිය ලබාදෙන ආදරණීය මොරටුව පුරවැසියන්ට ද මාගේ ස්තූතිය පිරිනමමි.

අවසන් වශයෙන් එළඹෙන නත්තල හා ලබන්නාවූ 2023 වර්ෂය සාමය සතුට පිරි සුබ නත්තලක් හා සුබ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති
මොරටුව මහා නගර සභාව
2022.11.25 දින

මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, විශේෂයෙන්ම වසර පහළොවක් එකදිගටම අයවැය ලේඛණයේ ඉදිරිපත් කරනවා හා සමානවම පුරා වසර පහළොවක්ම එකදිගටම අයවැය ඉදිරිපත් කරන පළමුවෙනි සාමාජිකයා විදියට වසර 15ක් නොකඩවා ඉදිරිපත් කිරිම වෙනුවෙන් ඔසඳ හර්ෂණ අබේකෝන් ගරු මන්ත්‍රිතුමාත් ඉතිහාසයට එකතුවෙයි. ඒනිසා මම ගරු මන්ත්‍රිතුමාට මේ කෙටුම්පත සම්බන්ධයෙන් ඔබගේ අදහස් ප්‍රකාශ කිරිමට ආරාධනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 2023 අයවැය කෙටුම්පත ඔබතුමා ප්‍රකාශයට පත්කළාම අපිට වැඩ ගොඩාක් කරලා තව පොඩි වැඩ ප්‍රමාණයක් විතරයි මම හිතන්නේ කරන්න තියෙන්නේ. ඒවගේම 15 වෙනි අයවැය අඛන්ඩව මම හිතන්නේ නගරාධිපතිවරයෙක් හැටියට ඉදිරිපත් කරන ලද වසර 15ක් අඛන්ඩව කළානම් ඒ ඔබතුමා පමණයි. ඔබතුමාට ඒ ගෞරවය දෙද්දි මටත් ඒ හා සමානව ගෞරවයක් ලැබෙනවා. මොකද ඔබතුමාගේ 15වෙනි අයවැයෙත් මංගල කථාව කිරිමට මාහට ඒ ශක්තිය ලබාදිම සම්බන්ධවයි. ගරු නගරාධිපතිතුමනි, අවුරුදු 15ක් කියන්නේ බොහෝ

කාලයක්. මම හිතන්නේ ඔබතුමා අවුරුදු හතලිස් ගණන්වල මම අවුරුදු විසිගණන්වල තමයි මේ මහා සභාව පළමුව නියෝජනය කරන්නේ. ඉතින් ඒ කාලයේදි දැන් ඔබතුමාට පනස්ගාණක් මට හතලිස් ගාණක්. අපි වයසට ගිහිල්ලා දරු මුණුපුරන් දැකලා ඉන්න ඔබතුමා මොරටුව නගරය හදන්න ඒවගේම නගර සභාවේ මේ වත්මන් පාලනයත් එක්ක අපිට තිබුණ ගොඩක් දේවල් අපි ඉටුකරලාඉවරයි. අපි ගොඩාක් දේවල් හදලා ඉවරයි. මාර්ග සංවර්ධනය කළා, කාණු සංවර්ධනය කළා, බෝක්කු සංවර්ධනය කළා. ඒවගේම 2002 වර්ෂයේ තිබ්බ ඒ කුණු ප්‍රශ්නය රවිනාත් ගුණසේකර හිටපු නගරාධිපතිතුමාගේ කාලේ තිබුණ කුණු ගොඩවල් අපි නැතිකරලා තමයි අපි අපේ පාලන බලය ගත්තේ. ඉතින් ඒ ගත්ත දවසේ සිට අද දක්වාම අපි කුණු ගොඩක් දැක්කේ නැහැ. එහෙම තියන්න ඔබතුමා දෙන්නෙත් නැහැ. ඒකට ඔබතුමාට නාගරික මන්ත්‍රීවරු ලොකු ශක්තියක් ලබාදෙනවා. මම ඒක දන්නවා. අපි හැමතිස්සේම ඇණකොටාගන්නේ මේ කුණුගොඩක් දැක්කොත්, කුණු බෑග් එකක් දැක්කොත් නගරාධිපතිතුමනි, අපිට ඒක බලාගෙන ඉන්න බැහැ. ඒනිසා කොහොමහරි අපිට ඕනෑ ඒ කුණු ටික අයින් කරගන්න. ඉතින් නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අයවැය කෙටුම්පතට මම මගේ පක්ෂපාතිත්වය පුදකරනවා. නගරාධිපතිතුමනි, මොරටුව නගරය මොරටුව හදවත බදුවූ ඒ මගේ ඡන්ද කොට්ඨාශය බැලුවාම අපිට තව සංවර්ධන කටයුතු කරන්න ඕනෑ.අපි හිතුවා අපේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණ මෙරින්ඩ්‍රයිව් එක ඇවිල්ලා මොරටුව ටවුන් එකේ අවශ්‍ය නැතිටික කඩලා ටවුන්එක ලස්සන කරයි කියලා තාමත් අපි ඒ මත තමයි ඉන්නේ. අපි 2018 කිවුවා ඉන්න අපි වැඩේ කරන්නම් කියලා. තාමත් අපි ඒ මට්ටමේම ඉන්නවා. ඒනිසා ඒගැන ඔබතුමාගේ අවධානය යොමුකරලා දැන්විය යුතු තැන්වලට දන්වලා අපි මොරටුව ටවුන් එක සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටිනවා. හැමදාම කියනවා වගේ අවුරුදු 40ක් 50ක් පරණ ටවුන් එකම තමයි තාමත් තියෙන්නේ. බස් රියදුරන්ගෙන් සහ කොන්දොස්තරවරුන්ගෙන් ඒ ප්‍රදේශය අපවිත්‍රවෙලා තියෙන්නේ. ඒනිසා ඒගැන සොයාබලා කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභා පරිශ්‍රය ගත්තාම අපි දිගින් දිගටම උත්සාහ කළා හැම බජට් එකකම කථා කළා මේ සෝලා සිස්ටම් එකකට යන්න ඕනෑ කියලා. මම දැක්කේ නැහැ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තියෙනවා කියලා සෝලා සිස්ටම් එක ගැන. මම හිතන්නේ එයත් ඇතුළත් කරන්න ඕනෑ අනිවාර්යයෙන්ම. මේ නගර සභා පරිශ්‍රය තුළ අපි සෝලා පැනල් වලට ගිහිල්ලා විදුලිය ලබාගන්න. ඒනිසා ඒක අනිවාර්යයෙන්ම අවශයයි. ඒක අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ කියලා මම හිතනවා. ඒකෙන් ගොඩාක් අපිට ඉතිරි කරගන්න පුළුවන්. ඒ මුදලිනුත් අපිට ජනතාවගේ සුභසිද්ධිය සඳහා යොදාගන්න පුළුවන්. ඒවගේම තමයි නගරාධිපතිතුමනි, කටුබැද්ද පැරණි පොදු වෙළඳ සංකීර්ණය මේ වෙනකොට හදලා නවීකරණය කරලා එළඹෙන සුභ මොහොතින් අපි විවෘත කරන්න උස්සාහ කරනවා. එය බොහොම හොඳයි. අපි ඒක ඒවගේම පවත්වාගෙන යන්න කටයුතු කරමු. හොඳ පරිපාලනයක් එතනට දාලා නැත්නම් අපේ පැරණි දිනපොළට කොච්චර සල්ලි වියදම් කරලා හැදුවත් වැඩක් නැහැ. නගරාධිපතිතුමනි, කවුරුහරි කට්ටියක් ඇවිල්ලා බදු අරගෙන ඒක අපිරිසිදු කරලා අපවිත්‍ර කරලා දානවා. ඒනිසා නව සංකීර්ණය ඒ ආකාරයෙන්ම හොඳට පවත්වාගෙන යාමට කටයුතු කරමු කියලා මම ඉල්ලා සිටිනවා. ඒවගේම තමයි මධ්‍යම සුපිරි වෙළඳ සංකීර්ණය මම හිතන්නේ පසුගිය සති දෙක තුන ඇතුලත මැලේෂියාවේ කණ්ඩායමක් ඇවිල්ලා නරඹලා ගියා. ඒ වගේම මම හිතනවා ඔබතුමා ඒ උත්සාහය තව තවත් බර කරලා ගත්තොත් අපිට පුළුවන් වෙයි. ඒක කඩා ඉවත් කරලා මහල් 15කින් හරි 13කින් යුක්ත හොඳ සුපිරි වෙළඳ සංකීර්ණයක් සකස් කරගන්න ඔබතුමාට ඒ සම්බන්ධව ශක්තිය ධෛර්ය ලැබෙයි කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, මේ දවස් ටිකේ මුහුණු පොතේ යනවා, ජනමාධ්‍යය වල යනවා ඔබතුමාගේ අවධානයට මේ කියන්නේ ස්ට්‍රීට් ෆුඩ් කියලා සමහර පාරවල් වෙන්කරලා රාත්‍රියේදි හැමතැනින්ම තියෙනවා. මමත් මේ ගිය ඉරිදා ගියා. අලුත්කඩේ උසාවිය පිටිපස්සේ තියෙනවා අවුරුදු 30ක් පැරණි තැනක්. නමුත් මේ අරගලය නිසා තමයි මෙයප්‍රමෝට් වුණේ. ඒවගේම බත්තරමුල්ලේ තියෙනවා. එහි නගරාධිපතිතුමනි, රට දෙපැත්තේ කට්ටිය කෑම විකුණනවා. වටින්ම වාහන අරගෙන මම දැක්කා නගරසභාවේ කණ්ඩායම් වෑන් අරගෙන ගිහිල්ල ඒ කෑම කනවා. ඒ ආශ්වාදය ලබනවා. මොකද පිටරට ගිහින් නැති කට්ටිය මෙතනදි ඒ ආශ්වාදය ලබනවා. ඒනිසා

ඒවගේ දෙයක් ඇවිදින මංතීරුවේ කළානම්, නැත්නම් අපට එහා පැත්තේ තියෙනවා මුහුදු තිරයක් ඒවගේ තැනක අපි අලුත් දෙයක් බවට පත්කළානම් ඒ කඩකාරයන්ට ඒගොල්ලන්ගේ බිස්නස් එකත් කරලා, අපේ නගරයට මොකක්හරි වටිනාකමක් ලබාදෙන්න පුළුවන්වෙයි කියලා මම හිතනවා. ඔබතුමාව මම එක්කරගෙන යනවා දවසක රාත්‍රියේ, ගිහිල්ලා බලමු නගරාධිපතිතුමනි, ඒක හරි ලස්සනයි. ඒ මුස්ලිම් ප්‍රජාව විසින් ඒක කරන්නේ. ඒනිසා ලංකාවේ නොයෙක් දෙසින් ඇවිල්ලා කෑම කාලා විනෝදවෙලා යනවා. දරුවෝ අරගෙන ඇවිල්ලා හරි අපූරු තැනක්. ඒනිසා ඔබතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසල් සඳහා ගුරුවරු ගත්තාම දැන් අපේ ගුරුවරු වැඩියි. සමහර වේලාවට ළමයි අඩුයි. මොකද අපේ පෙරපාසල් වලට ළමයි එන්නේ නැත්තේ. අපේ ගුරුවරුන්ගෙන් යල්පැනගිය අධ්‍යාපන ක්‍රමයක් තමයි ක්‍රියාත්මක කරන්නේ. මොන්ටිසෝරි බැලුවාම තරුණ ගැහැණු ළමයි ඉන්නේ. ඒගොල්ලෝ අලුත් තාක්ෂණයෙන් තමයි ළමයින්ට අකුරු කියලා දෙන්නේ.ඒ ඒ දේවල් කියලා දෙන්නේ. ඒනිසා මම කියන්නේ මෙය නවීන ක්‍රමයට වෙන්න ඕනෑ කියලා. යල්පැනගිය අධ්‍යාපන ක්‍රමයක් මම දන්නේ නැහැ අපේ කවුරුවත් හොයලා බලනවාද කියලා. අපිට තරුණ කොමසාරිස්වරු, තරුණ ගණකාධිකාරිවරු ඉන්න තැනක අපිත් තරුණ අලුත් අදහස්වලට යන්න ඕනෑ. ගිහිල්ලා ඒළමයින්ට ඒ අදහස් එක්ක දුන්නනම් ළමයින් වැඩි කරගන්න පුළුවන් වෙනවා. ඒනිසා කීයක්හරි වියදම් කරලා ළමයින් ටික දාන්න හදන්නේ ප්‍රයිවට් තැන්වලට. ඒනිසා නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරනවා එක්කො ඒ ගුරුවරුන්ට ගුරු පුහුණුවක් ලබා දීලා දැන් යන තාක්ෂණය මෙයයි. මේ විදියට උගන්වන්න කිවුවොත් මම හිතනවා අපේ පෙර පාසල් ටික මීට වඩා හොඳට හැදෙයි. ඒවගේම ළමයින් ටික සහභාගී වෙයි කියලා. ඒනිසා නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 15වෙනි අයවැයට සුභ පතනවා. මම ගිය වසරේනම් කිවුවා ඔබතුමාට 15වෙනි අයවැය ඉදිරිපත් කරන්න හම්බවෙන එකක් නැහැ කියලා. නමුත්, ඉතින් දෛවයේ සරදමට වගේ එය වුණා. ඒනිසා මම හිතනවා 16 වෙනි අයවැය ඉදිරිපත් නොකර ඔබතුමාට පාර්ලිමේන්තුවට යන්න හැකියාව ලැබෙයි කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,2023 අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ අවස්ථාවේදි මේ සම්බන්ධව විපක්ෂයේ පළමු කථිකයා විදියට අපිට කිසිලෙසකින්වත් සෑහීමකට පත්වෙන්නට නොහැකි අයවැය ලේඛනයක් මේ පිටු පුරවලා සංඛ්‍යා ලේඛන ඔබලා ඉදිරිපත් කරලා තියෙනවා. 2021 වර්ෂයේ මිලියන 3369ක් තිබුණ අයවැය 2022 වර්ෂයේදී මිලියන 3403ක් තිබුණ අයවැය 2023 අවුරුද්දේදී බැහැලා තියෙනවා 1272කට. අපි සංතෝෂ වෙනවාද ඔසඳ අබේකෝන් මන්ත්‍රීතුමා කිවුවා තව බෝහොම අඩු වැඩ කොටසක් තියෙන්නේ කියලා. මොරටුවේ කරන්න ඇත්තටම කණගාටුවෙනවා කොළඹ අගනගරයට ආසන්න ජනාකීර්ණ නගරය මොරටුව නගරය අද පත්වෙලා තියෙන තත්ත්වය පිළිබඳව සංතෝෂයට පත්වෙනවානම් මහජන නියෝජිතයෝ විදියට අපි අපිටම ලැජ්ජවෙන්න ඕනෑ. අපිට වඩා ගොඩක් ඉහළට ගිහිල්ලා තියෙනවා පානදුර පුරවරය. අපිට වඩා ඉහළට ගිහිල්ලා තියෙනවා පිළියන්දල පුරවරය, දෙහිවල ගල්කිස්ස අද මොරටුව තියෙන්නේ කොතැනද? මොරටුවේ අපිට හරි මාර්කට් එකක් තියෙනවාද? සැලසුම්සහගත ටොයිලට් එකක්වත් තියෙනවාද? මොරටුවේ මහජනතාවට ටවුන් එකට ඇවිල්ලා යන්න.වාහනයක් නවත්වන්න හදලා තිබු පාර්කින් එකඹපත් කරගන්න බැරිව තාමත් තියාගෙන ඉන්නවා අවුරුදු ගානක් තිස්සේ. අපි ලැජ්ජාවෙන්නට ඕනෑ. මෙයයි තත්ත්වය. ඒනිසා අපි මන්ත්‍රීවරු විදියට බොරුවට පුම්බන්න එපා. අපි එදා ලොකුවට කථා කළා 3369ක් තිබුණ අයවැය ලේඛනයට පක්ෂපාතීව ඒවගේම 2022 අයවැය ලේඛනයට පක්ෂපාතිව අපි ඡන්දය දුන්නේ නැහැ. තමුන්නාන්සේලා කථාකළා. හීන ලෝකයක් මැවුවා. අහසේ තරු පෙන්නුවා. ඔක්කෝම අත ඉස්සුවා. එහෙනම් මේවෙනකොට රෝහල ඉදිවෙලා තියෙන්නට ඕනෑ.අවුරුදු 15ක් තිස්සේ මේ රෝහල හැමදාම බජට් එකට වැටුනා. මේපාර නැතිවුණාට පුම්බලා තිබ්බ අයවැයක්. ඒවගේම මේ වෙනකොට අර මාර්කට් එක කඩලා නිවාස සංකීර්ණය සම්පූර්ණයෙන් ඉවර කරගන්න බැරිවුණා කියන්නකෝ. භාගයක් හරි ඉදිකරලා තියෙන්නට ඕනෑ. අර සුපිරි සාප්පු සංකීර්ණයත් එක්ක. මේවා තියෙනවාද? මේවා නැහැ. අද යථාර්තයට මුහුණ දෙන්න වෙලා තියෙනවා. බැලුම් පුම්බලා පුම්බලා උඩ යවලා අද යථාර්තයට මුහුණ දෙන්න වෙලා තියෙනවා. මිලියන 1272කින්

සෑහීමකට පත්වෙන්න වෙලා තියෙනවා. මෙහිදි පොඩ්ඩක් කල්පනා කරලා බැලුවාම මේ බදු මුදල් එකතු කරලා මොනවාද කරන්නේ සේවකයන්ගේ වැටුප් හා වේතන, අතිකාල දීමනා,ඉන්ධන දීමනා, ගමන් ගාස්තු, නිලධාරීන් පුහුණුකිරීමේ සේවක සුභසාධන වගේ පරිපාලන වියදම් වලට මෙයින් මිලියන 1000ක් විතර යනවා. සංවර්ධන කටයුතු වලට තියෙන්නේ සොච්චම් මුදලක් විතරයි. සෑම පිටුවක්ම පෙරලලා බලන්න මේවායේ තියෙන්නේ මොනවාද සේවක පරිපාලන වියදම්, නාගරික මන්ත්‍රී දීමනා, සංග්‍රහ දීමනා, විශ්‍රාම වැටුප් ගෙවීම්, වාහන නඩත්තුව, නිලධාරීන්ගේ වාහන ඉන්ධන, ණය සහ පොලී ගෙවීම, පරිපාලන වියදම් පමණයි. සෑම පිටුවක්ම පෙරලලා බලන්න. පසුගිය කාල සීමාවේ කළේ බොරුව පෙන්නුවේ සිහින ලෝක මවලා පෙන්නුවේ. අද මොරටුවේ තමුන්නාන්සේ ලොකුවට කියනවා අවුරුදු 15ක් තිස්සේ නගරාධිපතිවරයා විදියට හිටියාට ඔය පුටුවේ ඉඳලා රජකම් කළා වගේ. හැබැයි ලැජ්ජාවෙන්න ඕනෑ තමුන්නාන්සේ මේ මොරටුවට වැඩක් කළානම් කළේ එක්සත් ජාතික පක්ෂයේ නගර සභාවක් තුළින් බව මතක් කරන්න ඕනෑ. සුසන්ත සිරිරත්නලා හිටිය නගර සභාව මෙය. වැදගත් පුද්ගලයෝ හිටියේ නගර සභාව මෙය. ලලිත් නෝනිස්ලා හිටපු නගර සභාව මෙය. රවිනාත් ගුණසේකරලා හිටිය නගර සභාව මෙය. මේ අය හොරකම් කළේ නැහැ. අපිතමයි නගර සභාවට දෙයක් කළානම් කළේ. කටුබැද්ද මාකට් එක හැදුවේ මධ්‍යම ආණ්ඩුවෙන් නෙමෙයි. ඒක හදලා දුන්නේ ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමා. මේ මධ්‍යම වෙළඳපොල හදලා දුන්නේ අපි. සොයිසාපුර ප්‍රජාශාලාව හදලා දුන්නේ අපි. ජනසෙත හදලා දුන්නේ අපි. ටිරෝන් ප්‍රනාන්දු ස්ටේඩියම් එක හදලා දුන්නේ අපි. මේ දේවල් කරලා දුන්නේ අපි. තමුන්නාන්සේ ඇවිල්ලා පොඩ්ඩක් අපිට කියන්න බලන්න තමුන්නාන්සේ මේ අවුරුදු 15ක් කරපු සංවර්ධනය මොකක්ද කියලා. අපි එදා මොරටුව ආරක්ෂා වෙන්න අඟුලාන ඉඳලා ගල් බැම්ම දැම්මේ නැත්නම් අද මේ දකුණු තීරය නැහැ. ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාට පිං සිද්ධවෙන්න අපි පාසල් ආරම්භ කළේ නැත්නම් එක පාසලක් මේ ආණ්ඩුව තුළ අවුරුදු 20ක් රාජපක්ෂවරු බලයේ ඉඳලා, ප්‍රධාන ඇමතිවරු ඉඳලා, එක පාසලක් ආරම්භ කරන්න බැරිව ගියා. පොලිස් ස්ථාන ඇති කළේ අපි. උසාවි සංකීර්ණ ඇති කළේ අපි. ජාතික ආධුනිකත්ව වැනි ආයතන ඇති කළේ අපි. පීටර් කැලිමන් මහත්තයාගෙන් පස්සේ සොයිසාපුර නිවාස යෝජනා ක්‍රමය ඇති කළේ අපි. ඒ දේවල් කළේ අපි. ඒනිසා අපි කියනවා මේ සිහින මාලිගාවල් පෙන්නලා රවටලා තියෙන්නේ මොරටුව අපි ලැජ්ජාවෙන්න ඕනෑ. කවුරුහරි කියනවානම් මන්ත්‍රීවරයෙක් විදියට මේක සුරපුරයක් කරයි කියලා අපි බලමු. මීළඟ ඡන්දයේදීමෙය සුරපුරයක්ම වෙලා තියෙනවාද කියලා මිනිස්සුන්ට හරිදේ දැනගෙන හිටියේ නැහැ. හරිදේ අවබෝධ කරගෙන හිටියේ නැහැ. ඒනිසා තමයි ඒ මිනිස්සු ඡන්දය පාවිච්චි කළේ. මේ සුසන්ත සිරිරත්නලා, ලලිත් නෝනිස්ලා මේගොල්ලෝ හිටියා, රවිනාත් ගුණසේකරලා වැඩක් කරපු පුද්ගලයෝ, මොරටුවට වැඩක් කරපු පුද්ගලයෝ, වැඩක් කරපු නායකයෝ හිටියේ අපේ පක්ෂයේ. ජීවන් කුමාරතුංග ඇමතිතුමත් එක්ක අපිට ප්‍රශ්නයක් නැහැ. හොඳ පුද්ගලයෙක්. නමුත්, එතුමා මොරටුවට කරපු දෙයක් නැහැ. ජී. ඒල්. පීරිස්ලා මොරටුවට කරපු දෙයක් නැහැ. අද ඔබතුමා සංවිධායක, මහින්ද රාජපක්ෂ මහත්තයලාගේ බොහෝම ළඟ සමීප සම්බන්ධකම් තියෙන පුද්ගලයෙක්. ඒවගේම චන්ද්‍රිකා මැතිණියත් එක්ක බොහෝම සමීප සම්බන්ධකම් තිබ්බ පුද්ගලයෙක්. තමුන්නාන්සේ මොරටුවට මොනවද කළේ. විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ මේ ලුනාව කලපු ව්‍යාපෘතිය හැදුවේ අපි.ඒනිසා මෙය පටන්ගත්තේ අපි.මේ ව්‍යාපෘතිය නිසා ලොකු දියුණුවක් මොරටුවට ඇතිවුණා. එදා අපේ කාලේ යුනිසෙෆ් ආධාර මෙහාට ගෙනල්ලා අඩු ආදායම්ලාභීන්ට වැසිකිළි පහසුකම් ජලනල පහසුකම් මේ දේවල් ලබා දෙන්න කටයුතු කළේ අපි ඉදිරිපත්වෙලා. ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වගේ දේවල් ඇතිකළේ අපි. මෙය කළේමොරටුව ජනතාව ගැන හිතලා. ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාගෙන් පස්සේ අපි කියන්නට ඕනෑ ඉරාන් වික්‍රමරත්න මැතිතුමා එතුමා මොරටුවට ආදරය කරන පුද්ගලයෙක් විදියට, මොරටුවට ආදරය කරන මහජන නියෝජිතයන් විදියට, එතුමා ගම් පෙරලිය වැඩසටහන යටතේ මිලියන 300ක් අපිට ලබාදීලා තියෙනවා. මේ ප්‍රදේශයේ පාරවල් කරන්න. ඒවගේම කටුබැද්ද වෙළඳපොල අපි නෙමෙයි කරන්න ඕනෑ. නගර සභාවෙන් කරන්න ඕනෑ. හැබැයි ඒ දේවල් කරන්නත් අපේ මිලියන 220ක් ඒක ලබාදීලා කරලා තියෙනවා. අද තමුන්නාන්සේට බැරිවෙලා තියෙනවා මාස ගානක් ගිහිල්ලත් විවෘත කරගන්න නොහැකි තත්ත්වයක් තමුන්නාන්සේට තියෙනවා. ඒවගේම පුරන්අප්පු චතුරස්‍රය මිලියන 110 ක් දීලා හැදුවේ. මොරටුවේ ප්‍රශ්නයක් තියෙනවා අවුරුද්ද දවසකට ආවත්, නත්තල් දවසකට ආවත්, ජනාකීර්ණ වූ දවසකට ආවත්, මොරටුවේ වාහනයක්

නවත්ත ගන්න තැනක් අපිට නැහැ. ඒ වාහන නවත්ත ගන්න පාර්ක් එක හදලා දුන්නායින් පස්සේ ඒක විවෘත කරන්න අපිට හැකියාවක් නැහැ. ඒක මාස ගානක් තිස්සේ කල් මරාගෙන ඉන්නවා. ඒනිසා අපි මේවා ගැන සංතෝෂවෙන්න ඕනෑ නැහැ. අපි ස්වයං විවේචනයක් තුළින් හදාගමු. මහජන නියෝජිතයන් ලෙස අපි කුහක වෙන්නේ නැහැ. අපි කකුලෙන් අදිනවා නෙමෙයි.අපි කරලා දුන්න දේවලුත් ඇයි විවෘත කරන්නේ නැත්තේ.මේ දේවල්වලින් ජනතාවට ඒ සහන ලබා දෙන්න කියලා ඒ ඉල්ලීම කරනවා.ඒවගේම නගරාධිපතිතුමනි, කියන්නට ඕනෑ මේ ආදායම අද එක්දහස් දෙසිය ගානක් පෙන්නන ඒ ආදායම බදු ආදායම් මුළු ආදායම අපි මේ නගර සභාව තුල අපි අයකරගන්නවාද කියලා ප්‍රශ්නයක් තියෙනවා. මෙතුමාව තමුන්නාන්සේලා පුම්බන්නේ කසල කලමනාකරණය කළ ලංකාවේ හොදම පුද්ගලයා විදියට කුණුවල රජාකියලා පෙන්නුවේ මෙයා තමයි කසල සංවර්ධනය කරන්නේ කියලා. නගරාධිපතිතුමනි, අපි අහනවා මේ පොතේ 9වෙනි පිටුව පෙරලලා බලන්න. මේ 9වෙනි පිටුවේ තියෙනවා 2021 තමුන්නාන්සේ බලාපොරොත්තු වෙනවා ආදායම සත පහක් නැහැ. කොහොමද කලමනාකරණය කළේ 2022 මේ දක්වා සත පහක් නැහැ. 2020 නැහැ. කසල කලමනාකරණය කළා කියන්නේ මේ කසල අරගෙන ගිහිල්ලා මධ්‍යස්ථානයට දාන එක නෙමෙයි. මෙයින් ආදායමක් උත්පාදනය කරන්නට ඕනෑ. තමුන්නාන්සේලා කියනවා හොදම නගර සභාව කියලා. නැහැ ලංකාවේ තියෙනවා කසල කලමනාකරණය කරන ප්‍රාදේශිය සභා තියෙනවා. අපි දැක්කා සීතාවක නගර සභාව කොම්පෝසට් ව්‍යාපෘතිය ඉතාමත් හොදින් කරනවා.මෙයට තමුන්නාන්සේට කියන්න පුළුවන්ද මෙයට එකතුවෙලා නැහැ කියන එක. මෙයට එකතුවෙලා නැහැ කියලා කියන්න බැහැනේ. මේ වාර්තාව හදලා තියෙන නිලධාරින් මේ වාර්තාවේ සත පහක්වත් කසල ආදායමක් එන්නේ නැහැ.ලොකු ප්‍රශ්නයක් ඉතින්. එහෙමනම් තමුන්නාන්සේ මේ අවුරුද්දට බලාපොරොත්තු වෙනවා 650ක්. තමුන්නාන්සේ ඉදිරියෙත් බලාපොරොත්තුවෙනවා 650ක්. හැබැයි පහුගිය අවුරුදුවල බින්දුවයි.එහෙමනම් කසල කලමනාකරණයේදි දූර්වලම නගර සභාව මොරටුව නගර සභාවයි කියන්න ඕනෑ.දූර්වලම නගර සභාව ඒක කියන්නම ඕනෑ.නගරාධිපතිතුමනි, තමුන්නාන්සේ මේ නගර සභාවේ මුදල් තමුන්නාන්සේ ඔලුවෙන් නෙමෙයි ඇගෙන් තිරණ අරගෙන යම් යම් විදියට අයථා විදියට වියදම් කරන්න යෙදිලා තියෙනවා.අපි කිවුවා මේ නගර සභාවේ නීති නිලධාරියෙක් ඉන්නවා උපදෙස්ගන්න මේ හැම දෙයටම අපේ දැනුම හරියන්නේ නැහැ. අපිට බැහැ කර්මාන්තයක් කරනකොට ඉංජිනේරුගෙන් පිටයන්න අපිට බැහැ. නීතිමය කටයුත්තකදී නීතිඥවරයාගෙන් පිටයන්න තිරණය ඒගොල්ලන්ගෙන් අහන්න.අහලා මෙය කරන්න පුළුවන්ද බලන්න. ඒවාට යන්න තමුන්නාන්සේ ගිහිල්ලා පැටලුනු ඒවාට නගර සභාව වියදම් කරන්නේ. කවදාහරි මන්ත්‍රිවරුනි මතක තියාගන්න මෙයට ගෙවන්න වෙනවා.මේවාට අනුමැතියක් දෙන්නේ නැහැ.ප්‍රශ්න නොකරනතාක් මෙයට අතඋස්සන්නේ නැතිව ඉන්න පුළුවන්. යම්කිසි කෙනෙක් ප්‍රශ්න කළොත් මෙයට ගෙවන්න වෙනවා.අන්න ඒක මතක් කරන්න ඕනෑ.ඒ මතක්කරන ගමන් අපි කියනවා මෙහි අපිට අවශ්‍ය වෙන්නේ අවුරුදු 15ක් හිටියා කියන එකවත්,ජ්‍යෝෂ්ඨත්වය කියන එකවත්, උගත් බුද්ධිමත් කියන එකටත් වඩා මම දකින්නේ අපිට අවශ්‍ය වෙන්නේ අවංක පුද්ගලයෙක් හොරකම් නොකරන පුද්ගලයෙක්.ඔය පුටුවේ වාඩිවෙන්නට ඕනෑ. මම ඔය පුටුවේ වාඩිවෙලා හොරාකනවානම් මම දන්නේ නැහැ මගෙන් පල්ලේහා ඉන්න නිලධාරින් මගෙන් පල්ලේහා ඉන්න සේවකයන්ගේ සාක්කුවට මම ගන්නවා වගේ කී ගුණයක් යනවාද කියලා මම දන්නේ නැහැ.ඒක වෙනවා අද.ඒක වෙනවා අද නගර සභාවට ඇවිල්ලා වියදමක් නොකර වැඩක් කරගන්නට බැහැ.අද තියෙන තත්ත්වය තේරුම් ගන්න. ඒ අය කියනකොට අපි මේ වැඩේ කරගත්තේ සල්ලි දීලා කියලා කියනකොට අපි ලැජ්ජාවෙනවා.අවංක පුද්ගලයෙක් ඔතන ඉන්නවානම් ඒ තිරණය අරගෙන දඩුවමක් දෙකක් දෙනවානම් මෙය වැරදි කියලා ඉවරවෙලා මෙය හැදෙනවා.මම මේ නගර සභාවේ ලක්ෂ 10ක් හොරකම් කරනවානම් අමතක කරන්න එපා ලක්ෂ 50ක් පිට පාරේ යනවා.මේ ආදායම අඩුවෙන්න හේතුව මෙයයි. ඉතින් නගරාධිපතිතුමනි, මම මෙහිදි සඳහන් කරන්නට ඕනෑ අපි අවංක වෙන්නට ඕනෑ.කකුළුවා වැරදි මාර්ගයේ ගිහිල්ලා අනෙක් අයට හරි මාර්ගයේ යන්න කිවුවාට වැඩක් වෙන්නේ නැහැ.ඒ එක්කම නගරාධිපතිතුමනි,මෙය පෞද්ගලික ප්‍රශ්නයක් නෙමෙයි. තොරතුරු දැනගැනිමේ පනත යටතේ තමුන්නාන්සේගෙන් තොරතුරක් ඉල්ලා තිබුණු කිංස්ලි කියලා මහත්මයෙක් මෝල්පේ. එයදුන්නේ නැහැ නගර සභාවෙන්. හැබැයි තොරතුරු කොමිසමට ලිවුවාට පස්සේ මේ තොරතුර දුන්නා.මෙහි තියනවා තමුන්නාන්සේ නගරාධිපතිවරයාවිදියට ඉදලා ගිය අවුරුද්දේ නොවැම්බර්

වෙනකම් ඉදලා තමුන්නාන්සේගේ ආදායම, පඩි දීමනා මොනවද කියන එක තියෙනවා. මෙහි පැහැදිලිවම සඳහන් කරලා තියෙනවා.අවුරුද්දෙන් අවුරුද්ද මොනවද තියෙන්නේ කියලා.තමුන්නාන්සේට 2006 නගරාධිපතිධුරයේ ඉදලා 2021 නොවැම්බර් වෙනකම් තමුන්නාන්සේට ලැබිලා තියෙන ආදායම ලක්ෂ 67යි. හැටහත්ලක්ෂ පනස්හතර දාහයි.අපි ඒ නොවැම්බර් ඉදලා මේ දක්වා තවත් ගානක් එකතු කරලා තව ලක්ෂ දහයක් එකතු වුණා කියලා හැත්තෑහතයි.දහතුනක් එකතු වුණා කියමු 80යි. මෙය බෙදන්න අවුරුදු 20ට මාස 240ට බෙදන්න.ඒකයි තමුන්නාන්සේගේ ආදායම. ඉන් එහාට ආදායමක් නැහැ. එහෙම ආදායමක් තියෙනවානම් තමුන්නාන්සේ ටැක්ස් ගෙවන්න ඕනෑ.තමුන්නාන්සේට බිස්නස් රෙජිස්ට්‍රේෂන් එකක් තියෙන්නට ඕනෑ. ඒකට එකවුන්ට් එකක් තියෙන්නට ඕනෑ. එහෙම නැතිව තමුන්නාන්සේට ආදායමක් පෙන්නන්න බැහැ. මම අහගෙන මම එදා ප්‍රශ්නයක් මතුකරද්දි කිවුවා සුළු දෙයක් කියලා. මම පුදුම වුණා මෙච්චර ප්‍රශ්නයක් අපි දකිනවානම් මේ මිනිස්සු දකින්නේ සුළු දෙයක් කියලා.මෙහෙමනම් ප්‍රශ්නවලට සුළු දෙයක් කියලා මුහුණ දෙන්නේ කොච්චර දේවල් කරලා ඇද්ද. සුළුදේවල් නෙමෙයි හිතන්න.කවුරුහරි ගිහිල්ලා අල්ලස් දූෂණ එකට මම දාන්නේ නැහැ.මම ඒක කියනවා මම කථාකළාට මම ඒවාට යන්නේ නැහැ.මම මේ තේරුම් කරලා දෙනවා.හැදෙන්න පුළුවන්නම් හැදෙන්න.මම යන්නේ නැහැ උසාවි ගානේ.මම මෙතන දැනුවත් කරන්න විතරයි.මම කියන්නේ කවුරුහරි ඉදිරිපත් කළොත් පෙන්නන්න බැරි රු.1000ක් තිබ්බත් ඒකත් අල්ලසක්.ලක්ෂ ගණන් කෝටි ගණන් ඕනෑ නැහැ.මේ වරද නිවැරදි වෙන්නට ඕනෑ.ඒනිසා මේ කථාව අම්හිරිවෙන්නට පුළුවන්. මෙය යම්කිසි විදියට ද්වේෂසහගත කථාවක් විදියට සලකන්න එපා. මෙය ද්වේෂසහගත කථාවක් විදියට නෙමෙයි මම කිවුවේ. මෙය නගර සභාවේ අනෙක් මන්ත්‍රීවරුත් දැනගන්නට ඕනෑ.මේ අපි යන්නේ මේවගේ තත්ත්වයක ඉදලයි.ඒනිසා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා මේ අයවැය ලේඛනය සම්බන්ධව සම්පූර්ණ අපේ අප්‍රසාධය පලකරනවා.මේ ලේඛනය තුළ කවුරුහරි කියනවානම් මෙය පුම්බන්න හදනවානම් මන්ත්‍රීවරුනි මෙය අපි අපිටම කරගන්න විහිලුවක් කියන එක මතක් කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2023 අයවැය සම්බන්ධව කොරලවැල්ල නැගෙනහිර මැතිවරණ කොට්ඨාශයේ නියෝජනය කරමින් මා සහභාගිවෙන පස්වන අයවැයයි මේ. මොරටුව ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා වසර 15කට අධික කාලයක් ඔබතුමා විසින් ඉදිරිපත් කරන අයවැයට මා පක්ෂවන අතර 2023 වසරේ ඔබතුමාගේ මොරටුව ජනතාවගේ ආර්ථික දේශපාලන හා සාමාජික තත්ත්වයන් උසස් කිරිමට කටයුතු කර තිබෙනවා. පවතින ආර්ථික අභියෝගයන් තත්ත්වය හමුවේ ජනතාවගේ සුභ සිද්ධිය ඉටුකිරිමට කටයුතු කිරිම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ පක්ෂපාතීත්වය පිරිනමමින් ඉදිරියෙත් ඔබතුමාගේ වැඩකටයුතු වලට සහයෝගය දෙන බව ප්‍රකාශ කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. සුනිල් නන්දසිරි මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ මාගේ දහනවවෙනි අයවැය කථාව. 16-17 වර්ෂ වල සංක්‍රාන්ති කාල සීමාවක් තිබුණා. ඒනිසා නැත්නම් අපි 21 වෙන්න ඕනෑ.1991 වර්ෂයේදීනගර සභාවට ආව පුද්ගලයෙක් වශයෙන් හිටපු නගරාධිපතිවරු තුන්දෙනෙක්ගේ පෞද්ගලික සහකරු වශයෙන් ගරු ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ මඟපෙන්වීම යටතේ මම 1993 වර්ෂයේදි රාජ්‍ය සේවයට යොමුවෙලා 1997 වර්ෂයේදි ඡන්දය ඉල්ලුවාට පස්සේ මම දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මේ වනවිට මම රාජ්‍ය සේවයට යොමුවෙලා කටයුතු කරනවා. 1991 වර්ෂය තුළ මේ දක්වා ගත්තාම නගර සභාවේ වෙනස්වීම් කිහිපයක් වෙලා තියෙනවා. මොරටුව නගරය තුළ ලංකාවේ ඉතාම සුප්‍රසිද්ධ ඒවගේම ලංකාවේ පුරෝගාමීත්වයේ නගරය මම හිතන්නේ නැහැ සාමාන්‍යයෙන් යම්කිසි වෙනසක් වෙලා තියෙනවා කියන එක. ඒක පැහැදිලියි. අනෙක් නගරවලට ගියාම මහා විශාල වෙනස්කම් තියෙනවා. ප්‍රධාන දේ තමයි මහජනතාවට අවශ්‍ය දේවල්. ප්‍රධාන දේ තමයි අපේ රෝහල. අද අපේ රෝහල ගත්තාම හැම වකවානුවකම මිනිස්සු කථාකළා දොස්තරලා ආවා, රාජිත සේනාරත්න මැතිතුමා වගේ අයත් ආවා. ටිරෝන් ප්‍රනාන්දු මෙතුමාගෙන් පස්සේ එතුමා විශාල සේවාවක් කළා. එදා මෙදාතුර යම්කිසි දෙයක් කළානම් මොරටුවට ඒ කළේ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා විතරයි. වෙන කවුරුවත් කළේ නැහැ කියන ඒක මම නොබියව ප්‍රකාශ

කරනවා. මන්ද, එතුමාට පස්සේ ජී. ඒල්. පිරිස් ඇමතිතුමා ආවා. එතුමාත් දාලා ගියා. ඉන් පස්සේ නොයෙකුත් ආකාරයේ පුද්ගලයෝ ආවා. නමුත්, මොරටුවට යම්කිසි දෙයක් වුණේ නැහැ. පුරෝගාමීත්වයේ නගරයවුණාට අපි සංතෝෂ වෙන්න ඕනෑ අපේ ආතර් සි. ක්ලාක් මධ්‍යස්ථානය වැනි සුවිශාල දේවල් ඒවගේම විශ්ව විද්‍යාලයක්,පොලිස් ස්ථාන 5ක් ඒ සියල්ලම තියෙනවා. සිනමාශාලාවල් වැඩියි. ලිකර්ෂොප් වැඩියි. ඒ හැමදෙයක්ම තියෙන නගරයේ අපි හිතන්නේ මේ වනවිටත් හැම අයවැයෙන් අයවැයටම යනවා මෙය හදනවා මෙය හදනවා කියලා. නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා මොරටුවේ ප්‍රධාන පුරවැසියා වශයෙන් ඔබතුමා අපි අවමංගල උත්සව වලට ගොඩක් සහභාගිවෙන අය වශයෙන් උදවු කරන අයවශයෙන් අපි දන්නවා සමහර ගෙදරකමරණයක් වුනාම, ඊයෙත් එහෙම දෙයක් වුණා. හමුදා මාවතේ ඒ මරණය තියන්න තැනක් නැහැ. ගෙනියන්න ඕනෑ ලගම රෝහලට රු.10000ක් ගන්නවා රණසිංහ මල්ශාලාවෙන්. මොරටුව මහා නගර සභාවේ බජට් එකෙත් තියෙනවා මල් ශාලාවක් හදනවා කියන කථාව, ඒ දේ කළානම් අද ඒ මිනිස්සුන්ට සහනය වෙනවා. මේ කථාකරන මම තිලකසිරි මන්ත්‍රීතුමා අපි කවුරුත් මේවා කරන්න ගියාම අපෙන් සල්ලි දෙන්න වෙනවා. අපිත් සල්ලි තියෙන මිනිස්සු නෙමෙයි. ලුනාව රෝහලට ගෙනිච්චාම වෙන්නේ පානදුරේට ගෙනියන්න. එතකොට මල් ශාලාවට දෙන්න වෙනවා රු.10000ක් හෝ ඊට අඩු ගානක්. ඒනිසා මම හිතන්නේ ප්‍රධාන වශයෙන්ම මුල්ගල් තියලා දැන් මුල්ගල් පැලවෙනවා. ලුනාව රෝහල මීට කලිනුත් බඩු වගයක් ගෙනාවා ඔබතුමන්ලාගේ කාලේ ඔබතුමා නෙමෙයි කළේ ඔබතුමාලාගේ කාලේ අපේ මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ඉන්නකොට ඊට පහුවෙනිදාට පහුවෙනිදා බඩු අරගෙන ගියා.දැන් ඒවගේ තිබුණ රෝහලක් අද වෙනකම්ම ඇත්තවශයෙන්ම පුරෝගාමීත්වයේ නගරයේ ඇති රෝහලේ ඇත්තේ නැහැ ශල්‍යාගාරයක් වගේම මෝචරියක්. ඒනිසා කණගාටුවෙන් ඒක මම මතක් කළේ ඒකයි. ඊයේත් මරණයක් පිළිබඳව කරගහපු නිසා.ඒ දේවල් ඉතා හොඳින් සොයා බලන්න, සොයාබලලා අපි කවුරුත් එකතුවෙලා කරන්න ඕනෑ දෙයක් ඒවගේම තමයි මොරටුවට කුමන ආකාරයෙන් ගත්තත් සුපිරි වෙළදසැල් තුනක් තියෙනවා කියන ඒක කියනවා ඒවට යන්න නිසියාකාරයේ පාර්කින් එකක් නැහැ. ඒ පාර්කින් එකක් හැදුවා අපි අපේ කාලේ. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා නමුත්, ඒක අදවෙනකම් ඕපන් කරන්න බැරිවෙලා තියෙනවා. ඒවගේම වීර පුරන්අප්පු චතුරස්‍රය මම එදත් කිව්වා සමහර වේලාවට අනවශ්‍ය දේවල් අපේ පුවත් පත්වල වැටෙනවා. එක එක්කෙනා කියන කථාවල් කවදාවත්ම අපේ කථා ගිහිල්ලා තියෙන්නේ බොහෝම අඩුවෙන්. සමහර පුද්ගලිකව කථාකරන දේවල් එක්කෝ සොයිසාපුර කියයි නැත්නම් වෙන කොහේහරි කියයි. ඒ දේවල්වල තියෙනවා නමුත් මම දැකලා නැහැ විශේෂයෙන් අත්‍යාවශ්‍ය දෙයක් සඳහන් වෙලා තියෙනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුව වේල්ස් කුමර විද්‍යාලය මේ වනවිට කවුරුත් අහන දේවල් පුවත්පත් වලින් දකින දේවල් ගැහැණු ළමයි ඉන්නේ වේල්ස් කුමරි විද්‍යාලය ශිෂ්‍යාවෝ ඉන්නේ. ශිෂ්‍යාවනුත් මත්ද්‍රව්‍ය විදුහලට ගෙනාවා කියන එක පහුගිය කාලේ බොහෝම දැඩිව ගියා.අපි සංතෝෂවෙන්න නරකයි හේතුව තමයි 2002 වර්ෂයේදී සිංගප්පූරුවෙන් අපිට හම්බවුණා ටුවර් එකක් මොරටුව තමයි ලංකාවෙන්ම මත්ද්‍රව්‍ය පුනුරුත්ථාපනය කළේ. අපි දන්නවා ස්ටේඩියම් එකේ එකතුවෙලා කරලා ඒකෙන් අපිට මලක්කා සම්මුතියෙන් අපේ රවිනාත් ගුණසේකර මැතිතුමාගෙන් අපිට ඒ දේවල් ලැබුණා.ප්‍රතිලාභ ලබාගත්තා අපි කවුරුත් ගියා. ඒ දවස්වල තිබුණේ හෙරෝයින් විතරයි. දැන් තියෙනවා මත්ද්‍රව්‍ය රාශියක්.මම කණගාටුවෙනවා මගේ අයියා අනිල් මාසකෝරාළ එගොඩ උයන පොලිසියේ OIC නමුත් ඒගොල්ලොත් කියන්නේ සභාවෙන් ඉල්ලීමක් කළා හැමෝම මේ මත්ද්‍රව්‍ය  පුනුරුත්ථාපනය පිළිබඳව කුඩු ඇල්ලීම පිළිබඳව මෙය නවත්වන්න උදවු වෙමු කියන කථාව. නමුත්, කවදාවත්ම ඒ දේ සිදුවුණේ නැහැ.අපි කථාකරනවා අපි කියන දේවල් හැන්සාඩ් වෙනවා එච්චරයි.කවදාවත්ම මේවා එළියට යන්නේ නැහැ.අන්න ඒකයි තියෙන දුර්වලකම.ඔබතුමා හෝ කවුරුන් හෝ මේ සභාවේ දේවල් අනවශ්‍ය විදියට එළියට යනවා ෆේස්බුක් මාර්ගයෙන් හෝ යම්කිසි ආකාරයකට යනවා. අනවශ්‍ය දේවල් එක් එක්කෙනාට මඩ ගැහීම් නොයෙකුත් ආකාරයේ විවේචන. නමුත් මිනිස්සුන්ට වෙන්න ඕනෑ දේවල් එළියට යන්නේ නැහැ කියන එක මම නොබියව ප්‍රකාශ කරනවා.හේතුව මම එදත් කිව්වා මේ සභාවට ඉස්සෙල්ලා සභාවෙත් මම කිව්වා නගරාධිපතිතුමනි අපේ විර පුරන්අප්පු චතුරස්‍රය. ඒ චතුරස්‍රය වටා වැටක් දාලා ගේට්ටුවක් දාන්න කියන එක.අද රෑට කවුරුහරි ගිහිල්ලා බලන්න ඒකාලේ හිටියා මැක්සි මන්ත්‍රීතුමන්ලා අටදෙනාගේ කල්ලියක් කියන කල්ලිය. ඒ කියන්නේ මේ මන්ත්‍රීවරු

මොරටුවේ මොනවාද වෙන්නේ කියලා අපි රටත් ගිහිල්ලා බලනවා. සිකියුරිටි එක හරියට ඉන්නවාද කියලත් බලනවා. සිකියුරිටි එකෙන් වෙච්ච නින්දිත ක්‍රියාවක් පහුගිය කාලේ අපි ප්‍රකාශ කළා. මේ ඉස්සරහා සිකියුරිටි එකේ වෙච්ච නින්දිත ක්‍රියාවක් ගරු කොමසාරිස්තුමනි විවේචන එන්නේ ඔබතුමාලාට. අපි ආස නැහැ මොකද ඔබතුමාලා බොහෝම ක්ලීන් මිනිස්සු.ඒනිසා ඒවා හොයා බලන්න ඕනෑ.ඒ කියන්නේ කිසිම දෙයක් පුවත්පතකවත් එහෙම දෙයක් වැටෙන්නේ නැහැ. හේතුව ඒදේ දන්නේ නැහැ. එදා සිංගර් එක කඩලා ආව හොරා ආවෙත් ඔතනට බෑග් එකක් දාලා ගියා. බැරිවෙලාවත් අපේ කෙනෙක් එතන හිටියානම් ඒකෙනාව අහුවෙනවා. ඊට පස්සේ ඒ දේ වලට සභාව යන්න ඕනෑ උත්තර බඳින්න. මේ සඳහා ප්‍රධානියා වෙන්නේ කොමසාරිස්තුමා. ඒනිසා මම කියන්නේ මෙයයි අපි බොරු දේවල්වලට වියදම් කරනවා වගේම ආරක්ෂා කරගතයුතු දේවල් ආරක්ෂා කරගමු. දැන් රට ඇවිල්ලා බලන්න බංකුවල මොන මොන දේවල්ද වෙන්නේ කියලා. එතැන රජමැදුරක් වෙලා. සේනක මන්ත්‍රීතුමා කිවුවා වගේම 2015 දී ටිරෝන්ප්‍රනාන්දු මැතිතුමා දාලා ගියා, ජී. එල්. පීරිස් මැතිතුමා දාලා ගියා. 2015 අපි මොරටුව දින්නා. සේනක දමයන්තගේ නායකත්වයෙන්.ඊට පස්සේ ඒදේ එපා වෙච්චනිසා තමයි මොරටුවේ මනුස්සයෙක් දිනන්න ඕනෑ කියන මතයට අනුව මොරටුවේ සමන්ලාල් දිනවන්න තිරණය කළේ.අපිටත් කෙනෙහිලිකම් කළා මහා පරිමාන සල්ලි තියෙන පුද්ගලයෝ නෙමෙයි යකාගේ කටටත් අතදානවා වැරදි දේවල්වලට. හරිදේට බොරුවට කෑගහලා සභාවදාට විතරක් ඇවිල්ලා කරන්න එපා කියන ඉල්ලීම කරමින් විශේෂයෙන්ම මම ඉල්ලීමක් කරනවා ගරු කොමසාරිස්තුමනි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙසත් නාගරික ලේකම්තුමනි ඔබතුමාගේ අවධානය යොමුකරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.නගරාධිපතිතුමනි,එළබෙන්නාවූ නත්තලත් මොරටුවේ ජනතාවට යම්කිසි දෙයක් කරන්න මොකද එන සභාවෙන් පස්සේ නගර සභාව විසුරුවන්න බැරිනැහැ.ඒනිසා ඒ සියල්ලටම කලින් අපිනැවත එයිද නැද්ද කියලා මහජනතාව තිරණය කරයි. ඕනැකමින් ඉල්ලීමක් කරනවා අපි කවුරුත් ආවත් නාවත් හැමෝම සමාජයේ යමක් කරපු මිනිස්සු වශයෙන් මොරටුවේ මිනිස්සු බලාගමු කියන යෝජනාව කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී -එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මා හිතන්නේ මාගේ පස්වෙනි අයවැය කථාවේදි මාගේ කොට්ඨාශයේ හා සියලුම සිංහල,මුස්ලිම්,දෙමළ සියලුම ජනතාවත් ඒවගේම මොරටුව එගොඩඋයන දකුණු කොට්ඨාශයේ මා නියෝජනය කරන මේ වනවිට ඔබතුමන්ගේ අයවැයෙන් විශාල සේවාවක් මා නියෝජනය කරන දකුණු කොට්ඨාශයට විශාල සංවර්ධනයක් ගියවර අයවැයෙනුත් කරලාතිබෙනවා. ඒවගේම මේ අයවැයෙනුත් ඒ ඒ සංවර්ධනය කිරීමට ඔබතුමාගේ අයවැයෙන් මෙවරත් බලාපොරොත්තුවෙමින් ඔබතුමාගේ අයවැයට සුභදායි අයවැයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මා සහභාගිවෙන 5වෙනි අයවැය. මොරටුව මහා නගර සභාව කියන්නේ මොරටුව ආසනයේ වසම් 42ක් ඇතුලේ විශේෂයෙන්ම පවුල් 48827 ක් ජීවත්වෙන බල සීමාවක් තුළ තමයි මේ අපි මේ පළාත් පාලන ආයතනය පිහිටලා තියෙන්නේ. වසර 5ක පරිපාලන ක්ෂෙත්‍රයේ අපි දැකපු ඉතාම අවම ජනතා පහසුකම් සපයන මහා නගර සභාවක් විදියට තමයි මේ නගර සභාව දැක්කේ.විශේෂයෙන් උදාහරණයක් ගත්තොත් කොළඹ මහා නගර සභාව තුළ අපි නිතරම දකිනවා අපි උවමනාවෙන් බලනවා විශේෂයෙන්ම ගත්තොත් අපිට මන්ත්‍රීවරුන් ලෙස වරප්‍රසාද අවම නගර සභාව ලෙස මම ඉතාම අකමැත්තෙන් ප්‍රකාශකරන්න කැමතියි.මොකද හැමවේලාවෙම සභාවක් තුළක්‍රියාත්මක වෙන්නේ මන්ත්‍රීවරුන්ට සිය වරප්‍රසාද ලැබිය යුතුයි.ඔබතුමා පරිපාලන ක්ෂෙත්‍රය තුළ අපිව කුඩම්මාගේ සැලකිල්ලට ලක්වෙලා වසර 5ක්ම.ඉතාම අවාසනාවන්ත පිරිසක් විදියට අපි අපිව දකිනවා. විශේෂයෙන්ම අපිට අපේ අයිතිවාසිකම් දිනාගන්න ලැබුණේ නැහැ මේ වසර 5තුලම. ඔබතුමා දන්නවා ඇති කොළඹ මහා නගර සභාව වසරකට මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කරනවා වගේම වසර අවසානයේ රු.3500ක ප්‍රතිපාදන ලබා දෙනවා. විශේෂයෙන්මප්‍රතිපාදන නොලැබිච්ච ඉතාම අහිමි වෙච්ච පිරිසක් වසර 5ක් අපි ගෙවුවේ ඒ විදියට. ඒත් එක්කම විශ්වාසයක් දිනාගන්න අපිට ලැබුණේ නැහැ මේ පරිපාලනය තුළක්‍රියාත්මක වෙන ආකාරය. විශේෂයෙන්ම කමිටු 9ක් තුළ නියෝජනය

වෙනවා මේ වසර 5තුළ කිසිම කමිටුවකින් වසර 2-3 ඇදිච්ච යෝජනා තමයි අපි දැක්කේ. ඉතින් ඔබතුමා ඔබතුමාටම කියාගන්නවා මෙය තමයි සුරපුරය කියලා. මම තමයි මෙතන රජ්ජුරුවෝ කියලා.නමුත් ඔබ කරපු දෙයක් නැහැ. මම හිතන්නේ වසර 16ක්තුළ ඔබ ඔබේ පාලනය තුළ ඔබ අසාර්ථක පාලකයෙක් ලෙස මම දකිනවා. මේ පහුගිය වසර 5 පුරාම ඔබ කරපු කියපු දෙයක් අපි දැක්කේ නැහැ.ඔබ වාර්තා හදනවා, ඔබ යෝජනා කරනවා, ඔබම ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. ඔබ සමහර වේලාවට ඔබ කැමති විදියට කටයුතු කරනවා. ඉතින් මෙවැනි පාලනයක් තුළමොරටුව මහා නගර සභාව සහ මොරටුවේ ජනතාව මම හිතන්නේ හරිම අසරණ තත්ත්වයක ඉන්නවා. විශේෂයෙන්ම රටේ තත්ත්වය සහ මහා නගර සභාව තුළ තත්ත්වය කියන්නේ සමානාත්මතාවයෙන් යුක්ත තත්ත්ව දෙකක්. අපිට මහා නගර සභාවකින් බලාපොරොත්තු වියහැකි සේවය මෙයින් වෙන්නේ නැහැ.මම හිතන්නේ මධ්‍යම රජය ප්‍රතිපාදන මහා නගරයකට අවශ්‍යවෙන්නේ නැහැ. මහා නගරයට පුළුවන් නිවාස 48000කින් ලැබෙන වරිපනම් මුදල කොපමණක්ද මෙය ක්‍රියාත්මක වන ආකාරය සහ මෙය වර්ධනය වන ආකාරය අනුව මෙයින් ලබන ආදායම් තත්ත්වය විශාල ලෙස වර්ධනය කරගෙන ඔබතුමාට පුළුවන් විවිධ ක්‍රමෝපායමාර්ග භාවිතාකරන්න. නමුත් අපි දැක්කේ නැහැ ඔබතුමා මේ වසර පහක නැවුම් අලුත් ක්‍රියාමාර්ග වලට යනවා දේශපාලන ක්ෂෙත්‍රයේ නව්‍යකරණයක් අපි දැක්කේ නැහැ. පරිපාලන දුරුවලතා විතරයි අපි දැක්කේ. ඇත්තටම ඔබතුමා හිතනවා ඔබතුමා නමුත් කරපු දෙයක් නැහැ. ඒවගේම අපේ විශ්වාසනියභාවයක් අපිට තිබුණේ නැහැ. වසර 5 පුරාම ඔබතුමා ගැන විශ්වාසයක් කවදාවත් අපි දුටුවේ නැහැ. මන්ත්‍රිවරු ලෙස ඔබතුමා අපිට කිසිම පරිපාලනයතුළ නිසිතැන දුන්නේ නැහැ කියලා කියන්න කැමතියි. විශේෂයෙන්ම රටේ තත්ත්වය අනුව නගර සභාව තුළ මම හිතන්නේ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ ඉතාම අඩපණ වෙලා තියෙනවා. අපි හොයා බලද්දි ළමා හා මාතෘ සායනවල තත්ත්වය ඉතාම දුර්වල වෙලා තියෙනවා.අපිට දිනෙන් දින ලැබෙන අදහස් යෝජනා අපි ළග තියෙන යෝජනා එමටයි.නමුත්, අපිට ඒ යෝජනා ඉදිරිපත් කරන්න තැනක් නැහැ.අපි අසරණවෙලා බලාගෙන ඉන්නවා. ඉතින් පරිපාලන ක්ෂෙත්‍රය වගේම ඔබතුමාත් අසාර්ථක පාලකයෙක් විදියට ඇත්තට මම මේ මොහොතේ නම්කරන්න කැමතියි. සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමනි, ඔබතුමා අසාර්ථක වුණා, ඔබ වසර 16ක් තියා ඉස්සරහාට 16ක් හිටියත් වැඩක් වෙන්නේ නැහැ. මොරටුවට ඔබතුමා කරපු දෙයක් නැහැ කියන එක මම ඉතාම නිර්භයව ප්‍රකාශකරන්න කැමතියි. ඒවගේම අධ්‍යාපන ක්ෂෙත්‍රය, සෞඛ්‍ය ක්ෂෙත්‍රය සහ බඩගින්නේ මියදෙන තත්ත්වයකට වඩුවන් අද වැටිලා තියෙනවා.ඔබතුමා ගන්න ක්‍රියාමාර්ගයක් නැහැ. ඔබතුමා වඩු ප්‍රශ්නයට කථාකරන්නවත් කැමැත්තක් දක්වන්නේ නැහැ. ඉතින් මේ පාලනය සහ පාලකයා සහ පාලිතයා කියන මොරටුව ආසනයේ දියත්වියයුතු වැඩසටහනක්‍රියාත්මක කළේ නැහැ කියන එක මම තරයේ ප්‍රකාශ කරන්න කැමතියි. ඒත් එක්කම විශේෂයෙන්ම රටක් විදියට ඉස්සරහාට යන්නටනම් මම හිතන්නේ පළාත් පාලන ක්ෂේත්‍රය ශක්තිමත් වියයුතුයි. මධ්‍යම රජයේ විමධ්‍යගත අයවැය අවශ්‍ය නැහැ නගරයක් දියුණු කරන්න. අපිට පුළුවන් අපි ලබන අයවැය හරියාකාරව ප්‍රගුණ කරගනිමින් නගරය වර්ධනය කරන්න. ඒ සඳහා ක්‍රමෝපාය මාර්ග සැලැස්මක් අපි ඔබතුමාගේ දැක්කේ නැහැ. ගිය වසර 5 පුරාවටම නවක මන්ත්‍රිවරු ලෙස අපි ඉතාමත්ම කණගාටුවට පත්වෙනවා සමන්ලාල් ප්‍රනාන්දු කියන පාලකතුමා තමන්ට අයත් කොටසක් රැකගෙන තමන්ගේ පක්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා අපි මේ ඇස්දෙකට දැක්කේ අපි ක්‍රියාත්මක වුණේ ඔබතුමා යටතේ තිබුණ කාලය තුළ. ඔබතුමා ඇත්තටම ඔබතුමා හිතනවා මම තමයි කුණු කසල ඉවත් කරන පිරිසිදු පාලකයා කියලා. නමුත් ඔබ අපිරිසිදු පාලකයෙක්. ඔබ ක්‍රියාත්මක වුණේ නැහැ නිසිලෙස ක්‍රියාත්මක වුණේ නැහැ.ඔබ සාධාරණව කටයුතු කළේ නැහැ. ඔබ තෝරාගත් පිරිසකට ඔබේ පක්ෂයට විතරක් ඔබ ක්‍රියාත්මක වුණා. සම්පූර්ණයෙන්ම අපේ පරිපාලන ක්ෂෙත්‍රය විය යුත්තේ එහෙම නෙමෙයි. ඔබ සමානාත්මතාවය දන්නේ නැහැ. ඔබ දන්නේ නැහැ නගරයේ පාලකයා විදියට අනිත් අයට සලකන්න නිසිලෙස සලකන්න. ඒනිසා ඔබ අසමත් පාලකයෙක් විදියට නැවතත් මම නම් කරන්න කැමතියි. ඒවගේම විශේෂයෙන්ම මොරටුව ජනතාවගේ හිතසුව පිණිස ඔබ කළා කියන ව්‍යාපෘති මොනවාද වසර 16ක් ඉදලා ඔබ මොනවාද කළේ. ඔබ වසර 16කට කරපු දෙයක් නැහැ. විශේෂයෙන්ම කාන්තා දේශපාලනයට ඔබ කිසිම සහයෝගයක් දුන්නේ නැහැ. දුර්වල පාලකයෙක් විදියට මම නම් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අය වැය ලේඛන කෙටුම්පත 2023 වර්ෂය සඳහාඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඔබතුමාට සුබ පතනවා,එ වගේම අපි බොහොම කණගාටු වෙනවා, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට සේනක දමයන්ත ගරු මන්ත්‍රීතුමා මෙම කෙටුම්පත් විවාදයට එක් වෙමින් එතුමා මේ සම්බන්ධව මම දැනුවත්වනම් කිසි දෙයක් කතා කලේ නැහැ, එතුමා කතා කලේ ඔබතුමා සමඟ තියෙන්නාවූ වෛරයක් පිළිබඳව ඒ වෛරය මෙතනදි පිට කලා කියලා තමයි අපිට තේරෙන්නේ, හැබැයි එක් පැත්තකින් එතුමා ඔබතුමා ගැන කතා කරනවා අනෙක් පැත්තෙන් මේ මොරටුව මහා නගර සභාවට යම පුද්ගලයෙක් සේවාවක් ලබා ගන්න ආවාහම මුදල් නොදී කර ගන්න බැහැ කියලා කියනවා. ඉතින් අපි ලැජ්ජවෙන්න ඕනෑ එතුමා ලැජ්ජවෙන්න ඕනෑ එතුමා මහජන නියෝජිතයෙක් විදිහට එතුමාට පුළුවන් ඉදිරිපත් වෙන්න.

**සභා ඝෝෂා**

මහජන නියෝජිතයෙක් විදිහට ඔබතුමාට ජනතාව ඇවිත් එහෙම කියනවනම් ඔබතුමා මැදිහත් වෙන්න ඕනෑ. සභාවට එනවද ඔබතුමා එන්නේ නැහැනේ මහා සභාවට එනවා දීමනාව ගන්න ඕන නිසා.

**සභා ඝෝෂා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මෙය ඉදිරිපත් කරන්නේ ලබන වර්ෂය සඳහා අය වැය වැඩ සටහන, එක ගැනනේ අපි කතා කරන්න ඕන. ක්‍රියාත්මක වෙන විදිය ගැනනේ අපි කතා කරන්න ඕන. මෙය සම්මත උනාට පස්සේ ඉදිරි වර්ෂයේ මෙය තමයි ක්‍රියාත්මක වෙන්නේ. ගරු නගරාධිපත්තුමනි, ඔබතුමා නගරාධිපතිවරයා හැටියට දිවුරුම් දෙනකොට 2006 මමත් පත් වෙනවා ඒ පත්වුන දවසේ ඉඳලා මහජන නියෝජිතයෙක් හැටියට අපි අපේ වගකීම යුතුකම ඉටුකරලා තියෙනවා අපි කිසිම දවසක මේ සභාවට එන්නේ නැතුව ඉඳලා නැහැ, අපි හැමදාම මේ සභාවට එනවා ඇවිත් ජනතාව වෙනුවෙන් වෙන්නනාවූ සේවාව අපි කරනවා. මේ වර්ෂයෙදී කොතරම් ආර්ථික අපහසුතා තිබුණත් මහා නගර සභාවක් විදිහට අපි අපේ ජනතාව වෙනුවෙන් කරන්න තියෙන වගකීම යුතුකම අපි ඒ විදිහටම කළා, අද මෙතුමාලා කියනවා අරක මේක කලේ මේගොල්ලෝ අරගොල්ලෝ කියලා, හැබැයි එහෙම කරපු අයට බලයේ ඉන්න ලැබුණේ නැහැ මේ අය කියනවා අපි වැඩ කරේ නැහැ කියලා හැබැයි ඔබතුමා 2006 ඉඳලා මහා නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට ඉන්නවා. අපි අණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු හැටියට ඉන්නවා. මෙහි අඩුපාඩු තිබෙන්න පුළුවන් හැබැයි අපි ජනතාව වෙනුවෙන් උපරිමය කරන්න උත්සහ කරන්න ඕන. අපි ඒ උත්සහය ගන්නවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් අපි බලාපොරොත්තු වෙන්නේ ඒකතමා, මෙහි තියෙන දේ යථාර්තයක් කිරීමට අපිට උදව් කරන්න එකයි කළ යුත්තේ එහෙම නැතුව මෙතන වෛරයකින් කතා කරන්න එපා කියලා තමයි අපිට කියන්න තියෙන්නේ. ඔබතුමා ඊලඟ සැරේ බලය ගන්න හැබැයි ඔබතුමා ඊලඟ සැරේවත් ඔබතුමාගේ කොට්ඨාශයෙන් ඡන්දය ඉල්ලන්න අඩුම ගානේ එතනට වැටෙන්නකෝ. ඔබතුමා දිනයි නගරාධිපතිත් වෙයි කියමුකෝ එතකොටත් ඉදිරිපත් කරන්න තියෙන්නේ මේ වගේ සංඛ්‍යා ලේඛන තියෙන එකක් තමයි නැත්තම් ඔබතුමා ඇවිල්ලා වෙනම විජ්ජාවක් පෙන්නයිද,

**සභා ඝෝෂා**

ගරු නගරාධිපතිතුමනි, මේ හැමෝම ඉන්න තැන ජනතාව දන්නවා කොහෙන් ආපු අයද කොහොම ආපු අයද කියලා, එ ගැන අපි කතා කරන්න අවශ්‍ය නැහැ ගරු මන්ත්‍රීතුමා, අපි ඇත්තටම සතුටු වෙනවා ගරු නගරාධිපතිතුමනි ඔබගේ මේ ඉදිරිපත් කිරීම ගැන, ඔබතුමා මේ වර්ෂයෙදීත් කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා විදිහට අපිට ලොකු වගකීමක් පවරලා තියෙනවා අපි එක නිසා කිසි විටක අපේ කොට්ඨාශය ගැන විතරක් බැලුවේ නැහැ අපිට එ වගකීම දුන්නා සියළු මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ බලන්න. ඒක අපිට අණ්ඩු පක්ෂයෙද විපක්ෂයෙද කියලා අපිට බලන්න කිවුවේ නැහැ. හැම කොට්ඨාශයක්ම නියෝජනය වන විදිහට කාණු බොක්කු සංවර්ධනය කරන්න පුළුවන් මට්ටමට ඔබතුමා අපිට පහසුකම් සලසලා දීලා තියෙනවා,

ඔබතුමාගේ තියෙන බලය අපිට දීලා වැඩ කරන්න අපිට දීලා තියෙනවා. මේ පිළිබඳව ඔබතුමාට අපි ස්තුතියි වන්ත වෙනවා ජනතාව වෙනුවෙන්. ඊලඟ වර්ෂයේ අපිට නැති වෙන්න පුළුවන් මේ තනතුරු ඒ වගේම තමයි අපි නිරන්තරයෙන්ම හැමදාම උදේට මෙතනට ඇවිල්ලා මෙතන සටන් කරන්නේ මෙය යථාර්ථයක් බවට පත් කරන්න. එ වගේම ඔබතුමා එක්ක ඉන්න මිනිස්සු හැටියට අපි දකිනවා ඔබතුමා මෙය ක්‍රියාත්මක කරන්න නිලධාරින් සමඟ මොනතරම් ෆයිට් කරනවද කියන එක, නිලධාරින් වැඩ කරන්නේ නැහැ කියන එක නෙවෙයි කියන්නේ, ඔබතුමා එක්ක වැඩ කරනකොට නිලධාරින් ලොකුවට දුවන්න උවමනාව තියෙන්න ඕන නිලධාරින්ට ඉබි ගමනින් යන්න බැහැ. ඉතා ඉක්මනින් වැඩ කරන්න වෙනවා ඔබතුමා එක්ක වැඩ කරද්දී. එහෙම අවස්ථාවලදි නිලධාරින් සමඟ ගැටුම් ඇති වෙන අවස්ථා තියෙනවා. එහෙම වෙන්නේ වෙන කිසි දෙකට නෙවෙයි මේ ජනතාවට සේවය කරන්න. ඒනිසා ඔබතුමාට 2023 වර්ෂයේත් මෙය යතාර්ථයක් බවට පත් කරන්න ශක්තිය ධෛර්ය උපරිම කැප කිරීම, අපි ලබා දෙනවා කියමින් මාගේ පාක්ෂපාතිත්වය දක්වනවා කියමින් මගේ කතාව අවසන් කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභා ආඥා පනතට අනුව මහජන සෞඛ්‍ය උපයෝගිතා සේවාව පොදු මංමාවත් විධිමත් කිරීම පාලනය කිරීමහා සුබසාධක කටයුතු වර්ධනය කිරීම අපි සියළු දෙනාගේ වගකීමයි. එක් එක් අයෙගේ පුද්ගලික ප්‍රශ්න විසඳීමට නොව පොදු ජනතාවගේ ප්‍රශ්න වලට විසඳුම් ලබා දීම අපගේ වගකීමක් හා යුතුකමක් වේ. එවිටයි පළාත් පාලන දේශපාලඥයින්ගෙන් වඩාත් මහජන සේවාවක් ඉටු වන්නේ,පොදු ජනතා අපේක්ෂාවන් හඳුනා ගනිමින් එවා සපුරාලීමට ප්‍රතිපාදන සපයාදෙමින්, පරිපාලනයකින් පවත්වාගෙන යාම තුලින් පටු අරමුණු මුදුන්පත් කර ගන්න අයගේ අරගල සඵල නොවනු ඇත. මිනිසා මවගේ කුස පිළිසිඳ ගත් අවස්ථාවේ සිට ඉපදෙන මොහොතෙත් ජිවත්වෙන කාලයෙත් මියදෙන තුරුත් මිහිදන් කරන තුරුත්, මේ මොරටුව මහා නගර සභාව තුළින් කෙරෙන්නාවූ සුවිශේෂි වැඩ පිළිවෙලක් ඇත. මෙම කාර්යයන් ඉටු කර ගැනීමට පැමිණෙන ජනතාවට එය ක්‍රමවත්ව ඉටු කර ගැනීමට පහසුකම් සැලසීම අප සැමගේ වගකීමකි. පවතින ආර්ථික ගැටළු මධ්‍යයේ අභ්‍යාස පොතක් පෙරපාසල් උපකරණයක් මිලදී ගැනීමට නොහැකි දරුවන් සිටි. දුප්පත් පවුල් සිටි පාසල් නොයන දරුවන් අප

බල ප්‍රදේශයේ සිටින බව අපි දනි. යන්තමින් ජීවිතය ගැට ගසා ගන්නා එම පවුල් වල ඇතැම් දරුවන් පාසල් යවාගන්න නොහැකිව දෙමාපියන් අසරණ වී ඇත. ඔවුන්ගේ ආර්ථිකය හීන වී ඇත. එම දරුවන් පාසල් යැවීමට වැඩ පිලිවෙලක් මෙම සභාවෙන් ක්‍රියාත්ම කරන්නේනම් මා වඩාත් වැදගත් ව්‍යාපෘතියක් ලෙස සලකන්නෙමි. මොරටු මහා ජනතාවට සුවිශේෂි සේවවක් කළ මාගේ මාමණ්ඩිය වන මියගිය සනි ප්‍රනාන්දු මහතාව සිහිපත් කරමි. එමෙන්ම ඔවුන් ගෙන ගිය වැඩ කොටසින් යම් කොටසක්වත් මා හට සිදු කිරීමට නොහැකි වී ඇත. ගරු නගරාධිපතිතුමනි, පළාත් පාලන නියෝජිතවරියෙක් වෙන මා හටද අනෙක් මන්ත්‍රීවරුන්ටද ඔබ පක්ෂයේ අයට මෙන් ජනතාවට යමක් කිරීමට අවශ්‍ය සහයෝගය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලමි. ගරු නගරාධිපතිතුමා ඇතුළු සියළු දෙනාට ලබන්නා වු නත්තල සාමය සතුට පිරි සුබ නත්තලක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මා නියෝජනය කරන ඉදිබැද්ද ජනතාවගේ සුභාශිංසන මම ඔබතුමාට පුදකරනවා ඒ වගේම ජනතාවගේ ජිවන ආර්ථික තත්ත්වය 2023 වර්ෂයේ ඉහළ නැංවීමට ඔබතුමා කටයුත් යොදවලා තියෙනවා. 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේ පොදු කටයුතු සඳහා ඔබතුමා වැඩපිළිවෙලක් සකස් කරලා තියෙනවා, කාබනික පොහොර ව්‍යාපෘතිය ඔබතුමා ආරම්භ කරලා තියෙනවා. මම ඉදිබැද්ද ජනතාවගේ සුභාශිංසන පුද කරමින් මගේ කතාව අවසන් කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. දිපා චාන්දනි ආරියවංශ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අද දින ඉදිරිපත් කළ අයවැය 2023 වර්ෂය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන, වලට අනුව මහජන නියෝජිතයෙක් හැටිහට මා සතුටු වෙමි. කොරෝනා වසංගතය හේතුවෙන් පසු ගිය වර්ෂ වලදී අප ගම් සංවර්ධනය කිරීම සම්පූර්ණ කර ගත නොහැකි වුනත්, මංමාවත් සඳහා මාගේ රාවතාවත්ත නැගෙනහිර කොට්ඨාශයට වෙන් කරන ලද ප්‍රතිපාදන වෙනුවෙන් මාගේ කොට්ඨාශයේ ජනතාවගේ හා මාගේ පුද්ගලික ස්තූතිය පුදකර සිටිමි. ඉදිරිකාලය තුලදී අප කොට්ඨාශය වෙනුවෙන් ඔබතුමාගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අයවැය වාර්ථාව කියවනකොට යම් යම් ගැටළු තිබුණා මම ඒවා මේ වෙලාවේදි පෙන්වන්න කැමතියි, එහි නිලධාරින් පැත්තෙන් බැලුවොත් සංවර්ධන නිලධාරින්ගේ අතිරික්තය 23 හැටියට දක්වලා තියෙනවා. ඒ වගේම ඔවුන්ව ආපහු ඉල්ලලා තියෙනවා 16ක් 23ක අතිරික්තයක් තියෙනවානම් කොහොමද 16ක් ආපහු ඉල්ලන්නේ කියලා ප්‍රශ්නයක් මට පැන නැගුනා. ඉතුරු පුරප්පාඩු 8ක් තියෙනවා. ඔබතුමා ආපහු ඉල්ලලා තියෙනවා 15 දෙනෙක්, ඒ වගේම යන්ත්‍ර ක්‍රියාකරු පුරප්පාඩු 04ක් තියෙනවා, ඉල්ලලා තියෙනවා 9 දෙනෙක්. මම මුහුණ දුන්න ගැටළුවක් තමයි අය වැයක් සම්බන්ධව වාර්තාවක් ගොනු කරනකොට අපි ළඟ තියෙන පුරප්පාඩු ප්‍රමාණය විතරයි ඉල්ලන්න පුළුවන් ඊට වැඩියෙන් ඉල්ලන්න බැහැ. එහෙමනම් එයට විශේෂ හේතු තියෙන්න ඕනෑ. අතිරික්ත 23ක් තියෙද්දි 16ක් ඉල්ලන්නේ කොහොමද කියන එක විශාල ගැටළුවක්. තවද වැටුප් හා අතිකාල දීමනා යටතේ වෙනත් වියදම් මේ හැම දේයක්ම දීලා තියෙන ගාණ මම කියන්නේ නැහැ. නමුත් ඉතාම වැඩි සංඛ්‍යාවක් පෙන්නනවා. එතනදි මට ආපු ගැටළුව තමයි මෙහි හේතුව මොකක්ද එකක් මම දකිනවා සේවකයන් වැඩියෙන් ගන්න බලාපොරොත්තු වෙනවද ඉන්නවට වැඩිය. අනෙක් ගැටළුව තමයි සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න බලාපොරොත්තු වෙනවද නැත්තම් මෙච්චර විශාල සංඛ්‍යාවක් කොහොමද ඔබ ඉදිරිපත් කරන්නේ? ඊට පස්සේ මම දැක්කා පෙර පාසල් සම්බන්ධ ගැටළුවක්, ආහාර සඳහා ඔබතුමා සැහෙන්න මුදලක් යොදලා තියෙනවා, නමුත් පාසල් උපකරණ සඳහා ඔබතුමා දාලා තියෙන්නේ සාධාරණ ගණනක් නෙවෙයි. 2021දී ලක්ෂ 31 වෙන් කරපු ඔබ 2023 වෙන් කරන්නේ ලක්ෂ 30යි. අපි දන්නවා පාසල් උපකරණ එකට තුනක් ගුණයක් හතරගුණයක් වැඩි වෙලා තියෙන්නේ එන අවුරුද්දට මීට වඩා වැඩි වෙනවා. ඔබතුමා මේ මුදල දාලා තියෙන ගානට උපකරණ ප්‍රමානය කප්පාදු කරලා දෙන්න බලාපොරෝත්තු වෙනවද කියලා තමයි මට දැනිච්ච සැකය. ඊළඟට මම ඔබට ඉදිරිපත් කරනවා මෙහෙම එකක් ආහාර හා සනිපාරක්ෂක කටයුතු ඒ වගේම රෝග වැලැක්වීම නිර්ණායක යටතේ ඔබතුමා ගනු දෙනු වගයක් අපිට පෙන්නනවා. එතනදි මගේ හිතට දැනුනා සතුටක් ගිය වියදම් වලට වඩා වැඩි මුදලක් ඔබතුමා පෙන්නනවා. එ පෙන්නනකොට මම හිතුවා මොරටු ජනයාට ඉතා සුභදායි ආකල්පයක් ඇතුව යම්කිසි නව වැඩ පිළිවෙලක් කරන්න යනවා කියන සතුටෙන් මෙය විග්‍රහ කරනකොට මම දැක්කේ මොටර් වාහනයකට ලක්ෂ 60ක් වෙන්කරලා. කරන ක්‍රියාවලියේ අර්ථය මහජන සුබසාදනය නෙවෙයි. ඔබතුමා ඒකට වෙන් කරගෙන තියෙන්නේ මොටර් රථයක්. මේවාගේ විවේචනයට වඩා අපි හිතන්න ඕනෑ දේවල් බහුලයි නගර සභාව ක්‍රියාත්මක වෙන්නේ මහජන සුබසිද්ධිය සඳහායි, නිලධාරින්ගේසුබසිද්ධිය සඳහා නෙවෙයි. ඒ වගේම පෙරපාසල් තත්ත්වය මම 2018 ඉඳන් දක්වපු කාරණාවක් තිබුණා ඊට කලින් කියපු අදහසක් අනුව. එ අය අලුත් තාක්ෂණයවේදය පුරුදු වෙන්න ඕනෑ නමුත් නගරාධිපතිතුමනි ඔබතුමා අවුරුදු 15 ඇවිල්ලා, නමුත් මේ ක්‍රමයට ඔබතුමා ගිහිල්ලත් නැහැ එ වගේම ගුරුවරුන් ගේ සුදුසුකම් අනුව ඒගොල්ලන්ව ඒ තැනට ගෙනියන්නත් බැහැ. මොකද ඔලෙවල් වලට ගණිතයවත් පාස් වෙච්ච නැති අය අපි අතර ඉන්නවනම් ඒ සඳහා පුහුණුවීම් අවස්ථා දෙන්න අපිට බැහැ. ඊලඟ එක තමයි බොරු ආදායම් පෙන්නලා තියෙනවා. වෙළඳසැල් කුලි වලින් 2021 ලක්ෂ 25ක් ඔබතුමා, ලබා ගත්තා, 2023 ලක්ෂ 71ක් බලාපොරොත්තු වෙනවා රට යන තත්ත්වය බැලුවහම එච්චර ගාණක් ඔබතුමාට ගන්න පුළුවන්ද කියලා සැකයක් තිබෙනවා. ඊලඟ එක තමයි ගිනි නිවීමේ සේවා ගාස්තු 2021 ලක්ෂ 21 ගත්තු ඔබතුමා 2023 ලක්ෂ 150ක් බලාපොරොත්තු වෙනවා. මම මේ පෙන්නුවේ ඔබතුමා ආදායම ලොකුවට පෙන්නනවා ලැබෙන ආදායමක් නැහැ, ජනතාවට සුබසිද්ධියක් කරන්ననම් ඔබතුමා ඇත්ත ආදායම

පෙන්වන්න ඕනෑ. ඔබතුමාට ඕනෑ ඔබතුමාගේ පක්ෂය දියුණු කරන්න මිසක් ජනතාවට දේයක් කරන්න නෙවෙයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ලලිත් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ඔබතුමා මේ අය වැය ඉදිරිපත් කර ඇති බව අපිට හොඳින් පෙනියනවා, මොරටු ජනතාවට කුණු කසල වලින් තොර පිරිසිදු නගරයක්, සෞඛ්‍ය සම්පන්න ජිවත්වීමට හොඳ අයවැයක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරනවා. ලබන්නාවූ 2023 වර්ෂය සැමට සුභ නව වසරක් වේවා කියා ප්‍රර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ අවසාන අයවැය තමයි මෙය. ඉලක්කම් ගොඩකට යට වෙන්න කලින් මම හිතුවා අපිට ඉදිරිපත් කරන ලේඛනයේ මුල් ටික කියවලා බලන්න මෙහි සභා තොරතුරු ගැන සඳහන් වෙනවා, එහි තියෙන විදිහට අපි විසින් පාලනය කරන හා මැදිහත්වීම් කරන යන ආයතන හැටියට පෙරපාසල් 19 ක් මාතෘ හා ළමා සායන 16ක් සුපිරි වෙළඳ සැල් 3ක් සභාව සතු කඩ කාමර පිහිටි ස්ථාන 9ක් දින පොළ 1ක් ජත්‍යන්තර ක්‍රිඩාංගන 1ක් මහජන ක්‍රිඩාංගන 8ක් පුස්තකාල 7 වගේ දිග ලේඛනයක් තිබුණා. තව මෙහි තිබුණා ආදර්ශ පාඨ, එහි තිබුනේ ආයතනයේ හා නගර වාසීන්ගේ යහපත උදෙසා කාර්ය මණ්ඩලයේ කැප වීම එහා පැත්තේ නිල්, මාව හොල්මන් වුනා. ඊට පස්සේ කියවන් යද්දි මට හිතුන දේයක් තමයි මේ අය වැය වාර්තාව පුරාවට නිල්ම තමයි කියලා. මොකද මම මෙය මුල ඉඳන් බලන් යද්දි සභා තොරතුරු වල මම අර කියපු ලැයිස්තුවේ දිනපොලවල් තිබුණා අද මේ වෙනකොට අපේ නගර සභාව මඟින් පාලනය වන දිනපොළවල් ගත්තාහම, ජනතාවට ඉතා ආසාවෙන් ඇවිල්ලා බඩු ගන්න පුළුවන් ඉතා හොඳ තැන්ද තියෙන්නේ කියලා හිතුවහම ඉතා කේදනියයි. මොකද ජනතාවට අවශ්‍ය කරන ආහාරපාන සපයන ජනතාවගේ ජන ජිවිතය හා බද්ධ වෙච්ච එවා තමයි මෙවා. හැබැයි සෞඛ්‍ය සම්බන්ධ වගකියන ආයතනයක් විදිහට අපි මේ ජනතාවට හොඳ සෞඛ්‍ය සම්පන්න තැනක්ද නිර්මාණය කරලා දීලා තියෙන්නේ කියලා හිතුවහම හරිම කණගාටුයි. ඉතින් ගරු නගරාධිපතිතුමනි අපි හිතුවොත් එහෙම අපෙන් පාලනය වන මේ දිනපොළවල් වල තත්ත්වය ගැන, ආදායම ගැන හිතලා බැලුවොත් මහජන උපයෝගිතා ඇස්තමේන්තුව ගැන බැලුවොත් 4202, අපි එකට ගියාම එහි ආදායම ඔබ ඇස්තමේන්තු කරනවා 2022 වර්ෂයේ 5,258,822ක් එතකොට මෙහි මේ වෙනකොට ආදායම් ඇස්තමේන්තුව ඉක්මවා ගිහින් තියෙනවා. එතකොට මේ සම්පුර්ණ කොටසේ ආදායම් විස්තරය ගත්තහම දෙලක්ෂ පනස්අටදහස් අටසීයය විසි දෙකක ආදායමක් දාලා තියෙනවා, අපි ඊළඟ කාර්තුවත් එක්ක බැලුවොත් එහෙම ආදායම් ඇස්තමෙන්තුව ඉක්මවලා යනවා. එතකොට ගරු නගරාධිපතිතුමනි, මෙවන් ආදායමක් අපි ලබනකොට අපි හිතුවොත් එහෙම මේ දින පොළවල් නඩත්තු කටයුතු වෙනුවෙන් අපි මොනවද කරන්නේ කියලා. අපි වියදම් ඇස්තමෙන්තුවට ගිහින් බැලුවොත් පිටු අංක 105, කිසිවක් මේ වෙනුවෙන් වෙන් කරලා නැහැ. එ වගේම සුබසාධක සේවා ඇස්තමේන්තුවට ගියොත් 4201 ක්‍රිඩාංගන ගාස්තු 2022 වර්ෂයේ ලක්ෂ 60ක් විදිහට පෙන්නනවා එතකොට එ ලක්ෂ 60ක් පෙන්නන එකේ, 2022 නවවෙනි මාසේ වෙනකොට සත්‍ය විදිහට පෙන්නනවා 4,888,200ක් එතකොට කාර්තුව එක්ක බැලුවහම ඇස්තමේන්තු මුදලඉක්මවලා ආදායම ලැබිලා තියෙනවා, ඊට පස්සේ පිටු අංක 111ට ගියාම වියදම් සඳහා සතපහක් යොදලා නැහැ, 2022 සත්‍ය විදිහට පෙන්නන්නේ නැහැ. එතකොට එහි ප්‍රතිඵල විදිහට නගරාධිපතිතුමනි අපේ පාසල් දෙකක් අතර මැච් එකක් ගහගන්න බැරි තැනට මේ ක්‍රිඩාංගන පත් වෙන්නේ. ඒ වගේම අපේ පෙරපාසල් පද්ධතියට ගියහම. පිටු අංක 74, දරුවන්ගේ සුබසාධන කටයුතු සඳහා වෙන් කරනවා 2022 ලක්ෂ 6ක්. ඔබ වියදම් කරන්නේ දරුවන්ගේ සුබ සාධනය වෙනුවෙන් 48500යි. සත්‍ය පෙන්නන්නේ එහෙමයි. 6න් 1ක් වියදම් කරලා නැහැ, මම මෝදර පෙර පාසලකට ගියා එහි දකින්න තියෙන්නේ වහලේ කොන්ක්‍රිට් ගැලවිලා වැටෙනවා දරුවන්ගේ ජීවිත තියෙන්නේ අනතුරක මේවා වෙනුවෙන් මුකුත් කරලා නැහැ. හැබැයි ඔබ කතා කරනවා ඒසී කරපු මොන්ටිසොරි හදන්න, එහෙම කතා කරන ඔබ මේ වෙන්කරන ලක්ෂ 6න් 48500 වියදම් කරන්නේ. එහෙම තියෙද්දි ඔබ මේ පාර වෙන් කරනවා ලක්ෂ 10ක් මම අහන්නේ මෙච්චරයි. මේ

ගාන වියදම් කරයිද. ඒක තමයි ලොකුම ප්‍රශ්නය. ඇත්තටම මේ කාලේ දරුවෙක්ට පොතක් පතක් ගන්න හරිම අමාරුයි. එවන් කාලයක ඔබ 2022 වියදම් කරනවා පොත් සඳහා ලක්ෂ 25ක් හැබැයි මේ වෙනකන් සතපහක් වියදම් කරලා නැහැ. එහෙම කරපු ඔබ ලබන අවුරුද්දට දානවා ලක්ෂ 30 ක්, අනිත් එක තමයි මෙහි ලැජ්ජ හිතෙනම කාරණය ඔබ වෙන්කරනවා දරුවන්ට දිවා ආහාරය සඳහා ලක්ෂ 22 වෙන්කරනවා. ඒ ලක්ෂ 22 න් දරුවන්ට කන්න දීලා තියෙන්නේ 16,687 ලැජ්ජයි නගරාධිපතිතුමා, ඉතින් මෙදාසැරේ අයවැයෙන් ලක්ෂ 40ක් වෙන් කරලා කෙරුනොත් හොඳයි. මේ අයවැයට අනුවනම් වෙන්නේ නැහැ එක ස්ථිරයි, මෙහි ගණන් විතරයි ඇති දෙයක් නැහැ ඉලක්කම් විතරයි. ඇත්තටම මෙය පුස් ලියවිල්ලක් විතරයි. මම ඉල්ලීමක් කරනවා මේ ආදර්ශ පාඨවල කාර්ය මණ්ඩලයේ කැපවීම කියලා විතරක් නෙවෙයි පාලකයන්ගේ කැපවීම කියලා දාන්න කියලා. ඒ වගේම අපි මේ අයවැයට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මිනිසාගේ උපතේ සිට මරණය දක්වා සේවාවක් සපයන මොරටුව මහා නගර සභාවේ ඔබතුමාගේ නායකත්වයෙන් විශාල වැඩ කොටසක් ඉටු වෙනවා එය සමහර විපක්ෂ මන්ත්‍රීවරු එක එක විදිහට දක්නවා. ඔබතුමා මොනවද කරේ කියලා ඇහුවම එක එක ප්‍රශ්නාර්ථ මතුවෙනවා. ඔව් ඔබතුමා මොනවද කළේ කියන එක. ඔබතුමා තුන්පාරක් නගරාධිපති පුටුවේ වාඩි වීමෙන් පෙනවා. සිහින තියෙනවා සිහින දකින එක අයිතියක් නමුත් කවදාවත් මුහුණ එක්ක තරහා වුණා කියලා නහය කපා ගන්නේ නැහැ. ඒ නිසා නගරාධිපතිතුමනි, මහජන උපයෝගීතා කාන්තා හා ප්‍රජාසංවර්ධන කමිටුවේ සභාපතිතුමා හැටියට ඔබතුමා අපගේ නගර සභාව මගින් පාලනය වන පෙර පාසල් සඳහා කොහොමද දායකත්වය ලබදීලා තියෙන්නේ කියලා පැහැදිලිවෙලා තියෙනවා. මේ වකවානුව වෙනකොට විශාල ආර්ථික අර්බුදයක් සහ ආර්ථික පීඩනයෙන් පෙලෙන දෙමාපියන්ගේ දරුවෝ තමයි අපේ පෙර පාසල් වලට එන්නේ එම නිසා ඔබතුමා පෙරපාසල් නවීකරණය කරමින් යනවා, දිවා ආහාරය ලබා දෙනවා, ඒ වගේම දරුවන්ට පෙළපොත්, පාසල් උපකරණ ලබා දීමට මෙවර අය වැයෙන් යොජනා කරලා තියෙනවා. එය මම ඉතාමත් අගයකොට සළකනවා, අපිට සීයට සීයක් මේ අය වැය අපිට සාර්ථක කරගන්න බැරිවෙයි මොකද සීයට සීයක් සාර්ථක මිනිස්සු නෙවෙයි. ඔබතුමාගේ මේ අය වැයට මගේ පක්ෂපාතිත්වය ප්‍රකාශ කරමින් මා ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව මාහට ලබාදීම සම්බන්ධව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවේ 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන අයවැය සම්බන්ධයෙන් විවාදයට සහභාගීවීම ගැන මම සතුටට පත්වෙනවා. ඒවගේම මම මේ මොහොතේ සිහිපත් කරනවා ස්තුතිවන්ත වෙනවා මගේ නායක, එක්සත් ජාතික පක්ෂ නායක, වත්මන් ජනපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපි වෙනුවෙන් පළාත් පාලන ආයතනවල සියයට විස්සක කාන්තා නියෝජනයක් ඇති කිරීම සම්බන්ධයෙන්. එක්සත් ජාතික පක්ෂ කොළඹ දිස්ත්‍රික් අපේ නායක ගරු රවි කරුණායක මැතිතුමාට සහ මොරටුවේ හිටපු එක්සත් ජාතික පක්ෂ සංවිධායක ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුදකරනවා. ඒවගේම මම කියන්න කැමති 2020 සඳහා අපේ අයවැය වාර්තාව වැඩි ප්‍රමුඛතාවයක් දීලා තියෙන්නේ ප්‍රාග්ධන වියදම සහ ප්‍රාග්ධන ආදායම සඳහා. 2023 සඳහා අපි ප්‍රමුඛතාවය දෙන්නේ පුනරාවර්තන ආදායම් සහ පුනරාවර්තන වියදම සඳහා. පුනරාවර්තන ආදායම සඳහා කොටස් වැඩසටහන් හතක් යටතේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. පොදු පරිපාලනයට මිලියන හත්සිය හැටතුනයි, සේවා හා බදුවලට මිලියන දෙසියතිස්හතයි, සෞඛ්‍ය සේවා සඳහා මිලියන හතලිස්එකයි, භෞතික සැලසුම් සඳහා මිලියන දාහතයි, මහජන උපයෝගීතාවය සඳහා මිලියන විසිහයයි, සුභසාධන සඳහා මිලියන හතයි, කුණු කසල මෙහෙයවීම සඳහා මිලියන තිහයි. 2023 සඳහා පුනරාවර්තන වියදම සහ පුනරාවර්තන ආදායමට ප්‍රමුඛතාවය දෙන නිසා මම කැමති පුනරාවර්තන වියදම ගැන සඳහන් කරන්න. පුනරාවර්තන වියදම වැඩසටහන් හතක් යටතේ ක්‍රියාත්මක වෙනවා. පළමුවන එක පොදු පරිපාලනය එයට මිලියන හත්සිය හැටතුනක් බලාපොරොත්තු වෙනවා. සමස්ථ පුනරාවර්තන ආදායම එක්දහස් එකසිය විසිදෙකයි. පොදු

පරිපාලනය සඳහා අපි බලාපොරොත්තු වෙනවා හත්සියහැටතුනක්. සමස්තයක් විදියට ගත්තොත් පොදු පරිපාලනයට සියයට හැටඅටක් බලාපොරාත්තු වෙනවා. ඒ යටතෙත් කොටස් වශයෙන් ගත්තොත් මිලියන හත්සිය හැටතුනෙන් කොටස් වශයෙන් ගත්තම එහි තියෙනවා බදු වර්ග කීපයක් ඒ බදුවර්ග කිහිපයෙන් තමයි මිලියන හත්සිය හැටතුනෙන් අපි මිලියන හයසිය දොලහක් බලාපොරොත්තු වෙනවා වැටුප් ප්‍රතිපූර්ණයෙන්. මිලියන හයසියදොලහ 2023 අවුරුද්දේ ලබාගන්න හැකියාවක් තියනවාද? 2021 විගණන වාර්තාව ගත්තම එහි අපිට ගැටලුවක් තියෙනවා වැටුප් ප්‍රතිපූර්ණය සම්බන්ධව. කාඩර් අසුතුනට එකසිය දොලහට මිලියන හැටඅටක් අපිට ලැබිය යුතුයි. තාම අපිට ලැබී නැහැ. ඒ වකවානුව තුළ අපි තව මිලියන හයසිය දොලහක් බලාපොරොත්තු වෙනවා. ඒකෙන් සම්පූර්ණ ආදායම මිලියන හැටතුනෙන් එකසිය දොලහක් අපි වැටුප් ප්‍රතිපූර්ණයන් බලාපොරොත්තු වෙනවා. මම කියන්නේ මෙතනදී ලොකු අවධානමක් ගන්නවා. ඒනිසා මෙතනට පොදු පරිපාලන ආදායම යටතේ අපි ලොකු අවධානයක් යොමු කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ යටතේ තවත් වැඩසටහනක් ගන්නවා.නීති කටයුතු සම්බන්ධයෙන් 2022ට සමස්ත වියදමක් හැටියට නීති ගාස්තු වශයෙන් අපි වෙන්කරනවා මිලියන තුනයි දශම දෙකක්. නමුත් අපි වියදම් කරනවා මිලියන හතයි දශම අටක්. 2022 නීති ගාස්තුව සඳහා අපි වෙන් කරන්නේ මිලියන එකයි දශම හයයි. නමුත් අපි ගෙවීම් කරනවා මිලියන හයයි දශම හයක්. එතනදි අපි දකිනවා ලොකු වැඩිවීමක්. ඒවගේම 2023 වර්ෂය සඳහා සමස්ත අයවැයම ගත්තම අපි නීති කටයුතු සඳහා මිලියන දහයයි දශම දෙකක් වෙන්කරනවා. එතනදි අපි නීති ගාස්තු සඳහා 2023 වර්ෂය සඳහා මිලියන අටක් වැය කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙතනදිත් අපිට ගැටලුවක් මතුවෙනවා. මේ මුදල නීති කටයුතු සම්බන්ධයෙන් ගෙවන ගෙවීම් සම්බන්ධව අපි මීට වඩා අවධානයක් යොමු කළ යුතුයි. එතකොට මම එනවා අනෙක් පොදු පරිපලන වියදම යටතේ සේවා හා බදු වලින් පුනරාවර්තන ආදායම දෙසිය තිස්හතක් බලාපොරොත්තු වෙනවා. වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා මිලියන තිස්හයක්. සමස්ත පුනරාවර්තන ආදායම රුපියල් එක්දහස්එකසිය විසිදෙකෙන් මිලියන දෙසියතිස්හතක් බලාපොරොත්තු වෙන්නේ සේවා සහ බදු යටතෙත් අපිට බදු වර්ග කිහිපයක් තියෙනවා. ව්‍යාපාර බදු, වරිපනම් බදු, විනෝද බදු. වරිපනම් බදු ගත්තම මිලියන දෙසිය විස්සෙන් මිලියන දෙසිය හයක්ම අපේ වරිපනම් බදු, වරිපනම් බදුවලටත් 2021 විගණන වාර්තාවේ ගැටලුවක් තියෙනවා. වරිපනම් වලට මිලියන හයක් කපා හරිනවා.එතනදිත් ගැටලුවක් තියෙනවා අපි විසඳලා නැහැ.තවත් අපි මිලියන දෙසියහයක් බලාපොරොත්තු වෙනවා 2023 වර්ෂයට ඒනිසා මෙතනදි මම කියනවා ආදායමක් නිසා මිලියන දෙසියහය විශේෂයෙන්ම වරිපනම් බදු වලින් මෙයට විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. අපි ගත්තහම සෞඛ්‍ය සේවාව සඳහා අපි ආදායමක් බලාපොරොත්තු වෙනවා මිලියන හතලිස්එකයි වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා මිලියන එකසිය හැත්තෑපහක්. මේ මිලියන හතලිස්එකෙන් අපි වැඩිම මුදල අපි බලාපොරොත්තු වෙන්නේ උසාවි දඩ වලින් 2022 වර්ෂයේදී උසාවි දඩ වලට මිලියන තිහක් වෙන් කරනවා.නමුත් අපිට රුපියලක්වත් ලැබිලා නැහැ. 2023 වර්ෂයට මිලියන හතලිහක් වෙන්කරනවා.දෙවැනි කොටසට මම යනවා රෝග වැලැක්වීම සහ පශු වෛද්‍ය පිටු අංක 43. ඒකෙදි අපි රෝග වැලැක්වීම සඳහා වියදම් ලෙස නමයයි දශම හතක් අපි ඇස්තමේන්තු කරනවා.පශු වෛද්‍ය රෝග වැලැක්වීම සඳහා තුන්ලක්ෂ පනස්දහසක්, සුනඛ වන්දිකරණය සඳහා මිලියන එකයි දශම අටක්, මිලියන නමයයි දශම හතෙන් රෝග වැලැක්වීම සඳහා වියදම් කරන්නේ මිලියන දෙකයි දශම එකයි.විෂ සම්බන්ධව කටයුතු කරන්න තියෙන්නේ සියයට විසිඑකයි.රෝග වැලැක්වීම සඳහා අපි මිලියන නමයක් වෙන්කරනවා.නමුත් මේ විෂය සඳහා අපිට වියදම් කරන්න තියෙන්නේ මිලියන දෙකයි දශම එකයි. මුළු වියදමෙන් සියයට විසිඑකයි. ඉතා කණගාටුයි.අපි සුවසේවා ආයුර්වේද සඳහා මිලියන විසිහතයි දශම හතක් වෙන්කරනවා.මිලියන හතරයි දශම පහක් වෛද්‍ය සැපයුම් සඳහා වෙන්කරනවා.අනෙක් ඒවා පරිපාලනය වියදම් සඳහා යනවා.විෂය සම්බන්ධව වැඩ කරන්න තියෙන්නේ මිලියන හතරයි දශම පහක්.මුළු වියදමින් සියයට දහසයක්.ආහාර හා සනීපාරක්ෂාව හා රෝග වැලැක්වීම. ඒ සඳහා මිලියන තිහක් වෙන්කරලා තියෙනවා.රෝග නිවාරණ සඳහා මිලියන එකයි, ඩෙංගු සඳහා මිලියන දෙකයි,වසංගත රෝග සඳහා මිලියන දෙකක්, සම්පූර්ණ විෂය සඳහා මිලියන පහයි. නමුත් අපි වෙන්කරනවා මිලියන තිහක්. කාණු පිරිසිදු කිරීමට මිලියන පනස් අටක් වෙන්කරනවා. මැසි නාෂක තෙල් සඳහා ලක්ෂ හතක් මිලියන පනස්හතක් පරිපාලනය සඳහා හා කාණු පිරිසිදු කිරීම සඳහා වෙන්වෙන්නේ ලක්ෂ හතයි, මේ ගැන අවධානය

යොමු කරන්න කියලා මම කියනවා. පිටු අංක 49 ඉතා වැදගත් මාතෘකාවක් මාතෘ හා ළමා සායන සඳහා මිලියන දහතුනයි දශම පහයි. මාතෘ හා ළමා වෛද්‍ය සැපයුම් සඳහා තුන්ලක්ෂ පනස්දාහක් වෙන්කරනවා. ගර්භනී මව්වරුන්ට කිරි පැකට් ලබාදීම සඳහා ලක්ෂ හතක් වෙන්කරනවා. මිලියන දහතුනෙන් ගර්භනී මවුවරුන්ට මිලියනයක් පමණයි වෙන්කරලා තියෙන්නේ ඉතිරි මිලියන දොළහම පරිපාලන වියදම් සඳහා යොදවනවා. නගරාධිපතිතුමනි, එතනදි ලොකු ගැටලුවක් තියනවා. ඒ සඳහා වැඩිපුර අවධානය යොමු කරන්න කියලා. මාසයකට කිරි පැකට් සඳහා රුපියල් පනස්අටදහසක් පමණයි වෙන්කරලා තියෙන්නේ එම මුදල මසකට ප්‍රමාණවත් නැහැ. මාතෘ සායනයට මිලියන දහතුනයි, සුසාන භූමියට මිලියන විසිතුනක් වෙන්කරලා තියනවා. වැඩි අවධානය යොමු කරලා තියෙන්නේ සුසානභූමි සම්බන්ධව.වැඩි අවධායනක් යොමු කරලා තියෙන්නේ සෞඛ්‍ය සේවා සඳහා .මහජන උපයෝගීතා හා කාන්තා සංවර්ධනය සම්බන්ධව කතා කලොත් අයවැය කෙටුම්පතේ කාන්තා කියන වචනෙ සඳහන් වෙලා නැහැ. 2020 කෙටුම්පත විවාදයේදී ලිහිණි මන්ත්‍රීතුමිය යෝජනාවක් කලා කාන්තාවන් සඳහා කමිටුවක් කැදවන්න. කාන්තාවන් වෙනුවෙන් යම් කිසි මුදලක් වෙන්කරලා දෙන්න කියලා. ඔබතුමා පොරොන්දු වුණා.

මහජන උපයෝගිතා කමිටුවට කාන්තා කියන වචනය එකතු කරලා එතනදි අපි ක්‍රියා කරමු කියලා. 2021 වර්ෂයේදි කාන්තාවන් සම්බන්ධයෙන් මිලියන තුනක් වෙන්වෙනවා. 2022 එකයි දශම පහට බහිනවා. 2023ට රුපියලක්වත් නැහැ බිංදුවයි. මහජන උපයෝගිතා යටතේ ශීර්ෂ තියෙන්නේ තුනයි. වෙළද පොල මිලියන නමයයි දශම අටයි. වීථි ආලෝකකරණයට මිලියන විසිහතරයි දශම හයයි. ගිනි නිවීම අංශයට මිලියන දහඅටයි දශම අටයි. කාන්තාවන්ට බිංදුවයි. අපේ මන්ත්‍රීවරුන් අත්සන් කරලා ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරා.පලාත් පාලන සංසදයෙනුත් ඔබතුමාව දැනුවත් කරයි. අපිට මේකට විශේෂ කාන්තා කමිටුවක් දෙන්න කාන්තාවන් ගැන කතා කරන්න. බොහොම ස්තූතියි

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය ලේඛනයේ ඔබතුමා ඉදිරිපත් කරලා තිබ්බා වීදුරු ප්‍රතිචක්‍රිකරණය කරන මැෂින් එකක් ගේනවා කියලා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මැෂින් දෙකක්ම ගෙනල්ලා එම ක්‍රියාව හොඳින් කරගෙන යන නිසා. මේක තව වැඩිදියුණු කරන්න ශක්තිය ලැබෙන්න කියලා මම සුභ පතනවා.ඒ සියලු වැඩසටහන් වලට මගේ සහයෝගය දක්වනවා. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමත් එක්ක එකතුවෙලා මෙහෙවර නමින් ගෙවතුවගා ක්‍රමයක් ඇති කරා. ඒක කටුකුරුන්ද ප්‍රදේශයේ ක්‍රියාත්මක කරද්දි ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා පැහැදිලි කිරීම් කරද්දි මම සතුටු වුනා. පැල බෙදාදෙන අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂ සාමාජිකයෙක්ටත් මම පැල ලබාදුන්නා. ඒ පුද්ගලයා මට කිව්වා නගරාධිපතිතුමාට කියන්න කියලා, නගරාධිපතිතුමා කුණු වෙන්කරන්න කියලා ජනතාවට කියපු වෙලාවේ ඒ පුද්ගලයා නගරාධිපතිතුමාට දොස් පැවරුවා. ඒ වුනාට අද මම සමාව ඉල්ලනවා නගරාධිපතිතුමා එදා කල දෙය නිසා අපේ කුණු අරගෙන ඒවායින් පොහොර හදලා අපිටම ලබාදෙනවා. අපි ඒ පොහොර යොදා පැල වවනවා කියලා.
ගරු නගරාධිපතිතුමනි, කටුකුරුන්ද ප්‍රදේශයේ අවුරුදු තිහක් පුරාවට ප්‍රතිසංස්කරණය කරගැනීමට නොහැකි වූ පාරවල් ඔබතුමා ප්‍රතිසංස්කරණය කරලා දුන්නා. ජනතාවගේ ප්‍රසාදය තියෙනවා. කටුකුරුන්ද ප්‍රදේශයේ මාතෘ සායනයේ වැඩකටයුතු කරලා දෙනවා කියලා ඔබතුමා මට පොරොන්දු වුනා.එය කරලා දෙන්න කියලා ඉල්ලීම කරනවා. අපි කොවිඩ් වසංගත කාලයේ සිට ජනතාවට සේවය කලා. ඊලග මැතිවරණයේදීත් අපි ජයග්‍රහණය කරනවා. කටුකුරුන්ද ප්‍රදේශයට ඔබතුමා කල සේවය ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මැන්දිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වසර දහයක මහ නගර සභා ධූර කාලය තුලදී දසවෙනි අයවැයට සම්බන්ධවීම ගැන මම සතුටු වෙනවා.මේ වසර දහයතුලදී දකින්නට ලැබුණු ඉතාමත්ම දුර්වලම ඒවගේම සභා සේවකයන්ට වැටුප් ගෙවීමට පවා නොහැකි වන 2023 අයවැය ලේඛණය බව ද ප්‍රකාශ කරන්නේ ඉතාමත්ම කණගාටුවෙන්.මෙම අයවැය නගරාධිපතිතුමාගේ සමස්ත වසර

දහසයක ධූරකාල සීමාවේ පරිපාලනය කළමනාකරණයේ අසීමිත දූර්වලතාවයන් ඒවගේම මූල්‍ය සේවයේ ඒනිසාම ඇතිවුනු පරිහානිය වගේම ඉහවහා ගිය දූෂණය පෝෂණය කිරීමත් සමස්ථ ක්‍රියාවලියේ අසමත් බව මෙන්ම වත්මන් රජයේ ආර්ථික බංකොලොත් බව ද මෙම අයවැයෙන් ප්‍රකාශ වන බව ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කරනවා. ඒවගේම මුලින්ම ඔබතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වෙනවා කටුබැද්ද පොදු වෙළඳ සංකීර්ණය පිහිටි භූමියේ අභිනවයෙන් ඉදිකල නව සුපිරි වෙළඳ සංකීර්ණය මෙම වසර අවසානයට පෙර අභිනවයෙන් විවෘත කිරීමට බලාපොරොත්තු වෙනවා කියන එකත් එය සභාව සතු දේපලක් සභාව විසින් කරන ලද සංවර්ධනයක් ලෙස ඔබතුමාගේ ප්‍රකාශනයේ හුවාදැක්වීමත්. මම ඒ සම්බන්ධව ඔබතුමාට මතක් කරන්න කැමතියි. අපේ යහපාලන කාලය තුලදී ගරු හිටපු අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ ඉල්ලීම පරිදි හිටපු අමාත්‍ය ගරු පාඨලී චම්පික ගරු ඇමතිතුමාගේ අමාත්‍යංශ ප්‍රතිපාදන වෙන්කිරීම තුලින් සංවර්ධනය කලබව මතක් කිරිමට නොහැකි වීම සම්බන්ධව අපේකණගාටුව ප්‍රකාශ කරනවා.ඒවගේම යහපාලනය පටන්ගන්න පෙර අපි දැක්කා මේ මොරටුව නගරයේ මෝදර පාලම සිට බොරුපන මංසන්ධිය වෝටර් බෝඩ් එක දක්වා මේ නගරය තිබුනු තත්ත්වය කිසිදු සේනක දමයන්ත මන්ත්‍රීතුමත් මතක් කරා ගොඩනැගිල්ලක් මනුස්සයෙකුට දැකීමට හැකි අඩුමගානේ කොළම දිස්ත්‍රික්කයේ නගරයක් අපේ දකුණතින් පිහිටි පානදුර, පිළියන්දල, රත්මලාන, දෙහිවල දියුණු වෙනකොට මොරටුවේ තිබුණු ගරාවැටීමේ ස්වාභාවය යම් කිසි මට්ටමකට ඔපනංවපු කාලසීමාවක් හැටියට යහපාලන කාලය තුල ඒ කරපු සංවර්ධනය ඉහවහා ගියා බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.ඒවගේම නගරාධිපතිතුමා ඔබතුමාගේ අයවැය 2022 අයවැය දැකලා ඒ සම්බන්ධව එදා ප්‍රකාශ කල පරිදිම ඔබතුමා හුවාදැක්වුවා එදා මිලියන තුන්දහස් හාරසියක අයවැයක් මේ වසර සඳහා ඒ මිලියන තුන්දහස් හාරසිය මේ වෙනකොට එක්දහස් දෙසිය හැත්තතුනක් ගානකට අඩුවෙලා අකුලගෙන තියනවා. මේ මිලියන එක්දහස් දෙසිය හැත්තතුනක් ඔබතුමා පෙන්නලා තියෙන්නේ සභාව විසින් උත්පාදනය කරන ලද නැත්නම් උත්පාදනය කිරිම තුලින් අයවැයට එකතු කරන ලද ගණනයක්ද නත්නම් රජය විසින් සේවකයන්ට වේතන ගෙවිම සඳහා වෙන්කරන මූල්‍යමය ප්‍රතිපාදන මිලියන හයසිය තිස්දෙකත් එකතු කරලා මේ එක්දහස් දෙසිය හැත්තතුන රවුම් කරලා හදපු ෆිගරෙකක්ද කියන එක ඔබතුමා මට වැඩිය හොඳට පැහැදිලිව දන්නවා.රටේ තියන ආර්ථික බංකොලොත් බව නිසාවෙන්ම එන වසර තුලදී රජයේ ප්‍රතිපාදන නොලැබෙන තත්වයකට පත්වුනොත් මෙම අයවැයේ තියෙන ඉතාමත්ම කණගාටුදායක සභාව සම්බන්ධව ඔබතුමාට කියන්න ඕින නැහැ. සභාවේ සේවකයන් වේතන ගෙවන්න වෙන්නේ නැහැ. සුව ශක්තියෙන් අපිට ලැබෙන ආදායම මිලියන පන්සිය විසි එකයි. මේකත් අපි වටෙන් පිටෙන් හොයාගෙන එකට එක සම්බන්ධ කරල ගත් ඉලක්කම් ගේමක් කියන එකත් ප්‍රකාශ කරන්න ඕනෑ.මිලියන හයසිය තිස්දෙකයි මිලියන පන්සිය විසි එකයි වෙනස මිලියන එකසිය එකොලහයි.මිලියන එකසිය එකොලහක් කොහෙන්ද හොයාගන්නෙ කියලා මම ඔබතුමාගෙන් මුලින්ද අහන්න කැමතියි.මේ සම්බන්ධ පිටු අංක 10 අය ශීර්ෂ පන්දහස් පන්සිය එක ව්‍යාපෘතිය බැංකු ණය කැපිටල් ඉන්කම් එකක් හැටියට අපිට ලබාගන්න බලාපොරොත්තු වෙනවා බැංකුවෙන් බිලියන එකසිය විස්සක ණය ආධාරයක් ණය ආධාර සම්බන්ධව අපි කථා කළා 2015 වර්ෂයේ සිටම මේ පැත්ත දියුණු කරන්න. ඉස්සරහ නිවාස සංකීර්ණ හදන්න, කොම්පෝස්ට් අංගනය දියුණු කරන්න, කලාවේ උන්නතිය සඳහා ප්‍රේක්ෂකාගාරය ඉදිකරන්න, විශාල ණය ප්‍රමාණයක් රජයේ ආධාර අපි කතා කරා ගිය වසර සම්පූර්ණම සියලු කතා ශූනයක් බවට පත්වෙලා අපිට ලැබෙන ආධාර බිංදුවයි.ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කරනවා.තමුන්නාන්සේ ඒ බලාපොරොත්තුවම තබාගෙන එනවසරෙත් එකසිය විස්සක් කැපිටල් ඉන්කම්එකක් එකතු කරලා තියනවා.ඒ එකතු කිරීමත් සමග තමයි මේ ආදායම එක්දහස් දෙසිය හැත්තතුනක් වෙලා තියෙන්නෙ. මේකයි මේ තියන ලේඛණය අපි පුස්සක් කියන්නේ මේ ලේඛනය යථාර්තයක් වෙන්නේ නැහැ කියලා අපි කියන්නේ එකයි. මෙය හදලා අපි මෙතන සාකච්ඡා කළාට වැඩක් නැහැ, තමුන්නාන්සේට ඒ ඉලක්කම් ඇතුලේ ලබා ගන්නා වූ ඒ සංවර්ධනය යථාර්තයක් කරන්න නිශ්චිත වැඩපිළිවෙලක් නැත්තම් කියන එක සඳහන් කරන්න ඕනෑ. ඒ වගේම මෙහි වැඩි කිරීම සම්බන්ධව ඉලක්කම සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරනවා පිටු අංක 8ට වැඩසටහන් 3 සෞඛ්‍ය සේවා සඳහා යොමු කරනවා මෙහි සඳහන් වෙනවා 2023 සඳහා ආදායම මිලියන 42 2022 ආදායම මිලියන 32යි නමුත් අපි සපුර ගන්නේ මිලියන 2.2ක් කියන එක කියන්න ඕනෑ ඒ කියන්නේ 6% ආදායමක් තමයි අපිට ලැබිලා

තියෙන්නේ 2022 දී 9 වෙනි මාසේ 30 වෙනකොට එක ඒසේ තිබුබත් ඔබතුමා තවත් මිලියන 10ක් වැඩි කරලා 2023 වර්ෂයට. මෙවා ඇස් රවටන මිනිස්සු අන්දන වැඩ. ලබන වසරේවත් මේවා නවති කියලා අපි හිතනවා මේ වසරකට වසරක් සමපාතිව මුල්‍ය පාලනය ගෙන ගිය නැති එකේ විපාක ලෙස අපි දකිනවා. ඒ වගේම පිටු අංක 13 උසාවි දඩ ඔබතුමා බලාපොරොත්තු වෙනවා විශාල මුදලක් මිලියන 10ක් එහෙම කොහොමද ලබා ගන්නේ කියලා අපි අහනවා. එය අපිට නිශ්චිත වශයෙන් සාධක ඇතුව අපිට පෙන්වන්න පුළුවන්ද කියලා අපිට දැන ගන්න ඕනෑ. තවද වැඩසටහන් 6 මහජන උපයොගිතා යටතේ 2022 ආදායම මිලියන 26යි නමුත් ඔබතුමාට ලැබෙන්නේ මිලියන 7.6 යි එතකොට එතනත් විශාල ප්‍රමාණයක් වැඩි කරලා පෙන්නනවා. පිටු අංක 17 සේවා ගාස්තු ගිනි නිවීම යටතේ 2022 වර්ෂයට වඩා 2023 වර්ෂය සඳහා වැඩියෙන් මිලියන 13 බලාපොරොත්තු වෙනවා. මෙවා සම්බන්ධයෙන් අපිට පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඒ වගේම වැඩසටහන 8 ත් ඒ ආකාරයේම විශාල පසු බැසීමක් තිබෙනවා. මේ දේවල් ඔබතුමා සාර්ථක කරගන්න වැඩසටහන මේ සභාවට කියන්න කියලා ඉල්ලා සිටිනවා. මේ විශාල විෂමතාවයන් පිරි සංඛ්‍යා ලේඛනය යාථාර්තයක් නොවන ජනතාව විරුද්ධ වුන ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ සභාව ගිනි තිබ්බේ ඔබතුමාගේ නායකත්වය යටතේ තිබුන නිසා කියන එක ඔබතුමාට ඇති අප්‍රසාදය නිසා කියන එක කියන්න ඕනෑ.ස්තුතියි

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මම නියෝජනය කරන ලක්ෂපතිය දකුණ කොට්ඨාශයේ මන්ත්‍රීවරිය ලෙස වසර 5ක කාලය තුළ එහි සංවර්ධන කටයුතු කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන සියල්ලටම. ඒ වගේම කසල සම්පතකි කියන වදනට අර්ථයක් දෙමින් කසල වර්ගීකරණය කරමින් දිරන කසල කොම්පොස්ට් ලෙසත් සලසා සභාවට විශාල ආදායමක් ලබා දෙන තත්ත්වයකට පත් කොට තිබිමත් රට තුල උත්ගතවූ ඉන්ධන අර්බුදය මධ්‍යයේ වුවද සියලු සංවර්ධන කටුයතු කසල බැහැර කිරීම් අදී සියළු පොදු කටයුතු සිදුකිරීමට ඔබතුමා සමත් වුවා. තවද ඔබතුමාගේ වසර 15ක නගරාධිපති ධූරයේ පලපුරුද්දත් දැනුමත් මඟින් මොරටු ජනතාවගේ දුකේදී වගේම සැපේදීත් පොදු ව්‍යසන හමුවෙත් කරන්නා වූ සේවය අති විශාලයි. ඒ මඟින් මුලු මහත් ශ්‍රීලංකා දීපය තුල මොරටු මහා නගර සභාවට අති විශේෂ ස්ථානයක් ඔබතුමා විසින් ලබදීමට සමත් වී තිබෙනවා. එසේම රට තුල පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ මොරටුව ජනතාවගේ සුබ සාධක සේවා කටයුතු නොපිරිහෙලා ඉටු කීරීමට මෙවර 2023 වර්ෂය සඳහා අයවැයෙන් ඔබතුමා යෝජනා කර තිබෙනවා. ඒ සඳහා මගේ සහයෝගය ඔබතුමාට ප්‍රකශ කර සිටිනවා. එසෙම එළඹෙන්නාවූ නත්තල හා 2023 වර්ෂය ඔබසැමට සාමය සතුට සෞභාග්‍ය පිරී වාසනාවන්ත නව වසරක් වේවා යැයි පතමින් මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍රරංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පළමුව 2023 වර්ෂය සඳහා ඔබතුමා ඉදිරිපත් කරන අයවැය සඳහා මගේ විරුද්ධතාවය ප්‍රකාශ කරනවා. මොකද මා මෙම අයවැයට විරුද්ධ වන්නේ 2022 අයවැයට සාපේක්ෂව මේ අයවැයෙත් වෙනසක් සිදුවෙලා නැහැ, කලින් අයවැය මෙන්ම අංක විජ්ජාවක් පමණයි සිදුවෙලා තියෙන්නේ. තම සගයන්ටත්, හිතමිතුරන්ටත් තමයි මෙයින් සෙතක් වෙලා තියෙන්නේ ජනතාවට නෙවෙයි කියලා කියන්න කැමති. සමහර ආදායම් සහ වියදම් දිහා බලනකොට ඒවා හොයාගන්නවත් විදියක් නැහැ නගරාධිපතිතුමනි, 2022 වර්ෂයට ඇස්තමේන්තු කරලා තිබෙන මුදල මිලියන 70යි නමුත් 2022 වර්ෂයේ සැප්තැම්බර් මාසයට ලැබිලා තිබෙන සත්‍ය ආදායම ලක්ෂ 83ක් වැනි සුළු මුදලක් එයත් මම හිතන්නේ පළාත් සභාවෙන් ලැබුණ ආධාර ඒ නිසා මේ අයවැයට මාගේ විරෝධය ප්‍රකාශ කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන් මා 2023 වසරේ මොරටු ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අයවැයට මාගේ සුභ පැතුම් මෙසේ ඉදිරිපත් කරනවා. පසුගිය අවුරුදු හතර කාල සීමාව තුල හැරී බැලීමේදී එගොඩඋයන උතුර හා එගොඩඋයන මධ්‍යම කොට්ඨාශයන් වල ඉතා වටිනා වැඩ කොටසක් කල අතර ඉන් බිදක් මම කියන්නම්. මේ සියලුම පාරවල් අවුරුදු

තිස්පහක් තිස්සේ ප්‍රතිසංස්කරණය නොකරපු පාරවල්. එගොඩඋයන මහවත්ත පරස්පාර, රඹුක්කන හාර්ඩ්වෙයාර් එක පාර, එගොඩඋයන පීරිස් පාර ඇතුලු තවත් පාරවල් ගණනාවක් කුට්ටිගල් අල්ලා සැකසීමට හැකියාව ලැබුනා. ඒවගේම ජනතාවගේ ප්‍රසාදය පල කරමින් ඒ පාරවල් හදපු කොන්ත්‍රාත්කරුවන්ට හා සේවකයන්ට ගමේ ජනතාව තැගි ප්‍රධානය කලා. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා උපාධිධාරියෙකුත් නොවේ, නීතීඥයෙකුත් නොවේ.ආචාර්ය මහාචාර්යවරයෙකුත් නොවුනත් නමුත් ඒ සියල්ලම අභිබවමින් මොරටුවේ මුල් පුරවැසියා වෙනුවෙන් තිබෙන යහපත් දැක්ම හසල දැනුම මනා කලමනාකාරීත්වය හරිහැටි හසුරුවමින් පක්ෂ භේද නොතකා ගම සංවර්ධනය කරන්නට මන්ත්‍රීවරුන්ට විශාල වශයෙන් සහයෝගය දැක්විම ගැන ප්‍රශංසනීය ලෙස මාගේ ස්තූතිය පුද කරනවා. ආයතන කමිටුවේ සභාපති හැටියට මාහට කියන්න පුළුවන් එම කමිටුවට ඔබතුමා සහභාගි වෙමින් ගතයුතු තීන්දු තීරණ නිසි ලෙස ගනිමින් ආයතනයේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකල බවත් එයට යම් නිලධාරීන්ගේද සහයෝගය ලැබුණු බවත් මේ අවස්ථාවේදි කියන්න කැමතියි.විදුලි ඉංජිනේරුතුමා ඇතුලු අපේ කාර්ය මණ්ඩලය දවස් තුනක් හෝ හතරක් ඇතුලත විදුලි බල්බ සකස් කරදීම ගැන ස්තූතිය පුදකරනවා. කාණු සුද්ද කිරීමේ කටයුතු මංමාවත් සුද්ද කිරීමේ කටයුතු නිසි ආකාරයෙන් සිදුවන අතර, ඒ වෙනුවෙන් ප්‍රධාන සෞඛ්‍ය නිලධාරීතුමන් ඇතුලු සියලු නිලධාරින්ට හා සේවක මහතුන්ටත් මේ අවස්ථාවේදී මාගේ විශේෂ ස්තූතිය පුදකරනවා. ඔබතුමාට ආශිර්වාද කරමින් අයවැයට ජයවේවා කියමින් මා නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර ක්‍රීඩා පිටියේ තණකොළ මේ වෙනකොට අලංකාරව වර්ධනය වෙලා තියනවා. නමුත් වාහන ගාල් කිරිම නිසා තණකොල නාස්ති වෙනවා. ඒ ගැන සොයා බලා නිසි කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. කඩලාන ඩික්සන් පීරිස් ක්‍රීඩා පිටියේ උපකරණ වසර ගණනාවක් නිසි නඩත්තුවක් කර නොමැති නිසා ඒ ගැන කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු නිසි ආකාරයෙන් කර අවට වැසියන්ට පරිහරණය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලනවා. එගොඩඋයන ජයගත්පුර ක්‍රීඩාංගණයේ අඩුපාඩු සකස් කිරීමටත්, සොයිසාපුර ක්‍රීඩාපිටියේත් අඩුපාඩු සකස් කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. කේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අයවැයට කතාකරන්න අවස්ථාවක් ලබාදුන්න එක ගැන සතුටු වෙනවා. 2023 අයවැයේ විශේෂ දෙයක් තියනවා.කෝටි එකසිය දොලහයි විසිහය ලක්ෂයක් පුනරාවර්තන ආදයම් ලෙස වෙන්වෙලා තියෙනවා. එකසිය හත්කෝටි හැත්තඅටලක්ෂ පනස්තුන්දහස් ගාණක් වෙන්වෙලා තියනවා. මට මේකේ විශේෂත්වය තියෙන්නේ පුනරාවර්තන වියදම් ඇතුලේ මන්ත්‍රී දීමනාව, ඉන්ධන දීමනා, කමිටු දීමනාවන් ඇතුලත් වෙනවා.

අපි ජයග්‍රහණය කරවන පක්ෂයට ලැබෙන සියලුම වරප්‍රසාද මේකට විරුද්ධ වෙන පක්ෂයටත් ලැබෙනවා. ආණ්ඩු පක්ෂයේ හැමෝම මේකට අත උස්සනවා. විපක්ෂයේ අය විරුද්ධ වෙලා ඔවුන් යනවා. ඒ වුනාට සියලුම දෙනා එම වරප්‍රසාද විඳිනවා. මේක වෙනස් වෙන්න ඕනෑ. මොරටුවට ජනතා නියෝජිතයො විදියට පත්වෙල ආවනම් මොරටුවේ ජනතාවට යම්කිසි සේවයක් කරන්න. මේගොල්ලන් කරන්නේ පත්වෙන ආණ්ඩු පක්ෂය මොකක් හෝ වේවා.පක්ෂ වෙන හැම ඒකටම විපක්ෂ වෙනවා. ඡන්දයකින් පත්වුනානම් පාලක පක්ෂයට වරදින වෙලාවට විපක්ෂය එය නිවැරදි කල යුතුයි. කරන්නේ මේකට අකුල් හෙලන එක. හිටපු විපක්ෂ නායක කියනවා සෞඛ්‍ය වෙනුවෙන් මොනවද කරලා තියෙන්නේ කියලා. මෙතන එන කුණු ටික කරදියානට ගියානම් එම ටොන් ගානට ගෙව්වනම් ඒකෙන් හදාගන්න පුළුවන් ලාභය කොච්චරද කියලා. සභාවට නගරාධිපතිවරයෙක්ගේ දක්ෂතාවයෙන් කුමක් හෝ ආදායමක් ගේනවනම් ඒක සභාවට තියන ලාභයක්. ලුනාව කලපුවේ ඇවිදින මංතීරුවේ පාලම හදන්න ඔබතුමා මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන වෙන්කරලා එතනට පාලමක් දාලා. අද මොරටු ජනතාවට වටේ යන්න පුළුවන්. ඒවත් සභාවට ඇතිවන ලාභ තමයි. ඒවා ගැන කතා කරන්නේ නැහැ. නඩු ගාස්තු වලට

හැමෝම කැමති ඇති නඩු ගාස්තු වෙනුවෙන් හැමෝම ඇස්තමේන්තුවක් දාලා සභාව සතු දේපල කවුරුහරි කොල්ලකනවා නම්. බොහෝම අඩු වියදමට නීතීඥවරු ගෙනල්ලා. දැනටමත් කෝටි ගානක් කාටද ගෙවන්න වෙලා තියනවා. නියම පංතියේ නැති නීතිඥ මහත්තුරු ගත්තම නඩු පරදිනවා. හැබැයි අපේ කට්ටිය කැමතියි කෝටි ගනන් සභාවට පාඩු වෙනවට. වැඩිපුර මුදල් වියදම් කරලා සභාව සතු වත්කම් ආරක්ෂා කරගන්න පුලුවන් පරිපාලනයක් තියනවනම් ඒක තමයි නියම දක්ෂතාවය. නීතිඥමහත්මියලා හිටියට මේක ගැන වැඩිය හිතන්නේ නැහැ. පසුගිය කාලයේ අපි දැක්කා ආදාහනාගාර කොවිඩ් කාලයේදීත්,ඇතිවුනාවූ ඉන්ධන අර්බුදය උඩ ගත්තත් මොරටුව මහ නගර සභාව මොනම සභාවකටවත් දෙවනි වුනේ නැහැ.අපේ ආදාහනාගාරවල දොර වැහුනේ නැහැ. ඉන්ධන නැහැ කියලා අපේ ට්‍රැක්ටර් ගාල් කරලා තිබුනේ නැහැ.හැම පාරක් ගානෙම ගියා. විරී කුණු ගොඩවල් වලින් පිරුනේ නැහැ. ගෑස් ගණන් ගියාට ආදාහනාගාරවල ගණන් වැඩි කළේ නැහැ.මේ අයවැයට අදහස් දක්වන්න මාව පත්කල කුඩුවාමුල්ල ජනතාවට මම ස්තුති වන්ත වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහ නගර සභාව විශේෂයෙන්ම ජනතාවට උපතේ සිට මරණය දක්වාත් බොහොම සහ සම්බන්ධ වන ස්ථානයක්. මාතෘ ළමා චිකිත්සකාගාර සිට පෙර පාසල අධ්‍යාපයන ලබාදීම තුලින් උපතේ සිට මරණය දක්වා සහ සම්බන්ධ වන තැනක්. මේ අවස්ථාවේදී ජනතාවට නිතැතින්ම යම්කිසි ප්‍රශ්නයක් ගැටලුවක් ඇතිවන ඕනෑම අවස්ථාවක මොරටුව මහ නගර සභාව සම්බන්ධ වෙනවා. ඒනිසා ජනතාවට සේවය කිරීමේදී මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙස අපි ඉල්ලා සිටිනවා. ඒවගේම ඔබතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා සුපිරි වෙළඳසැල් ගැන. ඒවා තිබුනට වැඩක් නැහැ. එහි තිබෙන භාණ්ඩ අවශ්‍ය කරන දේවල් ජනතාවට ලබාගැනීම අවස්ථාව නැත්නම්. නගර සභාවේ සුපිරි වෙළඳසැල් වලට වඩා වැඩි දෙයක් පෞද්ගලික සුපිරි වෙළඳ සැල් වල තියෙනවා. නගර සභාවෙන් පාලනය වන සුපිරි වෙළඳසැල් වලට මීට වඩා වැඩි අවධානයක් ලබාදෙන්න ඕනෑ. දෙහිවල, ගල්කිස්ස, පානදුර, පිළියන්දල නගර සීඝ්‍ර වශයෙන් සංවර්ධනය වෙනවා. මොරටුව නගරයේ එවැනි දියුණුවක් අපි අත්දකින්නේ නැහැ. ඔබතුමාට වැඩි අවධානයක් ඒ පිළිබද යොමු කරන්න කියලා කියනවා. රවිනාත් මහතා නගරාධිපති වෙලා හිටපු කාලයේදී ඔහු රාජ්‍ය තාන්ත්‍රිකව සාකච්ජා කරලා ඒ තුලින් මොරටුවට විශාල ගොඩනැගිලි කීපයක් අපි ලබාගත්තා.ඒ තුලින් මොරටුවේ ජනතාවට සුවිශේෂී සේවාවක් සලසා දුන්නා. අපිට ඉදිරියේදී රාජ්‍ය තාන්ත්‍රික සහය ඇතුව මොරටුව නගරයට ගොඩනැගිලි ලබාගැනීමට මීට වඩා හොද වැඩපිළිවෙලක් ඉදිරිපත් කරන්න ඕනා.මොරටුව මහ නගර සභාව මගින් පාලනය වන ක්‍රීඩාංගණ වල්බිහිවී තිබෙනවා.මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. සෙනසුරාදා, ඉරිදා දිනවල ප්‍රදේශයේ තරුණ තරුණියන් ක්‍රීඩා කරනවා. අපි මුදල් අයකරනවා වගේම ඔවුන්ට විකට් කූරු වැනි දෑ ලබා දිය යුතුයි. මොරටුව නගර සභාවේ අභ්‍යන්තරය ගැන හිතන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. සේවකයන්ගේ ප්‍රශ්න, විවිධ සේවකයින් රාජකාරී වලින් බැහැරවෙලා යන ආකාරය, ඔවුන් පෞද්ගලික රැකියාවන් වල නියැලෙන ආකාරය පිළිබඳ මීට වැඩිය වැඩි අවධානයක් යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. නගර සභාවේ නිලධාරීන් සියලුදෙනා අපේ ප්‍රශ්න වලට සාවදානව ඇහුම්කන්දීලා ප්‍රශ්න විසදලා දෙනවා අපි ඒක අගය කරනවා.ඒවගේම ඔබතුමාගේ කාර්ය මණ්ඩලය, නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලය සුවිශේෂී සේවාවක් අපිට ලබා දෙනවා ඒ අතර සෞඛ්‍ය අංශය, විදුලි අධිකාරි අංශයේ සේවක පිරිස අපි විශේෂයෙන් මතක් කරනවා. මේ සියළු කරුණු වලට ඔබතුමා අවධානය යොමු කරලා මීට වඩා ඉදිරියට මෙ සභාව ගෙන යන්න අවශ්‍ය කරන සහයෝගය අප සියළු දෙනාගෙන්ම ඔබතුමාට ලැබෙනවා යැයි කියමින් සියළු දෙනාට සුබ නත්තලක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම කිසිම දේශපාලන පවුල් පසුබිමකින් තොරව ස්වාධීන පුද්ගලයෙක් හැටියට සිටිය මට ආරාධනා කරලා මාව මන්ත්‍රීවරයෙක් කළාටමම ඔබතුමාට

ස්තුතිවන්ත වෙනවා. ගරු නගරාධිපතිතුමනි, ආණ්ඩු පක්ෂයක් විපක්ෂයයි හැටියට අපි බෙදිලා සිදු කරන යම් කිසි විවාද වලට අපේ මත ඉදිරිපත් කරනවා. අපි මොරටුව මහා නගර සභාව විදිහට විපක්ෂයෙන් එල්ල වෙන්නාවු සාධනීය චෝදනා පිළිගෙන විපක්ෂය විසින් අපේ සාධනීය කටයුතු වලට සහයෝගය දෙනවනම් අපට ජනතාවට හොඳ දෙයක් කරන්න පුළුවන් වෙනවා. විශේෂයෙන්ම මළල ක්‍රීඩාව ගත්තොතින් ධාවන තරඟයක් ගැන ප්‍රතිවාදින් දෙදෙනා කරන අභියෝගය මත, වේගය මත තමයි ජයග්‍රාහනය තීරණය කරන්නේ. එම නිසා ශක්තිමත් විපක්ෂයක් ලෙස සහයෝගය ලබා දෙනවනම් මම හිතනවා අපේ කාර්ය උසස් මට්ටමින් පවත්වාගෙන යන්න පුළුවන් කියලාඅද නගර සභාවේ සමහර මන්ත්‍රීවරු කතා කරපු දේවල් අනුව බැලුවම මේ අයවැය කිසිම යථාර්තයක් නැහැ.අංකයක් විතරයි මේක පුස්සක් කියලා කතා කරා.මම කණගාටු වෙනවා විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමිය මේක පුස්සක් කියලා කිව්වට. එතුමිය යෝජනා කරපු රසායනාගාරය ඔබතුමා පිළිඅරගෙන අදවෙනකොටත් හොඳ තත්ත්වයක තියනවා. ඒක නිසා දේශපානය කොණයකින් බලන්නේ නැතුව හොඳ දේට හොඳයි කියන්න ඕනා. ඒවගේම අපේ සේනක මන්ත්‍රීතුමා සීතාවක හා කැස්බෑව ප්‍රාදේශීය සභාව ගැන කතා කරා. ලුනාව කලපුවේ මාසයකට අටවතාවක් පමණ මෝය කපන්න සිද්ද වුනා. මේකට ස්ථිර පිළිතුරක් ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමනි,උයන කොට්ඨාශයේ මාතෘ සායනයක් සහ පෙර පාසලක් නැහැ.දැනට උයන දකුණ සහ උතුර කොට්ඨාශ දෙකටම ප්‍රජාශාලාව තමයි තියෙන්නේ.මම ඔබතුමාට යෝජනා කරනවාපෙර පාසල් සහ මාතෘ සායනයක් ලබාදෙන්න කියලා.උයන 5, 6 සහ 7 වන පටුමග දුම්රිය මාර්ගයට බැවුම් වන විදියට තියෙන්නේ.වැසි කාලයට වතුර ගලා යන්න විදියක් නැහැ. අවට ඉන්න නිවැසියන් තාප්ප දාලා තමන්ගේ වත්තට වතුර ඉන්නෙ නැති විදියට සකසා තිබෙනවා. නමුත් පාරේ ගමන් කරන අයට ගමන් කරන්න විදියක් නැහැ. ඒකට මම යෝජනාවක් ඉදිරිපත් කරා. ඒ කාලයේ ඇමතිතුමන්ලාව සම්බන්ධ කරගෙන කටයුතු කරන්න ඔබතුමා ලොකු උත්සහයක් ගත්තා.ඒක කරන්න බැරිවුනා. ඒක නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරමින් කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා.විශේෂයෙන් ඔබතුමා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණයට උයන කොට්ඨාශයේ නාගරික මන්ත්‍රීවරයා වශයෙන් එකගතාවය පල කරන අතරම ලබන්නාවූ නත්තල හා නව වසර සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පුරෝගාමීත්වයේ නගරය තුල ඉතාමත් උජාරුවෙන් ජීවත්වෙච්ච ඒවගේම සෞභාග්‍යයෙන් ජීවත් වෙච්ච මොරටුවේ වඩුවා බිම්බත් වෙච්ච, ඒවගේම ධීවරයා හෙම්බත් වෙච්ච, අහිංසක පෙර පාසල් දරුවා හාමත්වෙච්ච ඒ අවිචාරමත් යුගයක තමයි මේ අපේ අයවැය ඉදිරිපත් වෙන්නේ ඒ හෙම්බත්වෙච්ච බිම්බත් කරපු හාමත්කරපු පරිපාලන දූර්වලතා ඒ ආණ්ඩුවේ තිබ්ච්ච වැඩකරන විරුවා කියන සංකල්පය වෙනුවට අපිව හෙම්බත් බිම්බත් හාමත් කරපු යුගයක් තුල තමයි අපට මේකට උත්තර හොයන්න වෙලා තියෙන්නේ. අපිව ආර්ථිකව, සාමාජීව හා මානසිකව මොරටුවේ ජනතාව වැටිලා තියෙන යුගයක තමයි මේ අයවැය ඉදිරිපත් කරන්නේ. ඍජුව සාමාජීය සුභ සාධන ප්‍රශ්න වලට අපට රජයක් විදියටත් නගර සභාවක් විදියටත් සමස්ත ආයතන විදියටත් කටයුතු කරන්න ඕනා යුගයක තමයි මේ අයවැයේ සමහරක් ප්‍රශ්න වලට උත්තර ලැබෙන්නේ පයබරවා යට පිටිකර බෙහෙත් බදින්නා සේමයි. මේ අයවැයත් පයබරවා අයට පිටිකර බෙහෙත් බදින්නා වගේ අයවැයක්. මේ අයවැය යථාර්ථයක් බවට පත්කරගැනීමට අප සාමුහිකව වැඩ කල යුතුය.මොරටුවේ තත්ත්වය ඉන්දියාව ආක්‍රමණය කරපු අක්බා රජ දැකපු හීනයක් වගේ. අක්බා රජතුමාගේ දත්ටික ඔක්කොම හැලිලා එක දතක් විතරක් ඉතිරි වෙලා තියනවා.අක්බා රජතුමා සිහින කැදවන්නන් කැදවලා හීනය ගැන විස්තර කියනවා.ඔහුට කියනවා ඔබතුමාගේ පාලනය කාලයේදී බිම්බත්වෙලා හෙම්බත් වෙලා ඔබතුමා විතරක් ඉතුරු වෙනවා කියලා.ඉන්පසුව සිහින තෝරන්නන් ඔක්කොම පන්නලා දානවා.සිහින තෝරන්නෙක් පුරෝහිතතුමා හමුවෙන්න ගිහිල්ලා කියනවා රජතුමා අපිව එලවා ගත්තා කියලා.පුරෝහිත කියනවා මම රජතුමා ලගට යන්නම්. මම ඔබට අඩගැහුවට පස්සේ ඔබ වෙස්වලාගෙන එන්න කියලා.පුරෝහිත රජතුමාට කියනවා මම දන්න සිහින තෝරන්නෙක් ඉන්නවා.එයාව ගෙන්නනන්ම් කියලා.අන්න එනවා.ඇවිල්ලා කියනවා.අර පුරෝහිතතුමා උගන්නපු විදියට

කියනවා, ඒ තමයි රජතුමනි මේ රටේ ඔක්කොම මියගියත් ඔබතුමා තමයි දීර්ඝායුෂ විඳින්නා කියන එක. අර එක දතක් ඉතිරිවෙන ඒකෙන් කියන්නෙ ඔබතුමා දීර්ඝායුෂ ලබනවා කියන එක. රටේ ජනතාව හෙම්බත්වෙලා, හාමත්වෙලා, බිම්බත් වෙලා, හිටියත් කමක් නැහැ. අර හීනෙ ඇත්ත වුනත් අළුත් විදියට කියනවා. රජතුමා හරි සතුටුයි. මගේ පාලන කාලය කොච්චර කාලයක් යනවද. මම තමයි වැඩිපුර රජ වෙන්නෙ. මගේ කට්ටිය තමයි වැඩිපුර නගරාධිපති වෙන්නෙ. ඒ වගේම මගේ ඇමතිවරු තමයි වැඩිපුර ඇමතිකම් කරන්නෙ. දීර්ඝායුෂ ලබනවා කියන එක විතරක් කියනවා. අද රටේ තත්ත්වයත් ඒකයි. ඒනිසා රටේ ප්‍රශ්නයට අපි උත්තර සපයන්න ඕන. අර මූලික වශයෙන් කරුණු කාරණා එක්ක ගොනු වෙලා තියනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, අපේ තියනවා පරමාර්ථ.නගර සභාවක් විදියට ගත්තම පරමාර්ථ වලට අපි අයවැයේ පෙන්නලා තියනවා. ඔබතුමාගේ නගරාධිපති ප්‍රකාශ තුලත් තියනවා. හැබැයි ඒ පරමාර්ථ කොහොමද කළමනාකරණ විද්‍යාවට අනුව අරමුණු බවට පත්කරගන්නේ.ඒ අරමුණු නිශ්චිතයි. කාලයක් තියනවා ලගා කරගන්න.පරමාරථ අරමුණු පවට පත්නොවන තාක්කල් අපට මේ කාරණා ඉෂ්ඨ කරගන්න බැරිවෙනවා. මේ අයවැය නැතත් අපට ආයතන වල තියන ව්‍යාපෘති නගර සභාවට කොච්චර දුරට සම්බන්ධ කරගන්න උත්සාහ කරලා තියනවාද? අපිට මතකයි 2015,2016 අවුරුද්දේ මහ නගර සභ අයවැය පරාජයට පත්කරා. හැබැයි අපට පුලුවන් වුනා අමාත්‍යාංශයේ ලාබ පෙරලා කටුබැද්ද් මාර්කට් ඒක අපගේ ඉල්ලීම පිට චම්පික ඇමතිතුමා කියලා හදවන්න. ඒවගේම ඉදිරිපෙල තියන පුරන්අප්පු චතුරස්රය හැදුවේ අප අයවැය පරද්දලා තියන වෙලාවක, කටුබැද්දේ ඇවිදින මංතීරුව හැදුවේ ඒ අයවැය පරාජය කරලා තියන වෙලාවක. ඒ නිසා හරියට කළමනාකරණ තීන්දුවකට ආවොත් මේ මොරටුව ජයග්‍රහණය කරා ගෙනියන්න පුලුවන්. විශේෂයෙන් අපේ අයවැය පරාජය වෙලා තියන වෙලාවක අමාත්‍යාංශයේ මුදල් වෙන්කරලා තමයි අපි ඉටුකලේ මේ සියල්ලන්ගේම සහාය ලැබුනා. අපි ඒක මතක් කරන්න ඕනා.මට කියන්න තියන විශේෂ දෙයක් තමයි.අපි අහලා තියනවා චෛතිය රජ්ජුරුවෝ ගැන. චෛතිය රජ්ජුරුවෝ පව මල්ලක්. ඒ නිසාම චෛතිය රජ්ජුරුවෝගෙ නංගි මේ නගර සභාවේ ඉන්නවා කියලා දැනගත්තේ අද. මොරටුවේ සංවර්ධනයක් වුනානම් එගොඩඋයන, කොරළවැල්ල අපි කරපු මෙහෙවර අපි දන්නවා.ඒ නිසා තමන් දාපු පලවන යෝජනාව මාතෘ සායනය හදන්න දාපු යෝජනාව කරගන්න බැරි කට්ටිය මොනරා නටනවා වගේ පිටුපස එලියේ දාගෙන කතා කරනවා. ඒ නිසා ලැජජයි, හිරිකිතයි කියන එක තමයි කියන්න තියෙන්නේ. අද මොරටුවේ වඩුවා හෙම්බත්වෙලා තියෙන්නේ. මේකට නිසි පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා, නගරාධිපතිතුමනි.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මිනිස්සුන්ට ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා ඔබතුමා මොනවත් කරේ නැහැ. ඇත්තටම ඔබතුමා මොනවත් කරේ නැහැ. ඔබතුමාගේ යටතේ මන්ත්‍රීවෙච්ච අපි කරේ.අද මම දේශපාලන වශයෙන් අපි අවුරුදු 5යි. අවුරුදු 25 හිටපු නාගරික මන්ත්‍රීවරු අපේ ප්‍රදේශයේ ඉන්නවා. අහන්න බලන්න කරපු දෙයක් තියෙනවාද කියලා.මේ අනුර අයියා මන්ත්‍රීවුනාට පස්සේ තමයි අනුර මන්ත්‍රීතුමා වුනේ. නමුත් ඒ වැදගත්කම අදටත් තියලා තියෙනවා ගමේ පාරවල් 23ක් මම හදලා තියෙනවා. සමහරු කියනවා ෆේල්ලු. කවුරුත් ෆෙල් නැහැ ඔබතුමාලා ෆේල් අපි ෆේල් නැහැ. නගරාධිපතිතුමනි, මම අභියෝගයක් කරනවා ස්වාධිනව ඡන්දය ඉල්ලලා පෙන්නනවා මගේ කොට්ඨාශයේ. මොකද ඒ තරමට අපි සංවර්ධනය කරලා තියෙනවා.අපි ඒවට භය නැහැ. කටුබැද්දේ මාකට් ගැන කිව්වා මාකට් ඒකේ කඩවල් කාටද දුන්නේ. යූඑන්පි මන්ත්‍රීවරුන්ට කඩ 4ක් දුන්නා. එයාගේ අම්මාට කඩ දෙකක් දුන්නා. තාත්තාට කඩ දෙකක් දුන්නා. අපි අද එහෙම කිසි දවසක කිසිම දෙයක් නාගරික මන්ත්‍රීවරුන්ට දිලා නැහැ. ඇත්තටම නගරාධිපතිතුමනි, අපි සුහදයි. අනෙක් ඒක නගරාධිපතිතුමනි, අපි මේ වසර 5ට නගර සභාවෙන් ලක්ෂ 15 විතර දීමනාවක් අරගෙන තියෙනවා. ඇත්තටම අපිට දුකයි කියන්න මේ ඉන්නවා අනෙක් මන්ත්‍රීවරු තරහාවෙන්න එපා. එයාලට එහෙම කරන්න බැරිවෙන්න ඇති. අපේ රවි මන්ත්‍රීතුමයි මමයි ඇත්තටම ඔබතුමා දන්නෙත් නැතිව ඇති රවිමන්ත්‍රීතුමා කරපු සේවය ගැන. ඇත්තටම නගරාධිපතිතුමනි දැනගන්න ඕනේ අපි මහජන මන්ත්‍රිකෙනෙක් වුනානම් ගමට සේවය කරන්න ආවානම් අපි සුදු ඇදුමක් අඳින්නේ අපේ පිරිසිදුභාවය පෙන්වන්න. ඔබතුමා දන්නෙත් නැතුව ඇති ඔබතුමා කොරෝනා සමයේ කරපු සේවයත් එක්ක ඔය කැබ් රථ දෙකත් ඔබතුමා හදලා මගේ

කොට්ඨාශයේ විතරක් මිනිස්සු 37 දෙනෙක්ව PCR කරන්න ගෙනිච්චා. ඒක අවස්ථාවක PCRඩ්‍රයිවර්ලාට යන්න බැහැ කිව්වා AC නැහැ කියලා මම AC එම වාහන දෙකේම හදලා දුන්නා මගේ අතින් රු 57000ක ද්‍රව්‍ය දාලා. අදත් ඔබතුමා දන්නේ නැහැ එය. මේතන ඇවිල්ලා මේ තවුසන් ටොක් දීලා මේ අරයාගේ හීන ගැන මේයාගේ හීන ගැන කියන්න දෙයක් නැහැ. තම තමන් පිරිසිදු වුනානම් තමන් අවංකව වුනාම හරි. කවුරුහරි හොරකම් කරනවානම් දැන් මේ කියනවා අල්ලස දූෂණය රජවෙලා කියලා.අල්ලස දූෂණය ගැන කථා කරනවා. අනේ මේ පොඩි දරුවෝද මේ අල්ලස් ගත්තානම් හෙට යන්න බ්‍රයිබරි එකට ගිහින් කියන්න මගෙන් අහවලා අල්ලස් ඉල්ලනවා දෙයි සල්ලි සිල් ගහලා අල්ල ගන්නකෝ. මේ නිකම් බබාලාවගේ දේශපාලනය නොදන්නවා වගේ කථාකරන්න එපා. හැමතිස්සේම මේ අල්ලස දූෂණය ගැන කථාකරනවා. අපේ මන්ත්‍රීවරු විතරක් නෙමෙයි ඕනම කෙනෙකුට අල්ලන්න පුලුවන්. මට කිව්වා මම කරේ නැහැ. එහෙම කියන්න ඕනේ නැහැ. යන්න අල්ලස් කොමිසමට නගරාධිපතිතුමනි අපි කියන්නේ ඇත්තටම අපි පිරිසිදුනම් දේශපාලනය පිරිසිදු කරන්න පුලුවන්. ඔබතුමා කිසිම කනෙකුට අපේ මන්ත්‍රීවරු කිසිම කෙනෙකුට කිසිම ප්‍රදානයක් කරලා නැහැ.අපිට ඇත්තටම පාරේ බැහැලැ යන්න පුලුවන්. නගරාධිපතිතමනි මේකට කවුරුහරි විරුද්ධ වෙනවානම් කියන්නේ මොරටුවේ මහජනතාවට විරුද්ධ වෙනවා කියන එකයි. අද ඇත්තටම අපි ගම්වල විරයෝ වගේ ඉන්නේ. මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා අපේ දූල්සිරි මහත්තයාට හා CPHI යසන්ත මහත්තයාට. මොකද අපේ කොට්ඨාශ වල තියෙන ඕනම දෙයක් ක්ෂණිකව කරලා දීලා අද ඔබතුමාගේ ගෞරවය සමග රැකගෙන ඉන්නවා. ඒවගේ නගරාධිපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මේකයි මේ දේශපාලනය තියෙන කුහකකම නැතිකරන්න.මේකට විරුද්ධවෙනවා කියන්නේ මුලු ගමටම විරුද්ධ වෙනවා කියන එක. මොරටුව මහජනතාවට විරුද්ධවෙනවා කියන ඒක. අර මන්ත්‍රීතුමා කිව්වා වගේ මෙහි තියෙන ඒවාට විරුද්ධවෙලා පස්සේ ගන්නවා.එහෙම එපා. මෙහි තියෙන්නේ අපිට නෙමෙයි මන්ත්‍රීවරු 48 දෙනාට.මෙහි තියෙන්නේ තනිකර ගමේ මිනිස්සුන්ට. ප්‍රශ්න ඔක්කොම විසදගෙන කරමු. අපි හිතමු මේක ඔයගෝල්ලෝ පරාජය කරා කියලා මේකේ ආනිසංශය කාටද ලැබෙන්නේ. අපිට නෙමෙයි මේ රටේ මොරටුවේ ජනතාවට ලැබෙන දෙයක් නැතිකරන්න යන්නේ. ඒනිසා අවසාන වශයෙන් නගරාධිපතිතුමනි මම අයවැයට පක්ෂපාති වෙනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අද වනවිට අපේ රටත් අපේ රටේ ජනතාවත් බරපතල අර්බුදයකට වැටිලා ඉන්න වේලාවක්. අපේ රටේ ජනතාව බරපතල ආර්ථික පීඩනයකට ඇද දමලා තියෙන වේලාවක ඒවගේම තමයි මුලු රටම බරපතල ප්‍රපාතයකට මේ දේශපාලනය විසින් ඇදලා දාලා තියෙන තත්වයක් ඇතුලේ තමයි ඔබ 2023මේ අයවැය වාර්තාව ඉදිරිපත් කරන්නේ. ඒවගේම තමයි අනෙක් පැත්තෙන් මේ වසරේ පෙබරවාරි මාසේ නිල වශයෙන් පවත්වන්න තිබුණ පළාත් පාලන මැතිවරණය වසරකින් දිර්ඝකරලා නැවත වටයකින් කුමන්ත්‍රණය කරමින් ඉන්නවා පළාත් පාලන මැතිවරණය නැවතත් කල් දමන්න.ඒහෙම තත්වයක් ඇතුලේ තමයි ඔබ මේ අයවැය ඉදිරිපත් කරන්නේ. අපි දැඩිව විශ්වාස කරනවා මේ ඔබ ඉදිරිපත් කරන අවසන් අයවැය. දැඩි විශ්වාසයෙන් කියන්නේ. ඒවගේම තමයි මේ ඉදිරිපත් කරන අයවැය ක්‍රියාත්මක කරන්න ඔබ ඔය පුටුවේ වාඩිවෙලා ඉන්නේ තව මාස කිහිපයයි.එකත් අපි දැඩි විශ්වාසයෙන් කියනවා.මේ අයවැය පිළිබදව කථාකරගෙන යනකොට මේ අයවැයේ කරුණු කාරණා එකින් ඒක අපි විග්‍රහ කරන කොට මගේ ඔළුවට ආව සරල විග්‍රහය හිතුවක්කාරි නගරාධිපතිගේ හිස් නගරාධිපතිගේ පුස් අයවැය පුස් කියන වචනය ආයිත් කියනවා මම.ඇයි ඒ මේ අයවැය නැවතත් ඔබ ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ සාම්ප්‍රදායික පොත් පිංචේ ඒක දිගුවක් ලෙස විතරයි.ඔබ දන්නවා අයවැයක් කියලා කියන්නේ ඒ නිශ්චිත අවුරුද්දේ දළ සැලැස්ම ඉලක්කය අපිට 2022 කරගන්න බැරිවෙච්ච කාරණා අපි කොහොමද 2023 කරගන්නේ. විශාල ඉලක්කම් ප්‍රමාණයක් තියෙනවා. ඇස්තමේන්තු විශාල ප්‍රමාණයක් තියෙනවා. හැබැයි ඒ ඒක ඇස්තමේන්තුවක්වත් අවසානේ බැලුවාම ඉලක්ක සම්පුර්ණකරගෙන නැහැ මේ අවුරුදු 4 ඇතුලත. ඒක තමයි ඇත්ත. ඒනිසා තව දුරටත් ඔබ සමත් පාලකයෙක් නෙමෙයි කියන එක තමයි මේ අයවැය වාර්තාවෙන් කියන්නේ. නමුත් අපි කරුණු කිහිපයක් අයවැය සම්බන්ධයෙන් ප්‍රකාශ කලයුතු නිසා ප්‍රකාශ කරනවා. දැන් ඔබ දන්නවා අපිට මේ සභාව පවත්වාගෙන යන්න ඉතාම මුලික අත්‍යාවශය කටයුත්ත තමයි අපේ සේවක සංඛ්‍යාව.

දැන් මේ ඔබ ඉදිරිපත් කරලා තියෙන වාර්තාවේ අපිට ඉන්නවා අනුමත සේවක සංඛ්‍යාව නිල වශයෙන් 960ක්. මම මේ කියන්නේ ඔබේ බොරුව මේ ලේඛනවල සාවද්‍යතාවය මට දන්න අංක ගණිතයට අනුව ඒකේම කියනවා දැනට ස්ථිර වෙලා ඉන්නවා 813ක්. ආයි කියනවා පුරප්පාඩු තියෙනවා 179ක්. දැන් මේ පුරප්පාඩු එක එන්න ඕනේ අපි විශ්වාස කරනවා මේ අනුමත සංඛ්‍යාව ඇතුලේ. එතකොට අපි නිකම් මේක එකතුකරලා බැලුවාම මේ 992ක් එනවා.එතකොට මේකේ සාවද්‍යතාවය ඉතාම පැහැදිලිව පෙනෙනවා. මේ ඉලක්කම්වත් ඔබ හරියට සම්පූර්ණ කරලා නැහැ කියලා. ඔබ කවුරුත් දන්නවා මේ සභාවේ සේවකයන් පිළිබඳව අපිට සේවකයන් පිළිබඳව ඇගයිමක් තියෙනවා. බොහොමයක් සේවකයෝ ඉතාම අවංකව ඉතාම හොඳ සේවයක් සලසනවා. මේකේ ඇතුලේ වෙන වෙන අයත් ඉන්නවා. හැබැයි සෞඛ්‍ය කම්කරු වැඩ ක්ෂේත්‍ර කම්කරු අපිට තියෙනවා 96ක පුරප්පාඩු. ඔබ හැමදාම කළේ මොකක්ද තමන්ට ඕන හිතවත්තු, දූවලා, පුතාලා, බෑනලා මේක ඇතුලට රිංගගෙන ඇත්ත තරුණයාට රැකියාව ලැබෙන්න තියෙන අවස්ථාව මේ ක්ෂේත්‍රයේ ඇත්තට කම්කරුවෝ වශයෙන් වැඩකරන්න පුලවන් ඒ තරුණයන්ගේ අවස්ථාව නැතිකරලා තියෙන්නේ. අපිට කාණුව සුද්දකරන්න ගියාම මිනිස්සු නැහැ. වැඩ ක්ෂේත්‍ර කම්කරුවෝ හොයන්න ගියාම මිනිස්සු නැහැ. හැබැයි ඔබ බඳවගන්නවා වෙන වෙන තැන් වලට මේ කම්කරු වැඩ ක්ෂේත්‍ර කම්කරු පාවිච්චි කරලා. ඒක අවසානයේ ඔබ දිගින් දිගටම මේ සභාවේ මහජන මුදල් වංචා කරලා තියෙනවා. ඒක එකක්. අපිට ඒවාටද අතඋස්සන්න කියන්නේ. ඔබ දිගින් දිගමට කියනවා කසල ප්‍රතිචක්තිකරන වැඩ සටහන අපි ඉතාම අගය කරනවා. පක්ෂයක් ලෙස අපි මුල සිටම හිටපු ස්ථාවරය කසල කළමනාකරනය කියන එක සභාවක අංක 1 කාර්යය. සභාව ආදායම් උපයන්න ඕනේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට පත්කරගන්න ඕනේ කසල කළමනාකරනය. ඒක අපි මුල ඉදලාම හිටපු ස්ථාවරය. ඒවා අපි ආදර්ශයන් විදියට පෙන්නපු ස්ථාන. ඒවායේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව මෙතන කථාකරන්නේ නැහැ. ඒක ජනතාවට භාරකරනවා. ජනතාව දන්නවා කසල කළමනාකරණය මොරටුවේ මේ වෙනකොට සාර්ථකද නැද්ද කියලා. ඒක අමුතුවෙන් අපි කියන්න යන්නේ නැහැ.ඒක ජනතාවට අපි භාරකරමු. ඒවගේම තමයි මම කියන්නේ ඔබ ඇත්තටම ඇස්තමේන්තුවේ ආදායම් විදියට පෙන්නනවා 2022 ලක්ෂ 200ක්. සැහැල්ලු කසල ඉවත් කිරිමේ ආදායම. ඔබේ ඒ ආදායම සත්‍ය ආදායම ඔබ පෙන්වන්නේ ලක්ෂ 61යි.ඒ කියන්නේ ඔබ සමත්වෙලා නැහැ ඒවා සපුරගන්න.ඒකත් ඔබ ෆේල්.ඊළගට බේල් අංශය ඉතාම හොඳයි. අපි හදවතින් සතුටු වුනා ඒවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරිම පිළිබඳව අපි කුහක නැහැ.අපිට මොන දේශපාලන විවේචන තිබ්බත් හොඳ කටයුත්තක් කරද්දි අපි ඒකට අතඋස්සනවා. ඒකට හොඳ කියනවා.හැබැයි අපි එහෙයියො නෙමෙයි.අපි විවෙචන කලයුතු තැන කෙලින් විවේචනය කරනවා.මේ බේල් අංශයේ ලක්ෂ 100ක් ඔබ වෙන්කරනවා ආදායම විදියට 2022. හැබැයි දැන් අවසාන කාර්තුව එන්නේ ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙත් සඳහන් කරනවා මිලියන 5.5ක් ආදායමක් උපදනවා කියලා. එකත් බොරු. මේකේ පෙන්නන්නේ ලක්ෂ 48යි.ඔබේ අංක ගණිතයත් පිළිබඳව අපිට බරපතල ප්‍රශ්නයක් තියෙනවා. ඒවටද අපිට අත උස්සන්න කියන්නේ. ඊළගට සෞඛ්‍ය ප්‍රධානම අපේ සභාවක ප්‍රධානම වගකිම ජනතාවගේ සෞඛ්‍ය. මොරටුව මහා නගර සභාවට තමයි තියෙන්නේ සෞඛ්‍ය නගාසිටුවිමේ මූලික වගකිම. ඔබ මේ ප්‍රාග්ධන වියදම් වලින් සෞඛ්‍යට වියදම් කරලා තියෙන්නේ කියද? 2022 ඔබ ඇස්තමේන්තු කරන්නේ 884000යි. හැබැයි වියදම්කරලා තියෙන්නේ මහත්තයෝ 17610යි. මේකද ඔබේ සෞඛ්‍ය ප්‍රතිපත්ති මේවාටද අපිට අත උස්සන්න කියන්නේ. අපි හොඳ දේට හොඳ කියනවා. ඒවගේම වැරදි දෙයක් දැක්කොත් වැරැද්ද පෙන්නනවා. ඒක ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්තිය. ඒනිසා අපි දිගින් දිගටම මෙවැනි කරුණු කාරණා ගොඩක් කියන්න යන්නේ නැහැ. මොකද ඔබ නැවත නැවතත් මේ අයවැය වාර්තාවෙනුත් ඉදිරිපත් කරලා තියෙන්නේ ඔබ ෆේල් කියන එක තමයි. සියයට 10ක් 15ක් හොඳ දේවල් කරලා සියයට අසූවක් අනූවක් නරක දේවල් සිද්ධවෙනකොට ඔබට පාස්කියන්න බැහැ.ඒනිසා ඔබ හොඳ දේවල් කරපු ඒවාට අපි අගය කරපුවා තියෙනවා.රසායනාගාරය ඉතාම හොඳ ව්‍යාපෘතියක්.අපි මැදහත් වෙච්ච එකක්.හැබැයි අපිට තාමත් ප්‍රශ්නයක් තියෙනවා ඒක මොනතරම් දුරට දියුණු කරගෙන මොරටුවේ ජනතාවට විශාල ලෙස ඒක භාවිතා කරන්න අවස්ථාව කොච්චර ලැබිලා තියෙනවාද කියන ප්‍රශ්නය අපිට තියෙනවා. ඒක තාමත් රේජිස්ටර් වෙලා නැහැ. අපි ඉතාමත් සත්භාවයෙන් මේවා ඉදිරිපත් කරපු කාරණා. හවසට මේ අයවැය මේ දෙපැත්තේ කණ්ඩායම අත උස්සනවා අපි දන්නවා. ඒ පැත්තේ කණ්ඩායමකුත් අත උස්සනවා. මේ පැත්තේ කණ්ඩායමකුත් අත උස්සනවා. හැබැයි

පාර්ලිමේන්තුවේ බොරුවට ස්වාධින වෙච්ච මිනිස්සුන්ව අන්දන මහත්තරුත් මිනිස්සුන්ව අන්දනවා කියලා අපි දන්නවා. ලැජ්ජයි අපි ඒගැන ඉතාම කණගාටුවෙනවා. මොකද එළියෙ සමන්ලාල්ට බැනලා ඇතුල්ලට ඇවිල්ලා සමන්ලාල්ගේ ඔක්කොටම අත උස්සන මහත්වරු නෙමෙයි ජනතා විමුක්ති පෙරමුණ. අපි ඍජුව විවේචනය කරනවා. අපි ජනතා විමුක්ති පෙරමුණ මේ අයවැයට විරුද්ධයි. අපි විශ්වාස කරනවා ඒළඹෙන පළාත් පාලන මැතිවරණය මේ රටේ ජනතාව සැබෑ වෙනසක් වෙනුවෙන් ඒ ජනතාව සූදානමින් ඉන්නවා. එළඹෙන ඕනැම මැතිවරණයකදි මේ දූෂිත දේශපාලනය වෙනස් කරන්න මේ ජනතාව වගේම මොරටුවේ ජනතාව සූදානමින් ඉන්නා බව ප්‍රකාශ කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. කුමාර රාජරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවට සහභාගිවීම මගේ දේශපාලන ජීවිතයේ පස්වෙනි අවස්ථාව. කොරලවැල්ල බටහිර ජනතාව වෙනුවෙන් සිදුකල ඒ සංවර්ධන වැඩ කටයුතු 2023 වර්ෂයේ සිදුකිරිමට හැකිවීම පිළිබඳව මා සතුටට පත්වෙනවා. පවතින දේශපාලන ආර්ථික හා සමාජීය අස්ථාවරභාවය හමුවේද පුරෝගාමීත්වයේ නගරයේ සංවර්ධන කටයුතු 2023 වර්ෂයේ සැලසුම් කර ක්‍රියාත්මක කිරිමට හැකිවේවායි මා මේ අවස්ථාවේදි ඔබතුමාට සුභපැතුම් එක්කරනවා.මා පෙර වසරේදිත් අයවැය කථාවේත් සඳහන් කරා නගරාධිපතිතුමනි අපි ගතික ස්භාවයෙන් යුක්තව අනාගතය සැලසුම්කල යුතුයි.විශේෂයෙන්ම අපි වෙනස්වන මේ ගෝලියකරනයට අනුව එන අභියෝගවලට ප්‍රශ්නවලට අපි මුහුණ දිය යුතුයි.විශේෂයෙන්ම අපි දන්නවා පහුගිය වසර දෙක පමණ කාලයක් අපිට කොරෝනා වසංගතයත් එක්ක මොරටුවේ ජනතාවට වගේම අපේ ප්‍රදේශවලටත් සංවර්ධන කටයුතු සියයට සියයක් සාර්ථකව කරගන්න හම්බවුනේ නැහැ.හැබැයි පොදුවේ සභාවක් විදියට අපෙන් වෙන්න ඕන කටයුතු නොපිරිහෙලා මොරටුව මහා නගර සභාවෙන් ඉෂ්ඨ සිද්ධකලා.ඒවා අපි පක්ෂයේ හිටියත් විපක්ෂයේ හිටියත් ඒවා අපි අගය කරන්නට ඕනේ.ඒවගේම තමයි මගේ සහෝදර නාගරික මන්ත්‍රිවරයෙක් වන ඔසඳ හර්ෂණ අබේකෝන් ගරු මන්ත්‍රිතුමා සඳහන් කලා සූර්ය පද්ධතියක් මේවෙනකොටවත් ක්‍රියාත්මක වෙන්න තිබුණු කාලයක් කියලා.විශේෂයෙන්ම පවතින මේ විදුලි අර්බුදයත් එක්ක ගරු නගරාධිපතිතුමනි එක පැත්තකින් අපි කැලි කසල පිළිබඳව අපි ආසියාවේම අපි යම්කිසි ස්ථානයක් ලබා ගත්තා.ඒවා නිසියාකාරයෙන් කලමනාකරණය කිරිම පිළිබඳව.හැබැයි අද එය විපක්ෂයේ බොහෝ අයට අමතකවෙලා තියෙනවා. හැබැයි ගරු නගරාධිපතිතුමනි සැලසුමක් තිබෙන නිසා තමයි මේ දේශපාලය අධිකාරිය නිලධාරින්ගේ දක්ෂතාවය නිසා තමයි මෙවන් වූ අවස්ථාවක් ලැබුනේ.හැබැයි යම් යම් තැන්වලදි ගරු නගරාධිපතිතුමනි මමත් දුක්වෙනවා ඒතමයි ඔසඳ ගරු මන්ත්‍රිතුමා කිව්වා වගේ ඇයි අපිට බැරිවුනේ මේ ඉදිරියේ තියෙන ඒ අභියෝගාත්මක දේවල් වලට ඇයි අපිට ඒවට උත්තර හොයන්න බැරිවුනේ .අපිට තිබුණා සෝලා සිස්ටම් අපි ගිය වසරේ සාකච්ඡාකරා නමුත් තාම අපි ඒකට ක්‍රියාත්මක වුනේ නැහැ.මම හිතනවා 2023 වර්ෂයේ හෝ අපි මේකට ක්‍රියාත්මක වෙයි කියලා.ඒවගේම තමයි අපිට මොරටුවේ ගොඩාක් සම්පත් තියෙනවා ගරු නගරාධිපතිතුමනි.මොරටුව ගැන බොහෝ අය කථාකරා. මොරටුවේ දක්ෂයන් ගැන වගේම මොරටුවේ තියෙන සිමිත සම්පත් ගැන කථාකරෝත් අපිට අසිමිතව ප්‍රයෝජනය ගන්න පුලුවන් සම්පත් ගොඩක් තියෙනවා.හැබැයි අදටත් සමහර තැන් තියෙනවා ගරු නගරාධිපතිතුමනි ප්‍රයෝජනයට අරගෙන නැහැ.හොදම උදාහරණය ලුනාවේ කලපුව.අපි ඇවිදින මන්ත්‍රිරුවක් හැදුවා. ඒක ලස්සන කරා.හැබැයි අපිට පුලුවන්නම් බෝට්ටු කිහිපයක් දාලා යම්කිසි ආදායම් මාර්ග ලබා ගන්න අපිට මුදල් උත්පාදනයක් කරන්න පුලුවන්.වෙළඳපොලේ අඩුපාඩු රාශියක් තියෙනවා.අපි 2023 වර්ෂයෙත් ඒ අඩුපාඩු හඳුනාගෙන සමහර වේලාවට පොඩි දෙයක් කරන්න තියෙන්නේ.ඒ දේවල් කරන්නට පුලුවන්නම් අපේ මේ මොරටුව නගර සභාව තව ලස්සනවෙයි.ගරු නගරාධිපතිතුමනි විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනේ අපි සියලුම සේවාවන් උපතේ සිට මරණය දක්වා සේවාවන් සපයන ආයතනයක්.අපි ගිය වසරේ සාකච්ඡාකලා මට මතකයි දුප්පත් මිනිස්සුන්ට මලගෙයක්වුනාම ලොකු පිරිවැයක් දරන්න වෙනවා.අද නගර සභාවේ කොඩි ටික ගහනවා,ලයිට් එක ගිහිල්ලා හයි කරනවා,කාණු සුද්ධකරනවා සියලු දේවල් කරනවා.හැබැයි අපි ඒකට තව දෙයක් එකතු කරනවා.ඒතමයි අපි මල් ශාලාවක් ආරම්භකරනවා කියන ඒක.හැබැයි නගරාධිපතිතුමනි මේවෙනකම් කරන්න

බැරිවුනා.දෙහිවල ගල්කිස්සේ සහෝදර නාගරික මන්ත්‍රීවරයෙක් මිනි පෙට්ටියක් බොහේම අඩු මුදලකට රු 2000කට වගේ අපතේ යන කාඩ් බෝඩ්වලින් 10000කට අඩු මුදලකට ඒ අවශ්‍ය කටයුතු කරන්න, කොරෝනා වසංගතය කාලේ කටයුතු කළා. අපිටත් පුළුවන්නම් ඒ දායක සම්පත් තියෙන අයව හඳුනගෙන ඔවුන් එක්ක සාකච්ඡාකරලා සභාවක් විදියට ජනතාව වෙනුවෙන් දෙයක් කරන්නට පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි, මා නියෝජනය කරන කොරලවැල්ල බටහිර කොට්ඨාශයේ විශාලම අර්බුදය, ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා ඒවගේම ෆැන්සිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා, අපේ ජයමාල් මන්ත්‍රීතුමා, මල්ලිකා මන්ත්‍රීතුමියත්, උජිත් කලේද්‍රා මන්ත්‍රීතුමා අපි සියලුදෙනා කණ්ඩායමක් විදියට සාකච්ඡා කරපු දෙයක් තමයි ගරු නගරාධිපතිතුමනි, වැසි ජලය නිසියාකාරව බැසයාම සඳහා යම්කිසි නිශ්චිත කටයුත්තක් කරන්න කියලා. හැබැයි ගරු නගරාධිපතිතුමනි, අපි සාකච්ඡා කලා නමුත් තාමත් අපිට ඒක කරගන්න බැරිවුනා. මම හිතනවා 2023 වර්ෂය බෝහොම තිරණාත්මක වර්ෂයක් බවට පත්වෙයි.අපිට කොයි තරම් ප්‍රශ්න ආවත් අභියෝග ආවත් ඒකට මුහුණ දෙන්න පුලුවන් ශක්තියක් ඇතිව අපි සභාවක් විදියට අපි මේදෙවල් කළොත් අපිට කවුරු මොන කතන්දර කිව්වත් මිනිස්සු තේරුම් ගනියි වැඩකරාද නැද්ද කියන ඒක.ගරු නගරාධිපතිතුමනි මේ තියෙන්නේ රටේ ජාතික තලයට යන අයවැයක් නෙමෙයි.මේ තියෙන්නේ පාර්ලිමේන්තුවෙන් හෙට දවසේ වෙන්නේ මොකක්ද කියලා බලාගෙන ඉන්න අයවැයක් නෙමෙයි.මේ තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි මොරටුවේ ජනතාවට හෙට දවසේ මොකක්ද වෙන්නේ කියන එක. හෙට කොරලවැල්ල බටහිර කොට්ඨාශයේ ජනතාවගේ පාර හදන්නේ කොහොමද කියන ඒක ගැන. ඒනිසා ගරු නගරාධිපතිතුමනි අපි ගමත් එක්ක මේ වේලාවේ වැඩ කරන්න ඕන වේලාවක්.මේ වේලාවේ ප්‍රශ්න වැඩියි. ඒනිසා මේ අයවැය ඔබතුමා සහ නිලධාරීන් එකතුවෙලා සැලසුම්කරපු ආකාරයට 2023 වර්ෂය සාර්ථකව කරගෙන යන්නට ශක්තිය ධෛර්ය ලැබේවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ශ්‍රූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මාගේ දේශපාලන ජීවිතයේ මා සහභාගිවෙන පස්වෙනි අයවැය අවස්ථාවයි. ඇත්තටම සතුටුවෙනවා අද දින මෙම අවස්ථාව මට ලැබීම සම්බන්ධව.මා නියෝජනය කරන්නේ ඵලදායිතා සහ මුදල් උත්පාදන කමිටුව. මගේ හිතවත් මන්ත්‍රී කුමාර රාජරත්න මහතා යෝජනාවක් කරා මම දැක්කා ලුනාව කලපුවේ හංස බෝට්ටු සේවයක් ඇති කරානම් හොදයි කියන ඒක. එතුමා සමහරවිට නොදන්නාවා ඇති අපේ රවි මන්ත්‍රීතුමා යෝජනාවක් කරලා තියෙනවා ඒ යෝජනාව අවසාන අදියරේ තියෙන්නේ .මම හිතන්නේ බෝහෝවිට එන වසරේදි අපිට පුලුවන් වෙයි ලුනාව කලපුවේ ඒ බෝට්ටු සේවාව ලුනාව කලපුවේදි ලබා දෙන්න. ඉතින් නගරාධිපතිතුමනි, අපිට දෝෂාරෝපන ටිකකුත් ආව නිසා මම හිතනවා කරපු හොද වැඩ ටිකකුත් කියලාම පටන්ගන්න ඒක හොදයි කියලා.ඇත්තටම අපි සතුටුවෙනවා මොරටු මහා නගර සභාව මගින් ඝන අපද්‍රව්‍ය කලමනාකරනය සාර්ථකව කරගෙන යැම සම්බන්ධව අපි ධනාත්මකව දකිනවා එය ඉතා හොදින් ක්‍රියාත්මක වෙනවා අපි නිරීක්ෂණය කරලා තියෙනවා. ඉතින් අපි ඇත්තටම අපේ සතුට ප්‍රකාශ කරනවා. ඒවගේම දරුවන්ගේ මන්ද පෝෂණය ගැන වැඩිපුර කථා කෙරුණා 2022 වර්ෂයේ ලක්ෂ 22ක් පෙර පාසල් ළමුන් සඳහා වෙන් කරලා තිබුණා. නමුත් මම හිතන්නේ මාස 10 පමණකාලයක් ඒ දරුවන්ටදිවා ආහාරය දෙන්න බැරිවුනා. නමුත් දැන් මම හිතන්නේ දිවා ආහාරය ලබා දෙන බව ආරංච්වුනා. දැන් ඒක ක්‍රියාත්මක වෙනවා. ඒගැන විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනේ.ඒවගේම කොවිඩ් සමය තුල මොරටු නගරයේ සිදුවූ මරණ වලදි නගරාධිපතිතුමනි මම හිතන්නේ කොවිඩ් මරණ 300ක් විතර නගර සභාවෙන් ඉටු කලා.මේ අයවැය ගැන කථා කළොත් සතුට ප්‍රකාශ කරන්න වෙනවා අනිවාර්යෙන්ම මේ අයවැය ප්‍රකාශය ගිය වසරවල තිබ්බ අයවැය ප්‍රකාශවලට වඩා මුද්‍රණ දෝෂ ඉංග්‍රිසි වචන සිංහල වචන ඒ දෝෂ අඩු අයවැය ප්‍රකාශයක් බව අනිවාර්යෙන් කියන්නට ඕනේ. ඒවගේම නගරාධිපතිතුමනි, ඊලගට කථාකරන්න තියෙන්නේ මෙතන තියෙන මේ අයවැය ප්‍රකාශනයේ ආදර්ශපාඨයන් තිබෙනවා මම මේක ඒ වර්ණයන් සහ ආදර්ශපාඨයන් එකතු කරලා තියෙනවා.මේකේ මම නිදසුනක් හැටියට ගන්නම් පරිපාලනයට එකතු කරලා තියෙන වර්ණය නිල්,විදුලියට අළු මේ දෙකම නිල් වෙන්නේ නැතිව අළුවෙන්නේ නැතිව 2023 වර්ෂයේ කරගෙන යැමට හැකියාව ලැබෙයි කියලා පාර්ථනා කරනවා. ඒවගේම මම විශේෂයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ නිසිකලට ප්‍රවාහන සේවාවක් ඊට ලබා දිලා තියෙන වර්ණය ලා දුඹුරු.

ගරු නගරාධිපතිතුමනි, මා දැක්කා මේ අයවැය වාර්තාවේ වාහන වලින් සභාව සතු වාහන 146න් 25ක්ම අකර්මන්‍ය තත්ත්වයේ තිබෙන්නේ.ඉතින් මේ යාන්ත්‍රික ඉංජිනේරු අංශය මීට වඩා කාර්යක්ෂම වෙලා. අපේ මේ වාහන වරිපනම් ගෙවන මොරටුව ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් සේවා සැපයීම කාර්යක්ෂම කිරීමට මීට වඩා වග බලා ගන්නවානම් වඩාත් සුදුසුයි. ඒනිසා ඒ ආදර්ශ පාඨයට සාධාරණයක් ඉෂ්ඨවෙන්න කටයුතු කරමු කියලා මා ඉල්ලනවා. ඒ ආදර්ශ පාඨයනම් නිසිකලට ප්‍රවාහන සේවාවන්. නගරාධිපතිතුමන්ගේ අයවැය ප්‍රකාශනයේ කටුබැද්ද පැරණි පොදු වෙළඳ සංකීර්ණය ගැන සඳහනක් තිබුණා. නගරාධිපතිතුමනි, මෙම වර්ෂය අවසානවීමට පෙර ජනතා අයිතියට  පැවරීමට සැලසුම්කර ඇතිබව දන්වා තිබෙනවා. සතුටුවෙනවා ඒවගේම මේ බොහෝම දුෂ්කර කාලයක් ගත කරා ඒහි වෙළෙන්දෝ කඩ හිමියන් මම දන්නවා මේක පවත්වාගෙන යැමේදි නගර සභාවට විශාල වියදමක් දැරීමට සිදුවෙනවා.ඔවුන් ඉතා අසීරුවෙන්මේ වෙන ස්ථානයටකට ගිහිල්ලා බෝහොම අමාරුවෙන් තමයි මේ වෙළඳ කටයුතු සිදුකළේ.ඔවුන් වෙනුවෙන් යම්කිසි සහන මුදලක් ලබා දෙන්න. මිලදී ගන්න අයගෙන් ඒ මුදල ලබා ගන්න. මේ වෙළඳුන්ට සහනයක් බොදෙමු කියලා  මම නගරාධිපතිතුමාගෙන් මේ අයවැය කථාවේදි ඉල්ලා සිටිනවා.එහෙනම් අපි ද සොයිසා ජත්‍යාන්තර ක්‍රිඩාංගනයට යමු. මම ක්‍රිඩා කමිටුවෙත් බෝහෝරැස්වීම් වලට සහභාගිවුන නිසා නගරාධිපතිතුමනි ද සොයිසා ක්‍රිඩාංගනයට නිසියාකාර මුදලක් සංවර්ධනය සඳහා වෙන්කරලා නැතිබව පිටුව 111 අනුව පෙනෙනවා.ද සොයිසා ක්‍රිඩාංගනයට නිසායාකාර මුදලක් සංවර්ධනය සඳහා වෙන්කර නැහැ.සියලුම ක්‍රිඩාංගනවලින් අපි අපේක්ෂිත ආදායම මිලියන 6.2යි.පිටුව 16 ද සොයිසා ක්‍රිඩාංගනය සංවර්ධනය සඳහා ශ්‍රිලංකා ක්‍රිකට් ආයතනයෙන්අපිට මුදල් ලැබිලා නැහැ.ද සොයිසා ජාත්‍යාන්තර ක්‍රිඩාංගනය සංවර්ධනය කර ගැනිමට. ඒනිසා ක්‍රිඩාංගනයේ නඩත්තු කටයුතු නිසියාකාරයෙන් සිදුවී නොමැතිබව මා පෞද්ගලිකව නිරික්ෂණය කිරීමෙන් දැනගන්න හැකිවුණා.ඉතින් මේ සොයිසා ක්‍රිඩාංගනය ගැන මීට වඩා හිතන්න වෙනවා.සාමාන්‍යයෙන් ක්‍රිකට් තරගයකදි ලබා ගන්නා මුදල මේවනවිට හැත්තදහස දක්වා වැඩි කර තිබෙනවා.ඒ මුදල වැඩි කියලා මා කියන්නේ නැහැ.ඒ මුදල් එකතු කර යම් සීමාවකට කටයුතු කර ගත හැකියි.පොඩි පොඩි අඩුපාඩු තියෙනවා.මම විසින් මේ සම්බන්ධව සොයා බැලූ අතර ක්‍රිඩා භූමියේ භාරකරුවන් විසින් නගර සභාව නගරාධිපතිතුමා නාගරික කොමසාරිස්තුමා නොමග යවා ඇතිබව මට පැහැදිලිව දැක ගන්නට ලැබුණා.පැතිවිකට්ටුවේ දැල් ආවරණ ගැලවී ඇත.ඉතා අනාරක්ෂිත බවක් දැකගන්නට ලැබුණා.ඒ සඳහා විශාල මුදලක් වැය වෙන්නේ නැහැ.ඉතා සුළු කාර්යයක් කරන්න තියෙන්නේ.කරුණාකර ඒ පැති විකට්ටුව ඒ දැල් ආවරණ සකසා දෙන්න.ඒවගේම ක්‍රිඩාංගනය භාරව කටයුතු කිරිමට සේවකයන් ප්‍රමාණය අඩුයි.ඒ සඳහා තරගයක් පැවැත්වෙද්දි නගරසභා සේවකයන් යොදවනවා. ඒ සඳහා යොදවනවා.ඒගොල්ලෝ යන්නේ තරගය පටන්ගත්තාට පස්සේ.ක්‍රිඩා භූමි භාරකරුවන්ගේප්‍රශ්නයක් තියෙනවා. හොයා බලන්න ඔවුන් සේවය හරියාකාරව සිදුකරනවාද කියලා.එළඹෙන නත්තල සහ ලබන්නාවූ 2023 වර්ෂය සාමය සතුට පිරි සුභ නත්තලක් සහ සුබ වර්ෂයක් වේවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී   -   පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මා සහභාගිවෙන 6 වෙනි අයවැය ලේඛනය. අයවැය කියන්නේ නගර සභාවට ලැබෙන ආදායම කොපමණද? වියදම කොපමණද? කියන එක තමයි අපි අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වෙන්නේ. ඇස්තමේන්තුගත ආදායම කොපමණද? ඇස්තමේන්තුගත වියදම කොපමණද ලෝකයේ ප්‍රථම වරට අයවැයක් ඉදිරිපත් කරලා තියෙන්නේ 1572 ඕලන්ද රාජයේ. නගරාධිපතිතුමනි, ඔබතුමාට බලය තියෙනවා අයවැය ලේඛනයේ මොකක්ද කරන්න ඕනෑ කියන ඒක තිරණය කරන්න. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මනුස්සයෙක් මැරුණාම ගෙනයන්න වාහනයක් යොදවන්න ඒක ගොඩක් වටිනවා මිනිස්සුන්ට. ඔබතුමා වසර 5ක් තිස්සේ අපේ පැත්තෙක් විශාල වැඩ කොටසක් කරලා තියෙනවා. මාර්ග ප්‍රතිසංස්කරණය කරලා තියෙනවා. කාණු පද්ධති හදලා තියෙනවා. මේ අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වෙන්නේ ඔබතුමා වෙනත් අයිතමයක් යටතේ හරි මේ මුදල් යොමු කරලා අඩුගානේ පරණ ඇම්බියුලන්ස් ඒකක්වත් ගන්න ක්‍රමයක් හදලා මල් ශාලාව කෙසේවෙතත් මරණය ප්‍රවාහන කිරිමට අවස්ථාවක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.ඒවගේම

ස්තුතිවන්ත වෙනවා දූල්සිරි මහත්තයාට, අපේ නාගරික කොමසාරිස්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයටත්.

<u>**මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි,පුරා වසර 5ක කාලයක් මෙම නගර සභාවේ සභිකවරයෙක් විදියට කටයුතු කල මම අද දින මේ ඉදිරිපත් කරන්නේ අපේ 5වෙනි අයවැය සහ ඔබතුමාගේ ධූරකාලයේ 15වෙනි අයවැය.මම කියනවා තවත් අසාර්ථක අයවැයක්.දැක්මක් නැති නායකයෙකුගේ තවත් අයවැයක්. ඇත්තටම නගරාධිපතිතුමනි ඔබතුමා සාදාචාරසම්පන්න නායකයෙක් නම් මම හිතන විදියට අද ඔබතුමා මේ අයවැය ඉදිරිපත් කලයුතු නැහැ.අපි දන්නවා මැයි 9 වෙනිදා මේ රටේ යම්කිසි සිදුවීමක් සිදුවුනා.ඔබතුමා මොරටුව ජනතාවට එදා කරපු අවමානය සුලුපටු එකක් නෙමෙයි.මිනිස්සු අද අපෙන් අහනවා මොරටුව නගරයේ ප්‍රධාන පුරවැසියා වීමට සමන්ලාල් හැර වෙන පුද්ගලයෙක් හිටියේ නැද්ද කියලා. මම ඔබතුමාට කියනවා ඔබතුමා මොරටුව ජනගහනය 179000ක් වන මිනිස්සුන්ට අවමානයක් කරා. එතනින් එහාට ගිහිල්ලා නගරාධිපතිතුමනි මැයි 9වෙනිදා ඇතිවෙච්ච කලබල හරහා මොරටුව නගර සභාවට ගිනි තිබ්බා. නගරාධිපතිතුමනි මේ නගර සභාව මම කියනවා ඔබගේ දෙවෙනි ගෙදර හා සමානයි කියලා. ඔබතුමාගේ දෙවෙනි ගෙදර හා සමාන වූ මේ මහා නගර සභාව ආරක්ෂා කරගැනිමට ඔබතුමාට නොහැකි වුනා.නගරාධිපතිතුමනි නගර සභාවට ගිනිතිබ්ම අපි කිසිසේත් අනුමත කරන්නේ නැහැ.නමුත් ඒ ගිනි තැබිම හරහා පිළිබිඹුවෙන්නේ මොරටුව ජනතාවට ඔබතුමා ගැන තියෙන පිළිකුල සහ වෛරය. ඔබ කොතරම් ප්‍රතික්ෂේපිත නගරාධිපතිවරයෙක්ද කියන්න ඊට වැඩිය වෙන සාක්ෂි නැහැ.ඉතින් නගරාධිපතිතුමනි ඔබතුමා සාදාචාරසම්පන්න නායකයෙක්නම් මම හිතන්නේ ඔබතුමා එදා මැයි 9වෙනිදා ඉල්ලා අස්වීමට තිබ්බා. නමුත් ඔබතුමා නිත්‍යානුකූලව පත්වුනාට මම අද කියනවා ඔබතුමාට කිසිම පිලිගැනිමක් නැහැ කියලා. මම කියන්නේ මේ රට අද ආර්ථික වශයෙන් ප්‍රපාතයට ලක්වීමට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ පොදුජන පෙරමුණ වගකිවයුතු වගේම අද මොරටුවේ වර්තමාන තත්වයට ඔබතුමා ප්‍රමුඛ ඒ වර්තමාන මන්ත්‍රීවරුන් කණ්ඩායම මොරටුවේ අගාදයට ඍජුවම වගකියන්න ඕනේ. අවුරුදු 15ක් වැනි ඔබතුමාගේ පාලන කාලය තුල මම ඔබතුමාට කියන්නම් බොරුපන ඉදන් එගොඩ උයන දක්වා කරපු එකදු සංවර්ධන ව්‍යාපෘතියක් කියන්න පුළුවන්ද ඒක මහා පරිමාන ව්‍යාපෘතියක් කියන්න පුළුවන්ද අද මොරටුව නගරය කොළඹ දිස්ත්‍රිකයේ දරිද්‍රතාවය අතරින් දෙවෙනි තැනට පත්වෙලා තියෙන නගරය මොරටුව නගරය. අද මොරටුව මිනිස්සුන්ට අවම වශයෙන් නිවාස 3000කවත් නිවාස ව්‍යපෘතියක් අවශ්‍යවෙලා තියෙනවා. ඔබතුමා පරිපාලනයේ හිටියා අවුරුදු 15ක් කරන්න බැරිවුනා. කොරලවැල්ල මොරටුවැල්ල ඒ මුහුදු තිරය අද කුඩු පාරාදිසයක්. මොකක්ද අද ඔබතුමා කරලා තියෙන්නේ. වඩුවා හැමදාම වලපල්ලට ලී බඩු විකුණගන්න වෙළඳපොලක් නැහැ. ධිවර කර්මාන්තය අනාථවෙලා කිසිදු ආදායම් උපදන දෙයක් ඔබතුමාගේ පාලන කාලයතුල වෙලා නැහැ. ඔබතුමා කියයි මට මේ සැම සියලු දෙයක්ම නගර සභාවේ කාර්ය පටිපාටියක් නෙමෙයි කියලා. නගර සභාවේ කාර්ය පටිපාටිය මංමාවත් සහ කාණු සුද්ධ කිරිම නම් මම ඔබතුමාට කියනවා ඔබතුමා ඒදේ හරියට කරලත් නැහැ.කුණු සුද්ධ කිරිමටත් දේශපාලනය. මැයි 9වෙනිදායි පස්සේ මොරටුව ප්‍රදේශයේ කීදෙනෙක්ගේ කුණු සුද්ධකරන්නේ නැතිව ඔබතුමා කිදෙනෙක්ගෙන් පලිගත්තාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි. මොරටුව ජන සණත්වය ගැන මම හිතන්නේ ඔබතුමාට කිසිදු අවබෝධයක් නැහැ. මොරටුව ඉඩම් ගැන ගත්තෝත් ඉඩම් කුඩා කැලි කැලි වලට කඩලා පර්චස් තුනේ හතරේ පහේ කැලි වලට ඉඩම් පාස් කරලා.මම කියනවා ඔබතුමාගේ නඩු හරහා නගර සභාවට වෙලා තියෙන පාඩුව මිලියන 3.2 වෙච්ච නඩු වියදම මිලියන 7.5 දක්වා වැඩිකරලා තියෙනවා. අනවසර ඉදිකිරීම් ඉවත් නොකිරිමට ඔබතුමා කටයුතු කරලා තියෙනවා. අඩුම වශයෙන් නගර සභාවක නගරාධිපතිවරයෙක් විදියට කරන නොකලයුතු ක්‍රියාකාරකම් කොපමණ කරලා තියෙනවාද. නගරාධිපතිතුමනි කුණු ව්‍යාපෘතිය ගැන ඔබතුමා කථාකරනවා. ඔබතුමාගේ කුණු ව්‍යාපෘතියක් ෆේල් කියලා මම ඔබතුමාට කියනවා.අවුරුදු 15ක් පාලනය කරේ දැක්මක් නැති නායකයෙක්. 2022 ඔබතුමා අයවැය ඉදිරිපත් කරනකොට මම පුනපුනා කිව්වා බිලියන 3.4 ක අයවැයක් කොහොමද ඔබතුමා සාක්ෂාත් කරන්නේ කියලා. කොරෝනා සමයක ආර්ථික අවපාතයක් තියෙන අවස්ථාවක කොහොමද බිලියන 3.40ක අයවැයක් කරන්නේ කියලා. බිලියන 2.3ක ප්‍රාග්ධන ආදායමක් ඔබතුමා ඉදිරිපත් කරා. නමුත් අද

මෙවර අයවැය ඔබතුමා අඩුකරලා තියෙනවා බිලියන 1.2 කට. එතකොට එදා 3.4ක් වෙන්නත් අද 1.2 වෙන්නත් අඩුකිරීමට ඔබතුමාගේ දැක්ම මොකක්ද කියලා ඒ දේ සම්බන්ධයෙන් අයවැය ගණය කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට අත්දැකීමක් නැහැ කියලා පෙනවා. එතනින් එහාට ගිහිල්ලා නගරාධිපතිතුමනි පුනරාවර්තන ආදායම දිහා බලන්න 2022 පුනරාවර්තන ආදායමට වැඩිය 2023 පුනරාවර්තන ආදායම වැඩිවෙලා වියදමත් වැඩිවෙලා.නගරාධිපතිතුමනි මේ අයවැය අපි ඉදිරිපත් කරන්නේ රට ආර්ථික වශයෙන් අවපාතයට ලක්වෙලා තියෙන අවස්ථාවක. ඒවැනි අවස්ථාවකදි මේවගේ සම්ප්‍රදායික අයවැයක් ඉදිරිපත් කිරීමද නැත්නම් රටේ පවතින ප්‍රශ්ණවලට නගරසභාවක් හැටියට සාධනියව කටයුතු කරලා මොකද අපේ මේ නගරසභාවේ තියෙන වියදම් අඩු කරන්නේ කප්පාදු කරන්නේ කියන දේ නෙවෙයිද ඔබතුමා අයවැය හරහා කලයුත්තේ.අයවැය කියන්නේ අය සහ වැය. මේකේ අය වැඩිවෙනවා.අය වැඩිවෙන්නේත් නැහැ වැයත් එන්න එන්න වැඩිවෙනවා.එතකොට මේ අයවැය හරහා මොරටුවේ තියෙන ප්‍රශ්න තවත් වැඩිවෙනවා කියන එකයි මම කියන්නේ.මෙතනින් එහාට ගිහිල්ලා මේකට හොදම උදාහරණය පුණරාවර්තන ආදායම බිලියන 1.0සිට බිලියන 1.1 දක්වා පුණරාවර්තන ආදායම සහ වියදම වැඩිවෙලා තියෙනවා. නගරාධිපතිතුමනි මම අහන්න කැමතියි ප්‍රාදේශිය වශයෙන් අපි වියදම් කප්පාදු කිරීමට මේ නගර සභාව තුල සාධනිය පියවර ගතයුතු නැද්ද? නගර සභාවතුල සිදුවන දූෂනය නාස්තිය වංචාව ආකාර්යක්ෂමතාවය තුරන් කිරීමට ඔබතුමා ක්‍රියාකලයුතු නැද්ද? තාක්ෂණය හරහා වැඩකිරීම ඔබතුමා ඉදිරිපත්කලයුතු නැද්ද? සමාජිය ගැටලුවලට විසදුම් ඉදිරිපත්කලයුතු නැද්ද? එතනින් එහාට ගිහිල්ලා නගරාධිපතිතුමනි මම කියනවා මේ නගර සභාවේ දැන් සේවකයෝ 966ක් ඉන්නවා.ඔබතුමන්ලා කියයි කාඩර් එක හරහා මේ සේවක පුරප්පාඩු තියෙනවා කියලා. නමුත් දැක්මක් තියෙන නායකයෙක් නම් කල්පනා කරනවා මේ සේවකයෝ 966ම අවශ්‍යද නැත්නම් තාක්ෂණය උපයෝගිකරගෙන කොහොමද මීට වැඩිය එෆිෂන්ට් ප්‍රොසෙස් එකක් කරන්නේ කියලා. කොපමණ වරිපනම් සංඛ්‍යාවක් ඔබතුමාගේ විගණන වාර්තාවේ තියෙනවා. වරිපනම් හිගය මිලියන 257යි. පනස්දාහා ඉක්මවූ වරිපනම් එකක 361ක රුමිලියන 91ක් එකතු කරලා නැහැ. එතනින් එහාට ගිහිල්ලා ඔබතුමාගේ පරිපාලන දූර්වලතාගැන කථාකරනවානම් ලිඛිත සාක්ෂි නොමැති ගිණුම් ගණනාවක් මේකේ තියෙනවා.වත්කම් එකතු කරපු නැති කොපමණ වරිපනම් සංඛ්‍යාවක් එකතු කරලා නැද්ද ඔබතුමාගේ විගණන වාර්තාවේ තියෙනවා. එතනින් එහාට ගිහිල්ලා ඔබතුමාගේ පරිපාලන දූර්වලතා ගැන කථාකරනවානම් ලිඛිත සාක්ෂි නොමැති ගිණුම් ගණනාවක් මේකේ තියෙනවා. වත්කම් එකතු කරපු නැති ගණනාවකත් තියෙනවා. හැම මාසේම අධිභාරය ගෙවනවා. එතනින් එහාට ගිහිල්ලා වැටුප් ප්‍රතිපූර්ණය කරන්නේ නැහැ. කාඩරයෙන් පිට මිනිස්සුන්ව ගන්නවා.ඔබතුමාගේ පරිපාලනය නගරාධිපතිතුමනි මේ නගර සභාවේ තියෙන සම්පූර්ණ අකාර්යක්ෂමතාවය මේ විගණන වාර්තාවේ තියෙනවා.එතකොට ඔබතුමා අයවැය ඉදිරිපත් කරනකොට විගණන වාර්තාව හරහා දෙන දෙවල් සම්බන්ධයෙන් සාධනියව කරුණු සාකච්ඡාකරලා ඒවා නෙමෙයිද අයවැය හරහා ඉදිරිපත් කරන්න ඕනේ.මේ අයවැය කියන්නේ සම්පදායික හුදු ලේඛනයක්. මේක අර ගිය අවුරුද්දේ සංඛ්‍යාලේඛන අරගෙන එහාට මෙහාට කරලා නිකම් බොරුවට ලේඛනයක් දිලා තියෙනවා.මේවා වලින් මොරටුවේ නගරයේ තියෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේත් නැහැ.මම නගරාධිපතිතුමනි මම ඔබතුමාට කියනවා අයවැයක් කියන්නේ දැක්මක්.ඉලක්කයක් නමුත් මේ ලේඛනය කිසිදු පදනමක් නැහැ. මෙතන ඒ අයවැය අවුරුද 5ටම මම කියනවා ඒ අයවැය ඔක්කෝම ෆේල් කියලා.ඔබතුමා අසාර්ථක පාලකයෙක් කිසිම සාර්ථකත්වයක් නැහැ.නගරාධිපතිතුමනි අර්බුද ඇතිකරපු මිනිස්සු කවදාවත් අර්බුදවලට විසදුම් දෙන්නේ නැහැ.නගරාධිපතිතුමනි මම කියනවා පොදුජන පෙරමුණ කියන පක්ෂය ශ්‍රී ලංකාව විනාශකරා වගේම මොරටුව නගරය විනාශකිරීමටත් ඔබතුමාගේ අදූරදර්ශි පාලනය හේතුවෙන් වෙලා තියෙනවා කියලා.නගරාධිපතිතුමනි මේ මොරටුව ගොඩනැගීමට අවංක පාලකයෙක් අවශ්‍යයි.තාක්ෂණය මත පදනම් වෙච්ච අවංකත්වය මත පදනම් වෙච්ච පුද්ගලයෙක් ඔය පුටුවේ ඉදගන්න ඕනේ.කොන්දක් කෙලින් තියෙන දූෂණය වංචාව පිටුදකින පුලුවන් පගා ගන්නේ නැති කොමිස් ගන්නේ නැති නාගරික මන්ත්‍රිවරුන්ට කෙලින් ඉන්න පුලුවන් පුද්ගලයෙක් ඔය පුටුවේ ඉදගන්න ඕනේ.රටේ දූෂණය හොදට විරාජ මානව පේනවා. මොරටුව නගර සභාවෙන් ඇත්තට අපි කණගාටුවෙනවා සභිකයෝ හැටියට රටේ ඉරණම මොරටුව නගර සභාවෙන් පෙනවා. ඉතින් මම කියන්නේ සමන්ලාල් ප්‍රනාන්දුගේ පරිච්ඡේදය අවසන් විය යුතුයි.

**මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම නියෝජනය කරන්නේ කටුබැද්ද දකුණ කොට්ඨාශය. අපි වැඩ කරලා තියෙනවා ඒ නිසා කටුබැද්ද නම් මගෙන් ගන්න බැහැ, මෝල පාරේ විජේසිංහ මාවතේ මේ මැතකදී පාරක් කළා වතුර බහින්නේ නැති. 2021 මීට මෙහා තිබුණ අවුරුදු 40ක් පමණ අඩි 3ක පාරක ගිය මිනිසුන්ට අඩි 12 පාරක් හදලා දීලා නගර සභාවෙන් ලක්ෂ තිස්ගානක් වියදම් කළා, ඒවා ලොකු දේවල්, ඒ වගේ ගොඩක් සංවර්ධන කටයුතු කළා. මිනිස්සු මටත්, නගරාධිපතිතුමාටත්, ගොඩක් ස්තූතියි කළා. දන්දෙණිය වත්තේ හම්පර් හතරක් දාලා දුන්නා, ඒ ගෞරවය ඔබතුමාට තියෙනවා. ඊයේ මම නගරාධිපතිතුමාව හමුවෙන්න ගිය අවස්ථාවේ එතුමා හිටියේ බේල් එකේ, එතකොට බේල් එකේ බඩු බානවා මම බලන් හිටියා. එතන නගරාධිපතිතුමා යෝගට් කෝප්ප ඇදලා ගත්තා, පස්සේ බඩු ඔක්කොම හලලා නගරාධිපතිතුමත් එහි කුණු තේරුවා. එහෙම කැක්කුමකින් වැඩකරන කෙනෙක් තමයි ඔබතුමා, මෙහෙම නගරාධිපතිවරයෙක් මම දැකලා නැහැ. වැඩ කරන කෙනාට තමයි බනින්නේ, පිඟන් කැඩෙන්නේ පිඟන් හෝදන මිනිහා අතින්නේ. පෙර පාසල් සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමිය කතා කළා. අපි ගියා ජනතාවට සේවය කරන පෙර පාසලකට හොඳ උගත් ගුරුවරු දෙන්නෙක් හිටියා. කන්න බොන්න දුන්නා, ඒත් ළමයි හිටියේ ඒ පෙර පාසට තුන්දෙනයි. මොකද අම්මා කරන්නේ සල්ලි නැති වුනත් ගාන වැඩියෙන් දීලා යවන පෙර පාසල් වලට ළමයි දාන්නේ, නගර සභාවේ මුදල් නොගෙවා යන්න පුළුවන් පෙර පාසල් වලට ළමයි දාන්නේ නැහැ. මන්ත්‍රීතුමිය, පුළුවන්නම් ගිහින් මේ පෙර පාසල් වලට ළමයි ටිකක් හොයලා දෙන්න නගරාධිපතිතුමා කරන්න පුළුවන් දේවල් කරලා තියෙන්නේ. තිසර මන්ත්‍රීතුමා කිව්වා කටුබැදද්ද වෙළඳපොළ සම්බන්ධයෙන් මම මේ ලඟදී ගියා කටුබැද්ද පොළට එතකොට මිනිස්සු කතා කරද්දි මම මිනිස්සුන්ට කිව්වා මෙය කළේ පාඨලි චම්පික මැතිතුමා මෙහි කාටවත් කඩ කරන්න බැහැ මේවා හදලා තියෙන විදිහ වැරදි. මේවා ඔබතුමා කරපුවා නෙවෙයි යහපාලන අණ්ඩුවෙන් කරපු දේවල්. මේ ලබන්නා වූ නව වසර සුබ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරන ගමන් මගේ කතාව අවසන් කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මොරටු ජනතාවට ඉතාම වැදගත් වෙන ලියවිල්ල ඉදිරිපත් වෙන මේ අවස්ථාවේ. එයට එකඟතාවය දක්වන්න පුළුවන් අවස්ථාවක් තියෙනවද කියලා බැලුවා. තැන් දෙක තුනක් හැරෙන්න මෙහි සෑහීමකට පත්වෙන්න බැහැ මට පෞද්ගලිකව. මෙහි සංඛ්‍යා දත්ත සම්බන්ධයෙන් තමයි මට ගැටළුව තිබෙන්නේ. ගරු නගරාධිපතිතුමනි, සමහර අවස්ථා වල ඔබතුමා අයවැයෙන් වෙන් කරනවා වියදම් කරන්නේ නැහැ, සමහර වේලාවට අඩුවෙන් ලැබෙන තැන්වලට ඔබතුමා බජට් කරනවා වැඩියෙන්. වැඩියෙන් ලැබෙන තැන්වලට අඩු කරනවා. මම විශ්වාස කරන තරමින් ඔබතුමා බොහොම ප්‍රයෝගික දේශපාලඥයෙක් ඒ මට්ටමේ ඉඳලා ඔබතුමාට මෙය මීට වඩා හරවත්ව කරන්න තිබුණා. ගරු නගරාධිපතිතුමනි, ඉතිහාසය වෙනස් කරන්න අපිට බැහැ කොහොම වුනත් ඔබතුමාගේ පක්ෂයට මම එකඟ නැති වුනත් අපේ කෙනෙක් විදිහට ඔබතුමාගේ දේ, අවුරුදු පහළවක්ම ඔබතුමාට අයවැය ඉදිරිපත් කරන්න ලැබීම ගැන මාගේ සතුට ප්‍රකාශ කරනවා. ඒ වගේම මගේ ගමේ කෙනෙක්ට උපකාරයක් අවශ්‍ය වූ අවස්ථාවක ඔබතුමාට දුරකථන ඇමතුමකින් උපකාරයක් ඉල්ලුවත් ඔබතුමා එය කරලා දෙනවා. ඒ වගේමයි උප නගරාධිපතිතුමා කවදාවත් මඟහැරියේ නැහැ. ඒ වගේම සෞඛ්‍ය අංශය හැර අනෙක් සියලු අංශයන්ගෙන්ද කළ හැකි සෑම දෙයක්ම කරගන්න පුළුවන් ඒ වගේම විශේෂයෙන් කියන්න ඕනෑ රැස්වීම් අංශයට ගිය ක්ෂණික වැඩේ කෙරිලා ඉවරයි. ඇත්තටම ඒ පිළිබඳව ගෞරවය ඔබතුමාට පුදකරන්න ඕනෑ, ඒ වගේම ගරු කොමසාරිස්තුමා ප්‍රමුඛ සියලුදෙනාට අපේ කෘතඥතාවය පුදකරනවා. ගරු නගරාධිපතිතුමනි, මෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් අපිට ගැටළුවක් නැහැ. 10 වෙනි පිටුවේ 4401 සේවා ගාස්තු - හිමිකම් ලියාපදිංචිය ඔබතුමා ලක්ෂ 20ක් වෙන් කරනවා ලක්ෂ 12යි ඒ වෙනකොට ලැබිලා තියෙන්නේ. අපි උපකල්පනය කරන මුදලට එය දාන්නේ එහි ගැටළුවක් නැහැ. ලක්ෂ 12ක් ලැබෙද්දි ඔබතුමා ලක්ෂ 20ක් එන අවුරුද්දටත් දාලා තියෙනවා. මට තියෙන ප්‍රශ්නය මෙච්චර අඩුවෙන් ලැබෙද්දි මෙච්චර වැඩියෙන් වෙන්කරලා

තියෙන්නේ ඇයි කියලා. මීළඟ එක තමයි මුද්දර ගාස්තු ඔබතුමා 2022 බජට් කරලා තියෙනවා ලක්ෂ 1200ක් එකේ ලැබෙනවා ඊට වඩා ඉක්මවා ගිහිල්ලා ලක්ෂ 1455ක් සතුටුයි. කොහොම හරි කැපවීමකින් මොකක්හරි හේතුවකින්. 2021 දී ඊටත් වඩා වැඩි ලක්ෂ 1534ක් අපි එකඟයි නමුත් ඔබතුමා ඒ වැඩියෙන් ලැබෙද්දි ලක්ෂ 1300කට අඩු කරනවා අපිට උපකල්පනය පිළිබඳ ගැටළුවක් නැහැ, අනුන් ලබාදෙන දේ අපිට කියන්න බැහැ මුද්දර ගාස්තු ලැබෙන්නත් නොලැබෙන්නත් පුළුවන්. නමුත්, මම කියන්න උත්සහ කරන්නේ ඔබතුමා මෙය මීට වඩා ප්‍රායෝගිකව වෙනත් වෙනත් කියලා දාන්නේ නැතුව අවශ්‍ය වෙන සංඛ්‍යා ලේඛණ පමණක් ඇතුළත් කළානම් ලොකු සංඛාවකින් මෙහි වෙනස පෙන්වන්න තිබුණා. හැමදාම එකම ලේඛනය චුටි චුටි වෙනස්කම් කරලා රුපියල් විසිපන්දහක විතර ඉතුරුවක් පෙන්නනවා. ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා ඔබතුමාගේ දැක්මක් එක්ක මීට වැඩිය ලොකු දෙයක් කරන්න පුළුවන් කියලා. ඒවගේම සේවා බදු 12වෙනි පිටුවේ 2022 ලක්ෂ 2063 ක් ඔබතුමා බලාපොරොත්තු වෙනවා. එයින් 1280 යි ලැබිලා තියෙන්නේ. එහෙම තියෙද්දි 2023 අවුරුද්දෙත් ලක්ෂ 2065 බලාපොරොත්තු වෙනවා මම දන්න තරමින් තක්සේරුවක් කරලත් නැහැ. මම අහන්න කැමති එහෙම ගානකට කෙසේද යන්න කියලා ගැටළුවක් මතුවෙනවා, බලපත්‍ර ගාස්තු, සංචාරක හෝටල් එකෙත් බලාපොරොත්තු වෙච්ච මුදලින් ලක්ෂ 18ක්ම ලැබිලා නැහැ. නමුත්, ඔබතුමා 2023ත් ලක්ෂ 20ක් බලාපොරොත්තු වෙනවා. ඒවගේම ආහාර හා සනීපාරක්ෂාව රෝග වැළැක්වීම යටතේ ගිය වාතාවට වඩා ඔබතුමා ලක්ෂ 33ක් තමයි බජට් කරන්නේ. ඒවගේම පොදු පරිපාලනය කියන එකටත් ලක්ෂ 17ක් අඩුවෙන් තමයි බජට් කරලා තියෙන්නේ. මීළඟට 39 පිටුවේ සෞඛ්‍ය අධ්‍යාපනය රු.25800 ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම කොරෝනා වගේ වසංගතයකින් බේරුනේ එන්නත්කරණය නිසාම නෙවෙයි. සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් දැනුවත් කළ නිසා එයින් තමයි යම් කිසි සාර්ථකත්වයක් ලැබුවේ. දැන් ඊට වඩා වසංගත තත්ත්ව තිබුණත් ඔබතුමා දාලා තියෙන්නේ 25000 මුදලක් විතරයි. මෙයට මීට වඩා දෙයක් කරන්න තිබුණා කියලා විශ්වාස කරනවා. තව මැසි නාශක තෙල් සඳහා ඔබතුමා 2022 ලක්ෂ හතක් වෙන්කරලා එක්ලක්ෂ දහදාහයි වියදම් කරන්නේ ඒ කියන්නේ දැන් මැස්සෝ අඩු වෙලාද. දැන් මේ අවුරුද්දටත් ලක්ෂ හතක් වෙන්කරලා තියෙනවා. මම කියන්නේ සංඛ්‍යා දත්ත පිළිබඳ ගැටළුව. මම කිවුවා සතුටුදායක දෙයක් තියෙනවා කියලා, ඒ තමයි ගර්භණී මව්වරුන්ට කිරි පැකට් ලබාදීම, ඔබතුමා මම ආණ්ඩු පක්ෂයේ ඉදලා විපක්ෂයට ආවට පස්සේ මෙය ක්‍රියාත්මක කළේ. පෝෂණය අඩු මව්වරු ගැන දරුවෝ ගැන කතා කරනවා. මගේ හදපිරි සතුට ප්‍රකාශ කරනවා මම ඉල්ලනවා කිරි පැකට් එක වෙනුවට උණුසුම් කිරි විදුරුවක් දෙන්න පුළුවන්නම් හොඳයි කියලා මම යෝජනා කරනවා. තව අවමංගල්‍ය සේවා සඳහා ලක්ෂ 4ක් වෙන්කරලා කිසිවක් කරලා නැහැ. තව මට දැනගැනීමට අවශ්‍යයි නගරාධිපතිතුමනි, ඔබතුමා හැමතැනම වෙනත් වෙනත් කියලා සඳහන් කරලා තියෙනවා, මොකටද මේ වෙනත් කියලා දාන්නේ සමහරවිට උපචිත වියදම් වෙන්න ඇති. තව ව්‍යාපෘති වියදම් ගැන තියෙනවා එහි විනෝද වියදම් හැත්තෑදෙලක්ෂ හැටදහස් පන්සීයයක් වෙන්කරලා ලක්ෂ 34 වියදම් කරන්නේ 2023 ලක්ෂ 96කට යනවා මට මේ සම්බන්ධ ගැටළුව තමා තියෙන්නේ ඇයි මෙය මෙහෙම වෙන්නේ කියලා. තව හොඳ දෙයක් කරලා තිබුණා. පාසල්වල දරුවන් සඳහා ඔබතුමා ගිය වසරට වඩා මේ වසරේ පොත් දෙන්න බලාපොරොත්තු වෙලා තියෙනවා. නැණ නුවණ පැදීම තරම් හොඳ දෙයක් නැහැ. ලබන අවුරුද්දේ අපි රවිනාත් මන්ත්‍රීතුමා යටතේ නගර සභාව හොබවද්දි ඔබතුමාට සතුටුවෙන්න පුළුවන් ලක්ෂ 300ක ආරම්භයක් ලබාදුන්නා කියලා. ඔබතුමාටත් කොමසාරිස්තුමා ඇතුළු සියලු නිලධාරින්ටත්, සියලු මන්ත්‍රීවරුන්ටත් ස්තුතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එෆ්. බී. නිලංක සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ප්‍රථමයෙන්ම මේ ඉදිරි වර්ෂයක කාලය තුළ මොරටු ජනතාවගේ යටිතල පහසුකම් ප්‍රමුඛ කරගෙන අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා මොරටුව මහා නගර සභාව මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සහ ක්‍රියාවන් සඳහා ක්‍රියාත්මක කරන අයවැය ලේඛනයයි මේ.

මෙහි යම් යම් අඩුපාඩු තියෙන්න පුළුවන් මේ අනාගත ලියවිල්ලක් මෙය ඉදිරි වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන්නට අපිට හැකියාව ලැබෙන්නේ නාගරික මන්ත්‍රීවරු සහ කොමසාරිස්තුමා ඇතුළු සේවකයන්ගේ උදව්ව හා ජනතාවගේ කැපකිරීමත් එක්ක තමයි කියන එක මා මුලින්ම ප්‍රකාශ කළ යුතුයි. අපේ නීතිඥතුමියගේ මුවින් ඉතාමත් කණගාටුදායක දෙයක් කියවුණා එය ගැන කතා කළ යුතුමයි. මොරටුවේ ඉන්නේ විශාල ඉඩම් තියෙන ජනතාවක් නෙවෙයි. ඔබතුමාන්ලාගෙම මුවින් පිටවුනා ඉතා දුප්පත් ජනතාවක් ඉන්නේ කියලා. එතකොට ඒ දුප්පත් ජනතාවට තියෙන පර්චස් 2කේ 3නේ ඉඩමක් අනුමත කරලා දෙනවට ඔබතුමිලා අකමැතිද මම ඔබතුමියගෙන් අහනවා. ඔබතුමිය ඔබතුමියගේ කතාවේදි එක කිව්වා පුළුවන්නම් එය ඉල්ලා අස්කර ගන්න නැත්තම් මොරටු ජනතාවට වැරදි අදහසක් යනවා ඔබතුමියලා විපක්ෂයක් හැටියට මේ ජනතාවගේ ඉඩමක් අනුමත කරනවට අකමැති කියලා, ඔබතුමිය අපහසුතාවයට පත්වෙනවට අකමැති නිසායි මම කිවුවේ. ගරු නගරාධිපතිතුමනි, තවත් විපක්ෂයේ මන්ත්‍රීවරු කතා කරන අවස්ථා වලදි මට හැඟුන දෙයක් තමයි 2020 මුල් භාගයෙදි ආපු කොරෝනා ව්‍යසනයත් එක්ක මියගිය මන්ත්‍රීවරු හොල්මන් වෙලා ඇවිල්ලා කතා කරනවද කියලා. 2020 මුල් කාලේ වෙනකොට කිසිම කෙනෙක් ගෙදරින් එළියට බැස්සේ නැහැ. මරණ භයේ ගෙදර හිටියේ සමහර මන්ත්‍රීවරු පවා නමුත් ඔබතුමා ප්‍රමුඛ සේවකයෝ එළියට බැස්සා අවමංගල්‍ය අවස්ථාවල අස්කරන වැඩ කළා, කොරෝනා හැදුන ගෙවල්වල කුණු ගන්න පවා ඔවුන් පැකිළුනේ නැහැ. ඒ කොරෝනා හැදුන අයගේ ගෙවල් වල කසල ගෙන එන ක්‍රමයක් ඔබතුමා නිර්මාණය කළා, පන්සල් ගණනාවක හමුදුරුවරුන්ට කොරෝනා හැදුනම පිසීආර් එකක් කරන්න හමුදුරුවෝ එක්කන් යන්න කවුරුත් ඉදිරිපත් වුනේ නැහැ නගරාධිපතිතුමනි, අද මේ කිඹුල් කඳුලු හෙළනවා. අපි දකිනවා මේ ආර්ථිකය ගොඩනගන්න පුළුවන් ක්‍රම තුනක් නගරාධිපතිතුමනි, එකක් ඇඟළුම් කර්මාන්තය, අනෙත් එක සංචාරක කර්මාන්තය දියුණු කිරීම, අනෙක් එක විදේශ ශ්‍රමිකයන්ගෙන් එන්නාවූ මුදල්. මේ තුනම අද වෙනකොට නතර කරලා තියෙනවා යම් පුද්ගලයන්ගේ දේශපාලන වුවමනා ඉටුකර ගැනීමට. පස්සේ රට ගිහින් කියනවා මෙයා හරි නැහැ කියලා. 1800 ගණන් වල හිටපු රජවරු ගැන කියලා වැඩක් නැහැ ගරු මන්ත්‍රීවරුනි, අපි ප්‍රයෝගික වෙන්න ඕනෑ, ජනතාව ප්‍රශ්න වලින් මුදවපු නායකයව ගෙදර යවලා ඇවිල්ලා මෙතන කිඹුල් කඳුලු හලනවා, මෙයද දේශපාලනය කියන්නේ, අපි 2018 පත්වෙලා එද්දි එක්සත් ජාතික පක්ෂ රජයක් තියෙනකොට අපිට කිසිම ප්‍රතිපාදනයක් දුන්නේ නැහැ, පස්සේ අපේ ආණ්ඩුව එද්දි කොරෝනා ව්‍යසනය පටන්ගත්තා. අපි සෞම්‍ය පෙදෙසෙ හැදුවා පාරක් නිතරම වතුරෙන් යටවෙන, ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවකට අනුව මිනිස්සුන්ට ලේ පරීක්ෂණ ටික බලාගන්න තැනක් අපි නිර්මාණය කරලා තියෙනවා, එතකොට අපි නොකරයි කියන්නේ මොකද්ද, වැඩ නොකරයි කියන්න එපා ඒ වචනය සදාචාරසම්පන්න නැහැ. වැරදි අඩුපාඩු තියෙන්න පුළුවන් ඒවා හදාගෙන ඉදිරියට යන එකයි කළ යුත්තේ, පාලකයන් වෙනස් වුණාට මේ හැම දෙයක්ම හදන්නේ ජනතා බදු මුදලින් කවුරුත් නෙවෙයි. තව එක දෙයක් මතක් කරන්න ඕනෑ ගරු නගරාධිපතිතුමනි, මේ මොහොතේ මොරටුවේ වැඩි ප්‍රමාණයක් වඩු කර්මාන්තයෙන් ජීවත්වෙන ජනතාවක් සිටින්නේ, යම් කරුණු නිසා වඩු කර්මාන්තයට අවශ්‍ය වෙන බඩු භාණ්ඩ මිල ගණන් ඉහළ යනවා මම කියන්නේ අපි සම්ප්‍රදායික වඩු කර්මාන්තයේ නියැලෙන මිනිසුන් විදිහට අපි නගර සභාව මැදිහත් වෙලා සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන මේ ජනතාවට හඳුන්වා දෙමු මේ වඩු කර්මාන්තයෙන් එහාට ගිය ගෘහ කර්මාන්තයක්, පිටරටක් ඉළක්ක කරගෙන හදන භාණ්ඩයක්, භෝගයක් වැනි දෙයක් හඳුන්වා දෙමු. සිස්ටම් එක වෙනස් කරන්නනම් අපි වෙනස් වෙන්න ඕනෑ. මේ වෙනස කරන්න සියලු දෙනාටම ශක්තිය ලැබේවා යැයි ප්‍රර්ථනා කරමින්, මොරටු ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වුණ අයවැය වෙනුවෙන් අත් දෙකම ඔසවනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව තුළ ඡන්ද කොට්ඨාශ 29ක් තිබෙන මොරටුවේ ජනතාවගේ ග්‍රාමසේවා වසම් 42 ක් තිබෙන මොරටුව ආසනය තුළ ඡන්ද දායකයින් එක්ලක්ෂ දහසයදහස් අටසීය අසූහතරක් සිටින ප්‍රදේශයේ මහා නගර සභාව තුළ තිබෙන වපසරිය තුළ අද 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කරන්නේ මොරටුව නගරයේ සංවර්ධන කටයුතු වලට, මම කියන්න

කැමති මේ අයවැය තුළ 2023ට කරන වැඩසටහන් 8ක් තියෙනවා. ඒ 8 එකින් එකට ගත්තොත් එකක් තමයි පොදු පරිපාලන සේවය, ඒ වගේම දෙවෙනි එක තමයි සේවා හා බදු කියන එක, තුන සෞඛ්‍ය හා සේවා, ඒවගේම හතරවෙනි එක තමයි භෞතික සැලසුම්, පස්වෙනි එක තමයි මහජන උපයෝගිතා, හත්වෙනි එක සුභසාධක සේවාවන්, අටවෙනි එක තමයි කුණු කසල මෙහෙයවීම. මේ වැඩසටහන් 8ට ඔබතුමා විසින් ඉදිරිපත් කරලා තියෙනවා 2023 වර්ෂය සඳහා ආදායම ලෙස රු.1,272,926,200 ඒ වගේම වියදම් කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙලා තියෙනවා රු.1,272,901,200 අපි කියන්නේ විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට නොයෙකුත් කාලසීමා වලදී අපි පක්ෂ විපක්ෂ වුණා නමුත් අපි හිතන්න ඕනෑ විපක්ෂ අණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු කතා කළා ඉදිරියට අපි මේ රටේ නායකතුමා විදියට පාර්ලිමේන්තුවෙන් ගන්නාවූ තීරණයක් තියෙනවා. මේ රට ඉදිරියට සංවර්ධනය කරගෙන යන්න ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙලක් තියෙනවා. ඒ පාර්ලිමේන්තුවේ ගන්නා වූ වැඩපිළිවෙල තුළ අපි මේ නගරයට ගෙනල්ලා මොරටුව ආසනයට මේ අයවැය තුළින් කරන්න පුළුවන් වැඩක් තියෙනවානම් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු විදිහට අපි කැමති ඔබතුමාලට සහයෝගය දෙන්න. ගරු නගරාධිපතිතුමනි, මේ අයවැය තුළ අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. නමුත්, මෙය පොතට සීමා වුණාට අපි 2023 වර්ෂය සඳහා අපි ක්‍රියාත්මක කරනකොට ජනතාවට සේවයක් කරන ආයතනයක් විදිහට ජනතාවගේ වුවමනාවන් සඳහා කටයුතු කරන ආයතනයක් විදිහට අයවැය විතරක් නෙවෙයි ඊට වඩා යමක් කරන්න පුළුවන්නම් ඒක තමයි අපේ සභාවෙන්, මහජන නියෝජිතයෝ වශයෙන් ගන්න පුළුවන් සේවය කියලා මතක් කරන්න ඕනෑ. මේ අයවැය ගැන කතා කරනකොට ගරු නගරාධිපතිතුමනි, මෙහි 15 වෙනි පිටුවේ තියෙනවා HNB රථගාල එහි 2022 අපි ලක්ෂ 4යි ආදායම බලාපොරොත්තු වෙලා තියෙන්නේ, 2023ත් ලක්ෂ 4ක ආදායමක් තමයි අපි බලාපොරොත්තු වෙලා තියෙන්නේ, සෑම දෙයක්ම වැඩිවෙන කාලයක මම හිතනවා මේ රථගාල සඳහා වැඩි මුදලක් ගන්න කියලා. එය ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යම් කිසි උදව්වක් වේවි කියලා මම හිතනවා. විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිවුවා අපේ පක්ෂය දාලා ගිය මන්ත්‍රීවරු කිවුවා එක්සත් ජාතික පක්ෂ කරපු වැඩ ගැන. එතුමන්ලාට අයිතියක් නැහැ ඒ ගැන කතා කරන්න. පක්ෂය දාලාගිය මන්ත්‍රීවරුන්ට ඒවා ගැන කතා කරන්න අයිතියක් නැහැ. ඒවා ගැන කතා කරන්න අයිතියක් තියෙන්නේ අපිට විතරයි. එක්සත් ජාතික පක්ෂය දාලා නොගිය මන්ත්‍රීවරු හැටියට. ඒවගේම මේ අයවැය වෙනුවෙන් අපි ඔබතුමාට සහයෝගය දෙනවා වගේම මේ මොරටුවේ සංවර්ධන ක්‍රියාදාමය වෙනුවෙන් අපේ විපක්ෂ නායකතුමා ඇතුළු අපේ නාගරික මන්ත්‍රීවරු සියලු දෙනාම මේ අයවැයට ඡන්දය පාවිච්චි කරලා මේ අයවැය ජයග්‍රහනය කරවනවා කියලා ප්‍රකාශ කරමින්, අපේ ගරු ජනධිපතිතුමාටත්, මේ අවස්ථාව අපිට ලබාදුන්න එකට ස්තූති කරමින් මම නිහඬ වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අයවැය ඡන්දය විමසන මේ මොහොතේ කරුණු කිහිපයක් සභාව හමුවේ තැබීමට මම අදහස් කරනවා. මොරටුවේ බල ප්‍රදේශයේ ජනතාවගේ සුබවිහරණය වෙනුවෙන් නගර සභාවේ ලොකු කාර්යය භාර්යයක් කරනවා. සෞඛ්‍ය මංමාවත් නිවාස සියලු කටයුතු වල සේවාවන් සිදුකරමින් අප මොරටු ජනතාවගේ ජීවිත ආරක්ෂා කරමින් කරන්නාවූ මෙම කාර්යයට මාගේ ස්තූතිය ප්‍රථමයෙන් පුදකර සිටිනවා. විශේෂයෙන්ම කසල කළමනාකරණය සිදුකරමින් මොරටුව පිරිසිදු නගරයක් බවට පත්කර ගනිමින් ගෙනයන මේ වැඩසටහන ඉතා අගය කොට සළකනවා. මා ඇත්ත වශයෙන්ම මේ ගැන දැනගෙන සිටියේ නැහැ, වෙනත් සභාවන් තුළින් ස්වාමීන්වහන්සේ නමකගේ අපවත් විමකදී අප සභාව විසින් ඉටුකරන කාර්යය ඉටුකරනවාද කියන එක මගේ හදවතට දැනුන කරුණක් වුණා. අපේ ගමේ සුමනාරාම පන්සලේ මහා නායක ස්වාමීන්වහන්සේ අපවත්වුණ අවස්ථාවේදී එය දැනගත් විගස ගරු නගරාධිපතිතුමන් එම ස්ථානයට පැමිණ රැස්ව සිටි ජනතාවගෙන් කමිටුවක් පිහිටුවා එහි නායකත්වය ගෙන සතියක් පුරාවට සිදුකළ අසීමිත කටයුතු සභාවේ අරමුදල්ද ඔබතුමාගේ පුද්ගලික මුදල්ද දායක කරමින්, ආදාහන උත්සවය වෙනුවෙන් සිදුකළ අසීමිත මෙහෙවර මොරටුවේ සෑම පන්සලකම ඉදිකිරීම් පිළිබඳව ඔබතුමාට හා මේ සභාවේ සියලු සේවක මහත්ම මහත්මීන්ට මගේ ප්‍රණාමය පුදකරනවා. මොරටුවේ කොතැනක හෝ අවමංගල්‍යක් සිදුවූ විට ඒ අවට පිරිසිදු කිරීම, විදුලි ආලෝකය

සැපයිම, කොඩි කණු සිටුවා මොරටුව මහා නගර සභාවේ ගෞරවය පුදකිරීම ද මහඟු ක්‍රියාවක් ලෙස මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ඒ වගේම පොඩි කාරණාවක් කියන්න තියෙනවා, ධීවර දිනය වන 21 දිනයේ දී ගරු අගමැතිතුමන්, ධීවර ආමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමන්, රාජ්‍ය ආමාත්‍ය පියල් නිශාන්ත මැතිතුමන් එක්ව බේරුවල ප්‍රදේශීය සභාවේ "දළ රළ සවිය" නමින් රටේ සමස්ථ ධීවර ජනතාව වෙනුවෙන් වැඩසටහනක් ආරම්භ කළා. ඒ තමයි ධීවර රක්ෂණ විශ්‍රාම වැටුපක් සහ ධීවර කැකුළු ළමා ගිණුමක් ආරම්භ කළා මා විශ්වාස කරනවා එය ඉතා හොඳ වැඩසටහනක් බව, ඒනිසා අඟුලාන ඇතුළු මොරටුවේ සියලු ධීවර ප්‍රජාව වෙනුවෙන් මෙම වැඩසටහන හැකිනම් යම් වැඩපිළිවෙලක් සකස් කරන ලෙසම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ඒ වගේම අද පවතින ආර්ථික ගැටළු නිසා මහජනතාව පීඩාවට පත්වෙනවා ඒ වෙනුවෙන් සහනයක් ලබාදීමට හැකිනම් සෑම ගමකම ඇති සමුපාකාර ගොඩනැගිලි ප්‍රයෝජනයට ගනිමින් ජනතාවට අත්‍යාවශය භාණ්ඩ අඩු මිලකට අලෙවිකර ජනතාවට සහයෝගයක් ලබාදීමට වැඩපිළිවෙලක් සකස් කිරීමට හැකිනම් එයද මම මේ සභාවට ඉදිරිපත් කර සිටිනවා. කොරෝනා වෛරසය හේතුවෙන් ද රටේ ආර්ථික ගැටළු හේතුවෙන්ද අප ප්‍රදේශවල ගැටළු බොහෝමයක් පසුගිය කාලවල ඇති වුණා. මේ වනවිට සෑම ගමකම කාණු පද්ධති මංමාවත් ඇතුළු ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවන බව මම සඳහන් කරන්න කැමති. තවද මොරටුවේ දූ දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කරන්නට පරිගණක දැනුම නොමිලේ ලබාදීමටත්, ගෙවතු වගාව සඳහා නගර සභාවෙන් නිෂ්පාදනය කරන පොහොර සහ පැළ ලබා දී වගා කිරීමට ජනතාවට සහයෝගය ලබාදීම කරගෙන යන මොහොතක මම ඔබ සියලු දෙනාටම ඒ සඳහා ස්තූතිය පුදකරන අතරම මේ ලබන්නාවූ නව වසර සැමට සුබම සුබ නව වසරක් වේවා යැයි කියමින්, 2023 වසර සඳහා ඉදිරිපත් වූ අයවැයට මගේ සතුට එළ කරමින් මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2023 මොරටුව මහා නගර සභාවේ ආදායම් සහ වියදම් වාර්තාව පිළිබඳ සංවාදයේ යෙදෙමින්, අපි කවුරුත් දන්නවා මේ වෙනකොට අපි රටක් වශයෙන් දීර්ඝ ඉතිහාසයක් පුරා අනුගමනය කරන ලද වැරදි ආර්ථික ප්‍රතිපත්තියත්, ඒ මත ගොඩනැගුණු වැරදි දේශපාලන සංස්කෘතියත්, ඒ හරහා සිදුවුණු සමාජ ව්‍යසනයත් මුහුණ දෙමින් ඉන්න රටක්. ඒ රට තුළ තිබෙන පහළම ඒකකයක් වන පළාත් පාලන ආයතනයක්. ඒනිසා අපි කවුරුත් දන්නවා මේ දේශපාලන සංස්කෘතිය, මේ මහා ආර්ථික අර්බුදයට හසුවෙලා එමඟින් පීඩාවට පත්වූ ජනයා මේ වැරදි දේශපාලන සංස්කෘතිය පිළිකුල් කරමින් ඉන්න වෙලාවක්. ඒ සංස්කෘතිය අභාවයට පත්කරමින් ඉන්න වෙලාවක්. ඒ අභාවයට පත්වෙමින් යන වැරදි දේශපාලන සංස්කෘතියට අනුගත වුණ පක්ෂ හැම එකක්ම අද මුහුණ දීලා තියෙන අර්බුදය අපි ඉදිරියේ තියෙනවා. ඒනිසා මම මොරටුව මහා නගර සභාවේ අයවැය දකින්නේ දේශපාලන අභාවයට ගිය පොදුජන එක්සත් පෙරමුණේ නගරාධිපති ඩබ්. සමල්ලාල් ප්‍රනාන්දු මහතාගෙත් අභාවයේ මළගම සනිටුහන් කරන ලියවිල්ලක් විදිහටයි. වාද විවාද නැහැ අද මේ පිළිබඳව. මේ ලේඛනය පිළිබඳව අද අපට පැවරී ඇත්තේ ගරු බුහුමන් කිරීම සඳහා ගුණ කථනයක් ඉදිරිපත් කිරීම පමණයි. ඒ අභාවයට පත්වුණ දේශපාලන සංස්කෘතියත් ඒ මත ගොඩනැගුණු ඒ නගරාධිපති ධූරය, මියගිය නගරාධිපතිවරයෙක් දේශපාලන වශයෙන්. මියගිය නගරාධිපතිවරයෙක් ඉදිරිපත් කරන ලියවිල්ලක්. ඒනිසා මෙයින් ශෝකයට සංවේගයට පත්වුණ පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරුන්ට, ඒවගේම ඊට මැදින් සම්බන්ධ වුණ මේ සංස්කෘතියෙම මේ රටේ ආරම්භකයෝ වුණ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි අපේ සාතිශය සංවේගය කණගාටුව මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා. නමුත් අපිට නිවන් සුව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරන්න බැහැ. මොකද ඊයේ රෑ දැක්කා හීනයක්. අවීචි මහා නරකාදියේ ප්‍රධානියා, යම රජතුමාව දැක්කේ. යම රජතුමා ළඟ තියෙනවා මේ නගරාධිපතිවරයාටත් මේ ආණ්ඩු පක්ෂයටත් විරුද්ධ විශාල චෝදනා පත්‍රයක්. ඒනිසා ඒ චෝදනා පත්‍රය අතිශය බරපතලයි. ඒ චෝදනා පත්‍රය ඇතුලේ තියෙන්නේ මොරටුව ජනතාවගේ ධනය, දේපල, මහජනයාගේ සම්පත්, ඒ ජනතාවගේ සේවා සපයන ස්ථාන සියල්ල කඩා වැට්ටවීමේ චෝදනා. ඒවා ලේසි නැහැ. දැන් මේ කියනකොටම සමහර වෙලාවට කටු ඉඹුල පේනවා. ලෝදිය පේනවා. අසූචි වලවල් පේනවා. කපන කොටන ඉරන ඒවා පේනවා. ඒවා දැකලා තමයි මේ උදේ ඉඳලා විවිධ වේදනාබර හඬවල් එළියට ආවේ. දැන් කෑමොර දෙනවා. කරන්න දෙයක් නැහැ. කල පව් පළ

දෙනවා. හැමදාම දැක්කොත් එහෙම තමයි මෙයා. හැමදාම දකින දකින වෙලාවට පව් පුරෝගෙන ඉන්නේ. හොඳ කරපු මිනිස්සු බය වෙන්න ඕනේ නැහැ. හොඳ කරපු මිනිස්සු නෙමෙයි යම රජ්ජුරුවෝ කැඳවන්නේ, වැරදි වැඩ කරපු මිනිස්සු. බොරු කියපු මිනිස්සු. අපරාද කරපු මිනිස්සු. කැඳවන්නේ.

ගරු නගරාධිපතිතුමනි, ඊනිසා මේ අයවැය ලේඛනය කියලා කියන්නේ අපි මුලින් කිවුවා වගේම දේශපාලන වශයෙන් මියගිය නගරාධිපතිවරයෙක් සහ දේශපාලන වශයෙන් මියගිය පාලක කණ්ඩායමක් ඉදිරිපත් කරන ලියවිල්ලක්. මෙහි අවසානයේදී අපිට මළ බතටත් එන්න කියලා තියෙනවා රන්දිය හෝටලයට. කමු කාලා ඉවර කරමු. තවදුරටත් දේශපාලන වශයෙන් මියගිය අයගෙන් මේ ජනයාට යහපතක් වේ යැයි හිතන්න බැහැ. ඔයගොල්ලෝ කියන තරමක් බොරු කිවුවා. මේ ආයතනය කඩා වැටෙන බොහෝ දේවල් කළා. ඊනිසා ගණන් හිලව් වලට කාලය ගන්න එක තේරුමක් නැහැ. නමුත් කිවයුතු එකක් තියෙනවා. ගිය අයවැය වෙලාවේ තමුන්නාන්සේ සිව්සැට බරණින් සැරසී කසී සළුපිළි වලින් අන්දවා ගෙන එන ලද රජගේ ඇත්ත තත්ත්වය එදා අපි කිව්වා. මිලියන 1700 ක් පෙන්නුවා. සුපර් මාර්කට් එක පෙන්නුවා. රංග ශාලාව පෙන්නුවා. නිල නිවාස පෙන්නුවා. කොම්පෝස්ට්ගාරයක් පෙන්නුවා. මහා දැවැන්ත ව්‍යාපෘතියක්. කෝටි 170 ක්. අපි එදා කිව්වා. ඒ නිසා 2022 අයවැය මේ මුළු මතය වෙනස් කළා. අවධානය වෙන පැත්තකට යොමු කළා. එහෙම කරලා තමන්ට ඕනෑ කරන ප්‍රධාන වැය ශීර්ෂ දෙකට මිලියන 105 ක් හලාගත්තා. මේ තියෙන්නේ ඒ වැය ශීර්ෂ දෙක. 1312 (i) සහ (ii). දැන් අපිට කියනවා මේ මිලියන 105 වියදම්. යම රජ්ජුරුවන්ගේ චෝදනා වල තියෙනවා අයුතු ලෙස දේශපාලන බලය යොදාගෙන සත්‍ය සඟවාගෙන කටයුතු කිරීම. මේ අයවැය ලේඛනයේ තියෙනවා සත්‍ය වියදම් කියලා තීරුවක්. පිටුව 57. වැය ශීර්ෂ 1312 (i). එහි තමුන්නාන්සේ අපිට පෙන්වනවා සත්‍ය වියදම් මිලියන 40 යි. ලක්ෂ 400 න් 9 වෙනි මාසෙ 30 වෙනිදාට වියදම් කරලා තියෙන්නේ ලක්ෂ 4 යි. රු.464,041.00 යි. මේ පට්ටපල් බොරුවක්. ඊළඟට වැය ශීර්ෂ 1312 (ii). එහි සත්‍ය වියදම රු.1,290,315.00 යි. ඇස්තමේන්තුව මිලියන 65 යි. ලක්ෂ 650 යි. දැන් ලක්ෂ 650 කින් ලක්ෂ 400 කින් තමුන්නාන්සේ මේ වෙනකොට වියදම් කරලා තියෙන්නේ මිලියන 1 යි. එහෙම වෙන්න බැහැ. මේ සත්‍ය වියදම් සැඟවීමක්. ඒ සත්‍ය වියදම් සඟවපු ආකාරය මාසික වාර්තාවෙන් පෙන්වනවා. මාසික වාර්තාව හදන නිලධාරී මහත්වරුන්ට කියන්න පුළුවන් නම් හොඳයි. මේ තියෙන්නේ සභාව අනුමත කළ 9 වෙනි මාසේ වාර්තාව. 9 වෙනි මාසෙට තමයි මේ අයවැය කළේ. 9 වෙනි මාසේ වාර්තාවේ වැය ශීර්ෂය ඉතාම හොඳින් බලන්න. එහි මුළු වියදම පෙන්වනවා රු.1,754,355.00 ක්. අයවැයේ තියෙනවා ලක්ෂ 4 ක්. තමුන්නාන්සේලා මොනතරම් මේවා විකෘති කරනවද? ඊළඟට ඔබතුමාට පේනවා මේ වාර්තාවේ (ii) යටතේ වියදම් නැහැ. 9 වෙනි මාසෙ වෙනකම් වියදම් නැහැ. අගෝස්තු පනිනකම් වියදම් නැත. නමුත් ඊළඟ ඔක්තෝබර් වාර්තාවේ එම වැය ශීර්ෂයේම වියදමක් එනවා මැයි මාසේ රු.1,190,314.00 ක්. මැයි මාසේ එන්නේ ඔක්තෝබර් මාසෙට පස්සෙද? මේ සභාව අනුමත කරපු වාර්තා. මේ වාර්තාව ඉදිරිපත් කරනකොට මැයි වල වියදම පෙන්වන්න එපැයි. මේ අගෝස්තු. නමුත් මැයි වියදම පෙන්වන්නේ නැහැ. දැන් ඔක්තෝබර් මාසෙට දානවා මැයි වියදම. ඉතාම හොඳින් පැහැදිලියි තමුන්නාන්සේලාගේ මේ වංචාව, හොරකම, බොරුව. මේ පාරවල් කාණු බෝක්කු ප්‍රමිතියකින් තොරයි. මේවා ඉදි කරගෙන ඉදි කරගෙන යනවා. ජල බැස්ම නැහැ. ගල් අල්ලගෙන අල්ලගෙන යනවා. පාරේ යන්න විදිහක් නැති මට්ටමට අද හැමතැනකම කරපු සියල්ල ජලය පිරිලා රැඳිලා. තමුන්නාන්සේලා මේ ගැන හිතන්නේ නැහැ. මම ඕනෑ ඔට්ටුවක් දාලා කියනවා මේ ලක්ෂ 4 මේ දෙසැම්බර් පන්නලා ජනවාරි එනකොට මෙය මිලියන 50 පනිනවා. මම ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවා පාරවල්. යම රජ්ජුරුවෝ තමුන්නාන්සේට දෙන්න ඕනෑ දඬුවම් තීරණය කරයි. ඒ තරම් සහගහන අපරාධ. එය මෙහෙම කරන්න එපා. අපි හැමදාම කිවුවා. මේ දේශපාලන සංස්කෘතිය විසින් දැන් තමුන්නාන්සේලාට ඒ ඉඩ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා තවදුරටත් මොරටුව ජනයාගේ යහපත වෙනුවෙන් වැඩ නොකරන බවත්, ඒ ජනයාගේ යහපත වෙනුවෙන් සලසන්න තියෙන සේවා සියල්ල බිඳ වට්ටමින් තිබෙන බවත්, මේ මාර්ග කාණු බෝක්කු වලට කරන ලද සාපරාදී මහජන මුදල් හැලීමට දඬුවම මොකක්ද දන්නවද? ආත්ම ගානක් අපායේ කාණු බෝක්කු වල අසූචි ගොඩේ බඩගාන්න දීලා තියෙන්නේ.

ගරු නගරාධිපතිතුමනි, අර මන්ත්‍රීතුමිය කිවුවා අපි අමාරුවෙන් ඉන්න වෙලාවක්. අපේ දෙමාව්පියෝ අමාරුවෙන් ඉන්න වෙලාවක්. අපි කවුරුත් අමාරුවෙන් ඉන්න වෙලාවක්. මේ කරපු කතාවන් සහ මේ හදවත් ඇතුලේ තියෙන්නේ විශාල පරස්පරයක්. අපි කවුරුත් දනන්වා අපේ ගම්වල ජනතාව ජීවත් වන විදිහ. අපි කිවුවා ලක්ෂ 25 ක් වෙන් කරලා තියෙනවා, අඩුම තරමේ අපි පොත් ටික දෙමු. දෙතුන් සැරයක්ම කිවුවා. තමුන්නාන්සේගේ හදවතක් නැහැ. ඒක දැනෙන්නේ නැහැ. තමුන්නාන්සේ වායු සමීකරණ වලට මිලියන 3, 4 වියදම් කරනවා. දරුවන්ට පොත් ටික දෙන්න මේ 2.5 න් සතයක්වත් වියදම් කළේ නැහැ. ඒනිසා අනිවාර්යෙන් යම රජ්ජුරුවෝ තීන්දු කරනවා යමපල්ලෝ ලව්වා ඔය හදවත ගලවා අයින් කරන්න. හදවත වැඩක් නැහැ. මේ කරන ලද මුළු පාලන කාලය ඇතුලේ තමුන්නාන්සේලා තමුන්නාන්සේලාව වර්ණනා කරගන්න. නමුත් පාරට බැහැලා ඔය හොඳ කියන්න බැහැ. ඒ නිසා අපි කවුරුත් දේශපාලනිකව බෙදිලා ඇණ කොටාගන්න එක වෙනුවට මේ යථාර්ථය තේරුම් ගමු. අපි කාටත් එය බල කරලා තියෙන වෙලාවක්. අපි වගකියන්න ඕනෑ අනාගතයට. අද තවදුරටත් මේ පාරේ යන්න බැහැ. අද අපේ ප්‍රජා ශාලා, මාතෘ සායන, පෙර පාසල්, ක්‍රීඩා පිටි, රසායනාගාරය, පුස්තකාල මේ ඔක්කොටම වියදම් කරලා, වෙන් කරපු මුදල වැඩි. මේ ගමනත් මිලියන 45 ක් දාගෙනනේ පාරවල් වලට. ඉතිහාසයේ අයවැය ලේඛන ගත්තාම පේනවා මොනතරම් සල්ලියක් හලාගෙන හලාගෙන ගියාද. කෝ යන්න පාරක්. පෙර පාසලේ දරුවෝ ටික මෙච්චර අමාරුවෙන් තමාගේ අධ්‍යාපන කටයුත්ත කරනවා. අපිට කියනවා මන්ත්‍රීවරයෙක් දෙමව්පියන්ගේ ප්‍රශ්නයක්, පෙර පාසලට එවන්නේ නැතුව වියදම් කරන පාසලකට යවලා. එහෙම නැහැ. මාතෘ සායනයට එන අම්මා ඇතුල් වෙන්න පෙර බඩේ ඉන්න දරුවා පයින් ගහනවා යන්න බැහැ ඒකට කියලා. පුස්තකාලේ එහෙමයි. අපේ ප්‍රජාශාලා ටික විනාශ වෙලා යනවා. අපේ ඉඩ කඩම් ටික විනාශ වෙලා යනවා. අපේ වත්කම් දේපල සියල්ල විනාශ වෙලා යනවා. නමුත් ඒවා නඩත්තු කිරීම සඳහා කිසිඳු මුදලක් යොදවන්නේ නැතුව ඔයගොල්ලෝ ආයි පාරවල් වලට මිලියන 45 ක් දාගන්නවා. ඒනිසා ඉතාම පැහැදිලියි තමුන්නාන්සේලාගේ යන ගමන තවදුරටත් මේ රටේ ජනයා මුහුණ දීලා තියෙන මොරටුවේ ජනයා මුහුණ දීලා තියෙන ඒ සේවාවන් වලට අභාග්‍ය සම්පන්න ඉරණමක් අත්වෙනවා. ඔවුන් ගොදුරු වෙනවා. ඒ නිසා අපි කියනවා දැන් හොඳටම ඇති. අපට ඕනෑ යහපත් පාලනයක්. අපට ඕනෑ වඩාත්ම නිවැරදි සමාජ ව්‍යාපාරයක්. එක්සත් ජාතික පක්ෂයේ නායකයා, ඒ ආණ්ඩුවේ නායකයා. මෙහෙ විපක්ෂෙ ඉන්නවා අපේ වෙලාවත් අරගෙන ඒ කැල්ලේ ඉතුරු එක. ආණ්ඩුවේ නායකයා එහෙ. පොහොට්ටුවේ නායකයා. මෙහෙ ඉන්නවා එක්සත් ජාතික පක්ෂෙ විපක්ෂෙ කාලේ අරගෙන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා මාර විදිහට කැගහමින් දුවනවා පොහොට්ටුවට. ස්වාධිනයි කියාගෙන ආණ්ඩුවේ ඉන්නවා මේ පිළේ. දැන් මේකත් අවුල් වෙලා තියෙන්නේ. මේ දේශපාලන සංස්කෘතිය හැමෝම අවුල් කළා.

ගරු නගරාධිපතිතුමනි, ඒ නිසා අපිට දැන් ඕනෑ ඇත්තටම නිවැරදි සමාජ ව්‍යාපාරයක්. මේ කාලය අපරාදෙ මම හැමදාම කිව්වා වගේ. හෙට ගොඩනගන මොරටුවට වැදගත් අත්දැකීම් ප්‍රමාණයක් එකතු කරගත්ත මිනිස්සු ඉන්නෙ මෙතන. ඒනිසා ඔබේ වගකීම තේරුම් ගන්න. ඔබ වටිනා මනුස්සයෙක් නම් ඒ වටිනාකම තේරුම් ගන්න. බොරුවට තුට්ටු දෙකට සිල්ලර කෑ කෝ ගැසීම් කරන්න එපා. ඔබටත් අපටත් ඕනෑ නිවැරදි ලෙස අනාගත දරුවන්ට වඩාත් හොඳ පාලනයක් නම් දැන් ඔය කෑ ගැසීම් නවත්වන්න. අපි ගොඩනගනවා සමාජ ව්‍යාපාරයක්. ඒ සමාජ ව්‍යාපාරය නිවැරදි කරනවා මේ ආයතන වල බලය. අභිමානයක් සහිත ආයතනයක් ගොඩනගනවා. නිලධාරීන්ට සේවකයින්ට මොරටුව මහා නගර සභාව කියන්න පුළුවන් අභිමානවත් ආයතනයක් ගොඩනගනවා. ඒනිසා අපට ඕනෑ වඩාත් නිවැරදි පාලනයක්. මොරටුවේ පෙර පාසල් ටික අපට අතිශය වැදගත්. අපේ දරුවන් ආකල්පමය වෙනසක් සහිතව සමාජගත කරන්න තිබෙනවා. ඒ ආයතන පද්ධතිය අපි වෙනස් කරනවා. අපි ඒවා ගොඩනගනවා. ඒ විතරක් නෙමෙයි අපේ පුස්තකාල ටික ගමේ ජනතාවට දැනුම සම්භාරයක් ගෙනයන්න පුළුවන් තැනට ගොඩනගනවා. මේ ආයතනයේ තිබෙන ධනය අපිට ඇති. ධනය ඕනාවටත් වඩා තිබෙනවා. මාර්ග පද්ධතිය ප්‍රමුඛතාවයක් ඇතුලේ ඉතාමත් හොඳ ප්‍රමිතියක් සහිතව කරනවා. ගමේ මිනිස්සු ලව්වා කොන්ත්‍රාත් නතර කරනවා. අවශ්‍ය කොන්ත්‍රාත් එක පමණයි දෙන්නේ. අපි ගමේ පාර දෙනවා ගමේ මිනිස්සුන්ට හදන්න. ගමේ හදනවා ශක්තිමත් යාන්ත්‍රනයක්. ඒක ජේ. වී. පී. නෙමෙයි. ඒක ගමේ ඉන්න හොඳ මිනිස්සුන්ගේ ඒකකයක්. එමගින් ගම ගොඩනගනවා. ඒ නිසා ඔය අපරාධ

වලට තවදුරටත් ඉඩ නැහැ. ඔය හොරකම්, වංචා, දූෂණ , නාස්තිය අපි වහාම නතර කරනවා. මේ ආයතනයට විනයක් ගේනවා. අපට විනයක් ඕනෑ. අද මේ ආයතනයේ විශාල සේවක සංඛ්‍යාවක් පාලනයෙන් ගිළිහිලා. කොමසාරිස්තුමාට, මේ නිලධාරීන්ට චෝදනා කරලා වැඩක් නැහැ. බලය වෙනම දේශපාලන අධිකාරියෙන් අතට ගත්තු විශාල කණ්ඩායමක් අද තමන්ට ඕනෑ ඕනෑ දේවල් කරනවා මේ ආයතනයේ. මේ ආයතනය ගොඩනගන්න බැහැ. ඒ නිසා වැරදි දේශපාලන සංස්කෘතිය පරාජයට පත් කරනවා. ඒවගේම වඩාත් නිවැරදි පරිපාලනයක් මේ ආයතනයේ ගොඩනගනවා. ඒ වගේම ප්‍රජාශාලා, පුස්තකාල, පෙර පාසල ඒ සියලු සේවාවන් වඩාත් හොඳ තැනකට ගේනවා. ජාතික ජන බලවේගය නිසැක ලෙසම හෙට මේ සභාවේ බලය අත්පත් කරගන්නවා. ඒක වළක්වන්න බැහැ. හොරු, දූෂිතයෝ, අපරාධකාරයෝ බය වෙන්න ඕනෑ. අපි මේ ආයතනය අනාගත දරුවන්ට වඩාත් යහපත් සමාජයක් බවට පත්කරන්න ගොඩනගන එක ගොඩනගනවා. අපි කියනවා මොරටුවේ ජනතාවට එන්න පෙරට. මේ හොරු පන්නමු. මේ දූෂිතයෝ පන්නමු. මේ අපරාධකාරයෝ පන්නමු. ඇත්ත මිනිස්සුන්ගේ අතට මේ ආයතනය ලබාදෙමු කියමින් සියලු දෙනාට ලබාන්නා වූ නත්තලත් ලබාන්නා වූ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී. එච්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙය මාගේ පස් වන අයවැය කතාවත්, ඔබතුමන්ගේ පහළොස් වෙනි අයවැය ඉදිරිපත් කිරීමත් සමගම 2022 වර්ෂය පිළිබඳ නැවත හැරී බලන විට කොරෝනා උවදුරත් සමග ආර්ථික අර්බුදය හමුවේ අපි බලාපොරොත්තු වූ ආර්ථික සංවර්ධන කටයුතු නිසි ලෙස අප හට ඉටු කරගන්න බැරි වුණත් අපි පසුගිය වසර 4 තුළ 70% ක පමණ අප කොට්ඨාශ වල සංවර්ධන කටයුතු සිදු කළා. 2023 අයවැය වාර්තාව අනුව අපි හිතනවා මේ වසර වන විට අපට ඉතුරු 30% ත් ඉටු කරගැනීමට හැකියාව ලැබෙන බව. ඒ වගේම ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ගමේ තිබෙන කාණු පද්ධති, ළමා මාතෘ සායන, සුසාන භූමි, ශුද්ධ පවිත්‍ර කිරීම් කටයුතු, ඒවගේම පන්සල් සහ පල්ලි වගේ විවිධ ස්ථාන ශුද්ධ පවිත්‍ර කිරීම් කටයුතු වලදී අපි මනා ලෙස ඒ කටයුතු ඉෂ්ඨසිද්ධ කළා. ඒ සඳහා ඔබතුමන්ගේ සහ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක යසන්ත මහතාගෙත් සහ වීදි ලාම්පු දැල්වීමේදී දූල්සිරි මහතාගෙත් සහයෝගයත්, සියලුම නිලධාරීන් හා සේවක මහතුන්ගේ සහයෝගයත් අපිට ලැබුණා. ඔබතුමන් මෙවර ඉදිරිපත් කර තිබෙන අයවැය වාර්තාවේ සෞඛ්‍ය සේවා, භෞතික සැලසුම්, මහජන උපයෝගිතා සේවාවන්, සුභසාධක සේවාවන් සහ කුණු කසළ මෙහෙයවීම සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වගේම ක්‍රමවත් අයවැය වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බැවින් අඟුලාන කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මේ අයවැය වාර්තාවට මම සහයෝගය ලබාදෙමින් පක්ෂපාතීත්වය ප්‍රකාශ කරනවා. මොරටුව මහා නගර සභාව නියෝජනය කිරීමට මා කෙරෙහි විශ්වාසය තබා අවස්ථාව ලබාදුන් මාගේ කොට්ඨාශයේ සියලුම ජනතාවටත් මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙමින් එළඹෙන නත්තල සාමය සතුට පිරි සුභ නත්තලක් හා 2023 වර්ෂය සුභ වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

වහින්නට හැකි නම් ගිගුම් දී - වියළි ගම් බිම් වලට ඉහළින්
ඉදෙන්නට හැකි නම් බතක් වී - බතක් නොඉදෙන පැළක රහසින්

ගරු නගරාධිපතිතුමනි, 2023 වර්ෂය සඳහා මොරටුව මහා නගර සභාවේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ වෙලාවේ සුනිල් ආරියරත්නයන් රචිත, නන්දා මාලිනියන් ගැයූ ඒ ගීතය මම පදනම් කරගත්තේ අපි හැම අයවැයකම, හැම කාරණාවකම මොරටුව මහා නගර සභාවේත්, රටෙත් පොදුවේ ගත්තාම හුදු විවේචනයන් විතරක් ඉදිරිපත් කරනවා. දැන් මේ කතා කරන වෙලාවේ අපි රටක් විදිහටත්, මොරටුව මහජනතාව විදිහටත් බලාපොරොත්තු වෙන්නේ හුදු විවේචන පමණක් නෙමෙයි. අපි හැමෝගෙන්ම බලාපොරොත්තු වෙනවා ප්‍රායෝගික වගකීම් සහ යුතුකම් කියලා දෙයක්. මේ ව්‍යසනය තුරන් කරන්න, නතර කරන්න කුමන හෝ මැදිහත් වීමක්. විවේචන විතරක් නෙමෙයි උත්තර එක්ක අපිට ඕනෑ වෙනවා. ඒනිසා තමයි ඒ ගීතයෙන් මගේ කතාව ආරම්භ කළේ. අපි කවුරුත් දන්නවා අපේ ජීවිත කාලයේ මුහුණ දෙන ඉතාමත් ව්‍යසනකාරී

ආර්ථික අර්බුදයක, දේශපාන අර්බුදයක, සමාජ අර්බුදයක ගිළිලා තියෙන වෙලාවක්. ගිළිලා තියෙනවා කිවුවොත් වැරදි. ගිල්වලා තියෙන වෙලාවක්. ඒ වටපිටාව ඇතුලේ තමයි මොරටුව මහා නගර සභාවේ අපේ මේ අයවැයත් ඉදිරිපත් වෙන්නේ. මම සංඛ්‍යා ලේඛන වල ගොඩක් හිරවෙන්න කැමති නැහැ. පොදුවේ ගත්තම මේ අයවැය ලේඛනයේ යටිතල පහසුකම් වලට වඩා මහජන සුභ සාධනයන් වලට යම්කිසි නැඹුරුතාවයක්, මම කියන්නේ නැහැ මොරටුවේ ජනතාව මුහුණු දීලා සිටින මේ අර්බුදකාරී වාතාවරණය සමස්තයම ආවරණය වන විදිහට සුභසාධනයක් නොමැති වුවත්, යම්කිසි ප්‍රවේශයක් තිබිලා තියෙනවා. ඒනිසා ඒ පැත්තෙන් ගත්තෝත් මේ අයවැය ලේඛනයේ යම් සාධනීය බවක් පේනවා. 100% ක් සියල්ල හොඳයි කියලා කියන්න බැහැ. යම් මිශ්‍ර අදහසක් මට මේ සම්බන්ධයෙන් තියෙනවා. සාම්ප්‍රදායික විදිහට ගත්තොත් මේ අයවැයත් සාම්ප්‍රදායික ලියවිල්ලක්. නමුත් මේ අයවැයට විරුද්ධව මත ඉදිරිපත් කරන්නෙත් සාම්ප්‍රදායිකව. දෙකම සාම්ප්‍රදායිකයි. මම අවුරුදු 19 ක් මේ සභාව නියෝජනය කරනවා. ඒ අවුරුදු 19 ඇතුලත කතා කරන මමත් ඇතුලත්ව අපිත් ඒ සාම්ප්‍රදායට දායකව විවේචනයන් ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් අද මේ රට ඉල්ලන්නෙත් මේ මොරටුවේ ජනතාව ඉල්ලන්නෙත් ඒ සාම්ප්‍රදායික විවේචනය නෙමෙයි.

ගරු නගරාධිපතිතුමනි, පරිවර්තන යුගයක් කියලනෙ කිව්වේ. ඒක මොකක්ද කියලා මම වෙනම කතා කරන්නම්. පරිවර්තන යුගයක් නම් අපිත් පරිවර්තනය වෙන්න ඕනේ. අඩුම තරමේ මේ ලියවිල්ලට විවේචන කරනවා වෙනුවට විපක්ෂයෙන් ඉදිරිපත් වුණා නම්, මේ අයවැය හරියන්නේ නැහැ මෙන්න අපේ දේ කියලා එකක් ඉදිරිපත් වුණා නම් එය හරි ප්‍රශස්තයි. මම කියන්නේ නැහැ මේ විදිහට සංඛ්‍යා ලේඛනයක් විය යුතුයි කියලා. අඩුම තරමේ ඔබතුමා ඉදිරිපත් කළ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනය වගේ එකක් වත්, මොරටුවේ මිනිස්සු වෙනුවෙන් අපි ඉදිරිපත් කරන දේ කියලා වත් කිව්වා නම් එහි හරි ප්‍රශස්ත බවක් තියෙනවා. අපෙන් ඉල්ලා සිටින වෙනස්කම කියන්නේ ඒක. ඔබතුමන්ලා කවුරුත් දන්නවා රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මේ ආණ්ඩුව සම්බන්ධයෙන් අපේ විවේචනයක් තියෙනවා. නමුත් ඒ විවේචනය තියෙනවා වගේම රනිල් වික්‍රමසිංහ මහතා ගැන කියවීම අපි කවුරුත් දන්නවා. ඒ කියවීම තියෙනවා වගේම නිකන් විවේචනයට වඩා, පසුගිය දවසක අපි සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඉදිරිපත් කළා දොළොස් වැදැරුම් වැඩපිළිවෙලක්. ආණ්ඩුවට ඉදිරිපත් කළා කරනවානම් මෙන්න වැඩේ, බැරි නම් යන්න. අපි කිව්වේ නැහැ යන්නම කියලා. හැමෝම කියන්නේ යන්න කියලා. අපි කියනවා හරි ඉන්නවා නම් මේක කරන්න, බැරි නම් යන්න කියලා. එහෙම තැනකට එන්න ඕනේ. එහෙම අද මෙතන විපක්ෂයෙන් මතු වුණා නම් සමන්ලාල් ඔයා කරනවා නම් මෙන් වැඩේ. ඔයාගේ අයවැය අපි පිළිගන්නේ නැහැ කියලා කිව්වා නම් වටිනවා.

ගරු නගරාධිපතිතුමනි, දැන් කල්පනා කරලා බලන්න විශේෂයෙන්ම අපි කවුරුත් සතුටු වෙන්න ඕන කාලපරිච්ඡේදයක් නෙමෙයි මේ තියෙන්නේ. මම පිළිගන්නවා මට ප්‍රථමව කතා කළ නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා කියපු එක කරුණක්. ගම් වල මිනිස්සුත් එක්ක ඉඳලා ගම් වල ඉන්න දරුවන්ගේ වේදනාව, ඔවුන් ජීවත් වෙන්න වෙර දරන අරගලය, ඒ සියල්ල ගැන සංවේදී මිනිස්සු නම් ඒ ගම් වල ජීවත් වන මහජන නියෝජිතයෝ අපි කාටවත් සතුටු වෙන්න පුළුවන් වාතාවරණයක් නෙමෙයි තියෙන්නේ. අපිට පුළුවන් නම් අද මේ මොහොතේ සමහර විට පාරක් හදනවට වඩා, කාණුවක් හදනවට වඩා මහජන සුභසාධනය වෙනුවෙන් යමක් කරන්න. විශේෂයෙන්ම මම හිතන්නේ ඔබතුමා මෙවර අභ්‍යාස පොත් කලින්ට වඩා යම් ප්‍රමාණෙක වැඩි කිරීමක් කරනවා. අපි කණ්ඩායම් රැස්වීමේ කතා කළාම ඒ කරන යෝජනා ඔබතුමා පිළිගන්නවා. අපි ඒක ගැන සතුටු වෙනවා. ඒ අනුව ඔබතුමා වැඩි ප්‍රමාණයක් පොත් ලබාදෙන්න කටයුතු කරනවා පක්ෂ විපක්ෂ සියලු දෙනාටම. එක හොඳ ප්‍රවණතාවයක්. මොකද මේ වෙලාවෙ පොතක් ගන්නවා කියන්නේ අධ්‍යාපනය වෙනුවෙන් යම්කිසි දිරි දීමක් කරනවා කියන්නේ සභාවක් විදිහට අපේ යුතුකම වගකීම වගේම පුණ්‍ය කටයුත්තක්. මේ වෙලාවේ පින් කමක්. දෙමව්පියෙකුට පොතක් ගන්න පුළුවන් තත්ත්වෙක නෙමෙයි තියෙන්නේ. මම දන්නවා ලබන මාසේ හෝ ඊළඟ මාසේ මුල ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න සූදානම්. ඒ ගැන කෘතඥ පූර්වකව මම සිහිපත් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ පෙර පාසල් දරුවන්ට ආහාර වේලක් ලබාදෙන්න කටයුතු කළා. ඊයේ මම ගියා බොරුපන පෙර පාසලට. ඒ දරුවන්ට මාළු කෑල්ලක් එක්ක එළවළු දෙක්ක එක්ක කෑම එකක් ලැබෙනවා. හරිම සතුටුයි. මම දන්න විදිහට අනිත් තැන් වලත් එහෙමයි. වර්තමානයට ගැළපෙන විදිහට වර්තමානයේ තිබෙන අර්බුදය තේරුම් අරගෙන, විශේෂයෙන්ම දරුවන් ඉලක්ක කරගෙන මේ කරන සත්ක්‍රියාව අපි අගය කරනවා. වැරදි දේවල් විවේචනය කරමු. නමුත් මේ හොඳ දේත් අගයමු. අපි පසුගිය කාලේ අරගල කරලා, බුරියානි කාලා, පන්දම් පත්තු කරලා, කළු කොඩි දාලා, අවසානයේ අන්නාසි ගැට කාලා ගෝඨාභය රාජපක්ෂ මහතා එළවලා සිස්ටම් චේන්ජ් එකක් කරගත්තා කට්ටියක්. දැන් නහයෙන් අඬනවා. එයා එපා කියලා ගෙනාගත්තු මහත්තයා විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා, එතුමා කොහොමත් තව අවුරුදු දෙකක් ඉන්න ඕනේ. ඔබතුමන්ලා අපි මේ මහපොළොවේ ජීවත් වන අය. ඔබතුමා මේ මහපොළොවේ මිනිස්සුගේ ගඳ සුවඳ හඳුනන කෙනෙක්. මෙතන ඉන්න හැමෝම වගේ එහෙමයි. මහපොළොවට අඩි 3 ක් විතර ඉහළින් ජීවත් වන කවුරුත් නැහැ මෙතන ඉන්න. ගම් වල දුප්පත් මිනිහාට වඩා දුප්පත් මිනිස්සු සමහරවිට මෙතන ඉන්නවා. ඡන්ද පැත්තකින් තියන්න, සාදාචාරාත්මක විදිහට ගමේ මිනිහගේ දුක හඳුනගෙන ඔබතුමන්ලාගේ පාර්ශවයෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට බලකරන්න, හැම පැත්තෙන්ම ඒ බලකිරීම කරන්න, යන ගමන වෙනස් කරන්න එහෙම වෙනස් නොකොළොත් මේ රට විශාල ලේ වැගිරීමකින් කෙළවර වෙනවා. ඒ ලේ වැගිරීමෙන් ඔය කියන මේ මහත්වරු එක්කෙනෙක්ටවත් නෙමෙයි ප්‍රයෝජනයක් වෙන්නේ අන්තර්ජාතික මැදිහත්වීමකට විතරයි. ඒ අනතුර සභාවේ අවධානයට ලක්කරමින් මම නිහඬ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග එන්. අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන මේ අයවැය වාර්තාවට අනුව ප්‍රථමයෙන්ම මගේ එකඟතාවය පළ කරනවා. 2022 වර්ෂයේ මහා නගර සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් නිසි ලෙස තමන්ව පත් කරන යම් කම්ටුවකට තමන්ගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කළාද නැද්ද කියලා අපිට කියන්න පුළුවන්. තමන්ට ඒ වර්ෂයට පැවරෙන කාර්යභාරය නිසි ලෙස ඉටු නොකර මෙතෙන්ට ඇවිත් පුරසාරම් දොඩනවා. අපිට බලන්න පුළුවන් මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් තමන් නියෝජනය කරන, තමන් සහභාගී වෙලා තියෙන කම්ටුවේ පරමාර්ථය ඉටු කරලා තියෙනවද කියලා. මගේ 20 වෙනි සහභාගීත්වය මේ. මේ වසර 20 දී මම කිසිඳු මහා සභාවක් පැහැර හැරලා නැහැ. කිසිඳු කම්ටුවක් පැහැර හැරලා නැහැ. මා නියෝජනය කරන කම්ටුවේදී ඒ සියලු දේටම මම සහයෝගය දීලා තියෙනවා මන්ත්‍රීවරයෙක් වශයෙන්. මාගේ වගකීම, මොරටුව ජනතාවගේ වගකීම, කොට්ඨාශයේ වගකීම. අපි මන්ත්‍රීවරුන් ලෙසින් කටයුතු කරන කොට තමන්ගේ ගමට වැඩදායී පුද්ගලයෙක් වශයෙන් මහජන නියෝජිතයෙක් ලෙසින් පත් කරනකොට ගමේ පෙර පාසල වැඩිදියුණු කරන්න ඕනා. මාතෘ ළමා සායනය වැඩිදියුණු කරන්න ඕනා. මාතෘ ළමා සායනයට පැමිණෙන ගැබිණි මව්වරුන්ට ඒ පෝෂණය ලබා දීමට කටයුතු කරන්න ඕනා. ඒ වගේම කොට්ඨාශයේ පොදු පහසුකම් නංවන්නට තමන්ගේ කාර්යභාරය හරිහැටි ඉටු කරන්න ඕනා. ග්‍රාමීය මාර්ග හෝ පොදු පහසුකම් තමන්ට ලැබෙන වරප්‍රසාද මත ඒ කටයුතු කරන්න ඕනා. මේ අයවැයේදී පසුගිය අයවැය වාර්තාවට වඩා යම් මුදල් කප්පාදුවක් සිදු වෙමින් තිබෙනවා. එයට හේතුව තමයි මධ්‍යම රජයේ කිසිඳු මුදලක් මෙයට අන්තර්ගත කරලා නැහැ. මොරටුවේ වරිපනම් බදු ගෙවන ජනතාවගේ වරිපනම් බදු හා ව්‍යාපාරික බදු මුදල් වලින් පමණයි මේ සියලුම දේ, මුද්දර ආදායම් ඇතුළුව අපි ඉටුකරගන්න මේ සැලසුම් කරලා තියෙන්නේ. කිසිඳු මන්ත්‍රීවරයෙක්ගේ ප්‍රතිපාදනයක් හෝ බාහිර පුද්ගලයෙකුගේ කිසිඳු ප්‍රතිපාදනයක් මේකට අන්තර්ගත කරලා නැහැ. අපි විසින්ම මොරටුවේ මිනිසුන්ගේ යම් බදු මුදලක් නිසි කළමනාකරණයක් කරලා ඉදිරි වර්ෂය සඳහා සැලසුම් කරන්නේ. මොරටුවේ ජීවත් වන මහජන නියෝජිතයෙකු වශයෙන් අපිට තියෙනවා යම් යම් අඩුපාඩු ගම් වල. නමුත් අපේ අරමුණ ඉටු කරගන්න යම් වෙහෙසක් මහන්සියක් දරන්න ඕනා. මොන පක්ෂය නියෝජනය කරත් අපි අපේ වගකීම ඉටු කරන්න ඕනා. ඔබතුමා දන්නවා අපේ ගරු රවිනාත් ජේ. ගුණසේකර මන්ත්‍රීතුමා 2002 වර්ෂයේ නගරාධිපතිතුමා වශයෙන් කටයුතු කරන කොට, අපි විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් කටයුතු කරනකොට ඔහු මේ මොරටුවේ කසළ බැහැර කිරීමේදී විශාල අර්බුදයකට මුහුණ දුන්නා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් සියලු දෙනාම එකතු වෙලා ඔහුට

සහයෝගය දුන්නා. තමන්ගේ පිලේ ඉන්න ඇතැම් මන්ත්‍රීවරු තමන් සතුටු සාජ්ජයේ ගත කරන්න ඉඩම් හිමියාගෙන් මුදල් ප්‍රතිපාදන ලබාගත්තා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු සියල්ල එකතු වෙලා කරදියාන වත්තේ හිමිකරුට යම් මුදලක් අඩු කරලා දීලා අපේ ගරු නගරාධිපතිතුමාට සහයෝගය දුන්නා. දේශපාලන අරමුණක් තියෙන්න පුළුවන්. නමුත් අපි කටයුතු කරන්න ඕන මොරටුවේ මිනිසුනේග් කටයුතු සාර්ථක කරගන්න. දේශපාලන පක්ෂය පසෙකලා අපිට කරන්න පුළුවන් යුතුකම වගකීම අපි ඉටු කරන්න ඕන. ඒ සඳහා කටයුතු කිරීමේදී අපිට යම් යම් අපහසුතා එන්න පුළුවන්. නමුත් මිනිසා උපතේ සිට විපත දක්වා යන්නා වූ ගමනේදී මොරටුව මහා නගර සභාව පළාත් පාලන ආයතනයක් වශයෙන් අපි කටයුතු කරන්නේ ජනතාවගේ සුභ සිද්ධියඋදෙසා මිස තමන්ගේ සුභ සිද්ධිය තකා නොවෙයි.

ගරු නගරාධිපතිතුමනි, අපිට මැයි 9 වෙනිදා යම් සිදුවීමක් රටේ සිදුවුණා. ඒ තුළින් මොරටුවේ වරිපනම් බදු ගෙවන ජනතාවගේ මුදලින් පෝෂණය වන මොරටුව මහා නගර සභාවේ කෝටි 6 ½ ක දේපලක් විනාශයට පත්වුණා. දේශපාලනික අන්තවාදීන් හා ආගමික අන්තවාදීන් එයට සහයෝගය දුන්නා. මොරටුව මහා නගර සභාව ජනතාවගේ පරමාධිපත්‍ය සුරකින ස්ථානය. එය සුරකින්නට නම් අපි සියලු දෙනාට මොන අරමුණ තිබුණත්, කුමන පක්ෂය නියෝජනය කළත් අපි සියලු දෙනාට වගකීමක් තියෙනවා. අපි සියලු දෙනාගේ එකඟත්වයෙන් මෙය ඉදිරියට ගෙන යා හැකියි. හෙට හොඳ නායකයෙක් බිහිවෙන්න පුළුවන්. මොන දේශපාලනයක් බිහි වුණත් අපේ පක්ෂයෙන් අපි තරඟ කරනවා. නමුත් කුමන නගරාධිපතිවරයෙක් පත් වුණත් මහජන නියෝජිතයාගේ වගකීම මොරටුවේ ජනතාවගේ සුභ සිද්ධිය තකා මිස තමන්ගේ පටු වුවමනාවන් මුදුන් පත් කරගන්න නෙමෙයි. විටෙක තමන්ගේ සුහද මිතුරන් වෙනවා. විටෙක විරුද්ධවාදීන් බවට පත්වෙනවා. මේ දේශපාලනයේදී සදා කල් මිතුරොත් නැහැ. සදාකල් සතුරොත් නැහැ. එහෙමනම් මේ යන දේශපාලන ගමන් මගට මොරටුවේ මිනිසුන්ට යම් ශක්තියක් දීලා ගමේ පොදු කටයුතු නංවන්න පුළුවන් නම් ජනතාව අපි වෙනුවෙන් යම් තීරණයක් ගනීවි. අපේ මේ මොරටුව මහා නගර සභාවට 9 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් ඇතැම් දේශපාලන පක්ෂ වලින් මොරටුව මහා නගර සභාව නියෝජනය කරන්නට යම් පක්ෂයකින් යම් කෙනෙක් සූදානම් වුණා නම් ඒ පිරිසෙන් කොටසක් තමයි එදා සහයෝගය දුන්නේ. එහෙමනම් මම ඉදිරි වසර සඳහා වූ අයවැය ලේඛනයට පූර්ණ සහයෝගය ලබා දෙනවා. මොරටුවේ ජනතාව වෙනුවෙන් කරන්නාවූ ක්‍රියාදාමයන්ට දේශපාලන පක්ෂය කුමක් වුවත්, හෙට විපක්ෂයෙන් යම් යෝජනාවක් ගෙනාවොත් පූර්ණ සහයෝගය ලබා දීමට අපි කටයුතු කරනවා. මොරටුවේ මිනිසුන්ගේ ප්‍රශ්න කියන්න වෙන තැනක් නැහැ. එහෙමනම් අපි සියලු දෙනාම එකතු වෙලා ඉදිරි වර්ෂය සඳහා ජයග්‍රාහී ගමනක් යන්නට අපි කටයුතු කරමු. ඒ වගේම යම් කාර්යභාරයක් ඉටු කිරීමට නිලධාරීන් අපිට සහයෝගය දීලා තියෙනවා. නාගරික කොමසාරිස්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට, යසන්ත මහතා, දුල්සිරි මහතා, පෙර පාසල් නංවන්න කාර්ය භාරයක් ඉටු කරන තුල්සිකා මහත්මියට මොරටුව මහා නගර සභාව වෙනුවෙන් ස්තුතිය පිරිනමනවා. ඉදිරි වර්ෂයේදීත් ජනතාවගේ කටයුතු ඉටු කිරීමට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒකාධිපති වියරුව තියෙන ඒකාධිපතියෙක්ගේ අවසන් අයවැය අවස්ථාවේ කතා කරන්න සිදුවීම යම්තාක් දුරකට අපි කණගාටු වෙනවා. මොකද ඒකාධිපතිත්වය නිල වශයෙන් ඉවර වෙන්න තියලා මීට වසරකට උඩදි ඒකාධිපතිත්වය ඉවර වෙන්න ජනතා පරමාධිපත්‍ය අවසන් වුණාට පසුවත් තමන්ගේ ආණ්ඩුවේ පිහිටෙන් මොරටුව මහා නගර සභාවේ ජනතාවගේ මුදල් නාස්ති කරන මුලසුන හොබවන නගරාධිපතිවරයාගේ කිසිම ප්‍රයෝජනයක් නැති ඒකාධිපති වියරුවෙන් හදපු ලියවිල්ල සම්බන්ධයෙන් තමයි අපිට කතා කරන්න වෙලා තියෙන්නේ. සමහරු කිව්වා විපක්ෂය හැටියට කතා කරනකොට ද්වේශ සහගතව කතා කරනවා කියලා. පැහැදිලිව කියන්න ඕන ඒකාධිපති වියරුව කියන වචනය මම භාවිතා කරන්නේ ඒකාධිපතිත්වය සාක්ෂි පිටින්ම ඔප්පු කරන්න මේ ලියවිල්ල තුළින්ම. නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ මේ ලියවිල්ල තුළින්ම ඒකාධිපති වියරුවෙන් ඉදිරිපත් කරන ලියවිල්ලක් කියන ඒක සහතික කරන්නට පුළුවන්කම තියෙනවා. මේ ලියවිල්ලෙන්ම කොළේ වහන්න ගහලා තමයි පටන් ගන්නේ. මම බැලුවා විපක්ෂයේ මන්ත්‍රීවරු කවුරු හරි මේ ලියවිල්ල සම්බන්ධයෙන්

අවධානයක් යොමු කරයිද කියලා. ගරු නගරාධිපතිතුමා බොහොම ලස්සනට ව්‍යාකරණ හදලා තමන්ට නිලධාරීන් විසින් ගෙනල්ලා දුන් ඒ ලියවිල්ල බොහෝම ලස්සනට කියෙව්වා. මේ ලියවිල්ලේ ඡේදයක තියෙනවා "තවද මේ වන විට සාර්ථකව පවත්වාගෙන යනු ලබන සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන ගිනි භටයින් සඳහා ආරක්ෂිත ඇඳුම් සපයා ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබීම හා සෑම වසර 4 කට වරක් පමණක් අය කරනු ලබන විශේෂ ගිනි නිවාරණ මුදලක් අය කිරීමටත්, එම මුදල ඉහත කී පරිදි සේවක ආරක්ෂාව හා සේවයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා යොදා ගැනීමටත් කටයුතු කරන බව සඳහන් කරමි." ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න රටේ මිනිස්සු, මේ මොරටුව ජනතාව බොහෝම අමාරුවෙන් මේ තුන් වේල කනවා නම් කන්නේ. අද විදුහල්පතිවරයෙක්ගෙන් ඇහුවොත්, පංතිභාර ගුරුවරියකගෙන් ඇහුවොත් ළමයි පංතියට කෑම එක ගේන්නේ බොහොම අමාරුවෙන්. එදා ෆ්‍රයිඩ් රයිස් එකක් ගෙනාපු ළමයා අද එළවළුයි, බතුයි ටිකක් ගේන්නේ. බිත්තරයක් දකින්නේ සතියකට එක පාරක් නැත්නම් දෙපාරයි. මාළු කෑල්ලක් හොයාගන්න නැහැ. මස් කෑල්ලක් හොයාගන්න නැහැ. එහෙම කැපකිරීම් කරලා මිනිස්සු නගර සභාවට ඇවිල්ලා තමන්ට නඩු දායි නීතිමය පියවර ගනියි කියන බයට තමයි වරිපනම් බදු මුදල ගෙවන්නේ. වරිපනම් බදු ගෙවන්නේ ආසාවට නෙමෙයි, තියෙන බයට. නීතියට යටත් නිසා තමයි ඇවිල්ලා වරිපනම් බදු ගෙවන්නෙ. වරිපනම් බදු තමන්ගේ කැමැත්තක් නැතුව, සාක්කුව පාලනය කරගෙන බොහොම අමාරුවෙන් ගවෙන මේ මිනිස්සුන්ට තවත් බද්දක් එකතු කරනවා ගිනි නිවාරණ බද්ද වසර 4 කට වරක් පමණක් ගෙවන්න ඕන කියලා. මෙම බද්දෙන් නගරාධිපතිවරයා බලාපොරොත්තු වෙනවා ලක්ෂ 200 ක් වසරකට. 2023 වසරට ලක්ෂ 200 ක මුදලක් උත්පාදනය කරගන්න තමයි මෙතුමාගේ බලාපොරොත්තුව. ඊට අමතරව ගිනි නිවීමේ ගාස්තු 17 පිටුවේ 105 ශීර්ෂය. සේවා ගාස්තු - ගිනි නිවීම 2022 වර්ෂයේ ලක්ෂ 20 යි. එය එකපාරටම වැඩි වෙනවා ලක්ෂ 150 දක්වා. මම මේ කතා කරන්නේ පෙර කතා කළ වසර 4 කට එක් වරක් පමණක් ගෙවිය යුතු ගිනි නිවීම් ගාස්තුව ගැන නෙමෙයි. මම අහන්නේ ලක්ෂ 20 කොහොමද ලක්ෂ 150 වෙන්නේ එක පාරට. මොරටුවේ ඉන්න මිනිස්සු දුවගෙන ඇවිල්ලා සල්ලි දානවද? මෙහි සත්‍ය තියෙන්නේ ලක්ෂ 18 යි. 9 වෙනි මාසේ වෙනකම් මිනිස්සු ගිනි නිවීම සඳහා ගෙවලා තියෙන්නේ ලක්ෂ 18 යි. ඇස්තමේන්තු කළා ලක්ෂ 20 ක්. හරි ප්‍රශ්නයක් නැහැ. ඒ ඇස්තමේන්තුව අනුව ගෙවලා තියෙනවා. මම අහන්නේ ලක්ෂ 150 උපයගන්නෙ කොහොමද? සමහරු කියනවා මේ ලියවිල්ලට විරුද්ධ වුණොත් එහෙම ගමට කරන විරුද්ධත්වයක්ලු. මෙහි එක ශීර්ෂයක් පෙන්නන්න පුළුවන් නම් ගමට විරුද්ධ කමක් කියලා මේකට විරුද්ධ වුණොත් එහෙම. එය මහා අරුම පුදුම සිද්ධියක්. මේ අයවැයට වෙලාව වෙන් කරලා දෙන නිසා අපි අපහසුතාවයට පත්වෙනවා. අපිට ඕන විදිහට කතා කරන්න බැහැ. ගරු නගරාධිපතිතුමනි, 18 පිටුවේ තියෙනවා ලක්ෂ 200 ක් එක වරක් පමණක් අය කරන ගිනි නිවීමේ බද්ද උත්පාදනය කරගන්න නගරාධිපතිවරයා බලාපොරොත්තු වෙනවා. අනිත් එක තමයි 9 පිටුවේ ප්‍රාග්ධන වැඩසටහන් ආදායමේ, වැඩසටහන් 4 - භෞතික සැලසුම් කියලා 2022 වර්ෂයේ තියෙනවා ලක්ෂ 17000 ක්. එහි 2022.09.30 වෙනකොට සත්‍ය ආදායම ඇවිත් තියෙනවා රුපියල් 8,666,256 ක්. 2023 වෙනකොට රුපියල් 900 යි. මෙය මුද්‍රණ දෝෂයක්ද? මෙය මොකක්ද?

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, වැරැද්දක් නෙමෙයි මේ වෙලා තියෙන්නේ. පසුගිය වර අපේ අයවැය ලක්ෂ 37000 යි. භෞතික සැලසුම් කියන එකේදී මේ 2022 වර්ෂයේ ඇස්තමේන්තුව. 37000 ඉඳන් භෞතික සැලසුම් වලට ලක්ෂ 17000 හරි. මෙය වැරදි නැහැ. මෙය හරි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එතකොට මම අහන්නේ. ඒ ලක්ෂ 17000 එකපාරටම රුපියල් 900 වෙන්නේ කොහොමද? සත්‍ය තියෙනවා රුපියල් 8,666,256 ක්. මේක 900 වුණේ කොහොමද? ඊළඟට වැඩසටහන් 6 - මහජන උපයෝගීතා. මෙහි 2022 වර්ෂයේ මිලියන 4 යි. එය එකපාරටම මිලියන 30 වෙලා තියෙනවා. මම අහන්නේ එය වුණේ කොහොමද? ඉන්පසුව මම අහන්නේ කුණු කසළ මෙහෙයවීම සඳහා 2022 වර්ෂයේ ඇස්තමේන්තුව මිලියන 650 යි. එය මිලියන 120 ට අඩු වෙලා. එහෙම ඕන ඕන විදිහට මේ වසරේ සහ ලබන වසරේ විශාල පරතරයක් ඇතිවන්නේ

කොහොමද කියලා මම අහන්නේ? ඊළඟ එක මෙහි බොහොම ලස්සන කතන්දරයක් තියෙනවා. අපි හැමදාම කියන කතන්දරයක්. මේ නීති ගාස්තු. සමන්ලාල් ප්‍රනාන්දුගේ ඒකාධිපතිත්වය හොඳටම ප්‍රදර්ශනය වන තැනක් තමයි, වියදම් ඇස්තමේන්තුව නීති කටයුතු. 35 පිටුවේ 2022 ඇස්තමේන්තුව මිලියන 1.6 යි. වියදම් කරලා තියෙනවා මිලියන 6.6 ක්. එතකොට ලක්ෂ 16 ක් වෙන් කරලා තියපු ඇස්තමේන්තුවට ලක්ෂ 66 ක් වියදම් කරලා තියෙනවා. නීතිමය කටයුතු වලට එපමණ වියදමක් දරන්න සමන්ලාල් ප්‍රනාන්දු ගෙදරින් ගෙනාපු සල්ලි තියෙනවද? අපි හැමදාම අහන කතාවක්. මෙහි ආපහු ලක්ෂ 80 ක් වෙන්කරලා තියෙනවා ලබන වසරට. ලක්ෂ 80 ක් වෙන් කරන්න තරම් මේ මහා නගර සභාවේ නීතිමය කටයුතු මොනවද? මොකක්ද මේ විහිළුව? ඒකාධිපතිත්වය තියෙන මිනිහෙක් වියරුවෙන් කරන විගඩම් නිසා ඇති වන නඩු නිසා මොරටුවේ ජනතාවගේ මුදල් නාස්ති කරලා දානවා. ඒ නිසා පැහැදිලිව කියන්නට ඕනේ මෙහි වැදගත් දේවල් වලට තියලා තියෙන ඉඩ බොහොම අඩුයි. සෞඛ්‍ය, අධ්‍යාපනය ඉවරයි. සෞඛ්‍ය, අධ්‍යාපනයට රුපියල් 25,500 යි වියදම් කරන්න ඇස්මේන්තු කරලා තියෙන්නේ. 2022 වර්ෂයේ 9 වෙනි මාසේ වන විටත් සෞඛ්‍ය, අධ්‍යාපනයට රුපියලක්වත් වියදම් කරලා නැහැ. සමන්ලාල් ප්‍රනාන්දු අධ්‍යාපනයත් එක්ක තරහයි කියලා කියන්න හොඳටම තියෙන සාක්ෂිය තමයි මේක. මේ රටේ මිනිස්සුන්ට සෞඛ්‍ය කියන එක වැදගත් විෂයක් වෙලා තියෙද්දී සෞඛ්‍ය සම්බන්ධයෙන් මොරටුව මහා නගර සභාව දැනුවත් කිරීමේ වැඩසටහන බින්දුවයි. නමුත් බජව් දාන්න ලක්ෂ ගණන් වියදම් කරනවා. සාහිත්‍යාංජලී සඳහා ලක්ෂ ගණන් වියදම් කරනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෙ බජව් දැමිල්ල නෙමෙයි මොරටුවේ මිනිස්සු ඉල්ලන්නේ ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරලා දෙන්න කියලා. නමුත් කෝ පරිසරය නිර්මාණය කරන්න නගර සභාවේ ක්‍රියාදාමය. කෙනෙක් කියනවා මේකට හරියන්නේ නැත්නම් අළුත් එකක් සමන්ලාල්ට ඉදිරිපත් කළා නම් හරිලු. අලුත් එකක් ඕනේ නැහැ තමන්ගේ හදවතට තට්ටු කරලා අහන්න සමන්ලාල් ප්‍රනාන්දු කවදද තමුන් කියපු දෙයක් ඇහුවේ.

ගරු නගරාධිපතිතුමනි, මෙහි සංඛ්‍යාත්මකව ඔප්පු කරන්න පුළුවන් කරුණු කාරණා රාශියක් තියෙනවා. අද රටේ කොරෝනා වලට පසුව තියෙන ලොකුම ප්‍රශ්නය තමයි ඩෙංගු. මේ මොරටුව මහා නගර සභාව ඩෙංගු වලට මොකක්ද දීලා තියෙන සුවිශේෂීත්වය? ඩෙංගු මර්ධන ව්‍යාපාර ක්‍රියාත්මක වෙලා තියෙනවද? ඩෙංගු මර්ධන ව්‍යාපාරයට ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කරලා තියෙනවා. 2023 සඳහා ආපසු ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කරලා තියෙනවා. ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කරලා රුපියල් 151,200 යි වියදම් කරලා තියෙන්නේ. ලැජ්ජයි. මේ ඩෙංගු වලින් මිනිස්සු මැරෙනවා. රජය කියනවා ඩෙංගු මර්ධනය කරන්න පළාත් පාලන ආයතන වලට ක්‍රියාත්මක වෙන්න කියලා. ඒවා නෙමෙයි කරන්නේ. තමන්ගේ ප්‍රතිරූපය නංවාගන්නවා. සෞඛ්‍ය කමිටුවෙන් කරන්න ඕන දේවල් නෙමෙයි කරන්නේ. කරන්න ඕන දේවල් පැත්තකින් තියලා මහජන සෞඛ්‍ය පරීක්ෂක සමග එක්වෙලා පැළ ගෙනල්ලා පැළ බෙදනවා. පැළ බෙදන එක සෞඛ්‍ය කමිටුවේ කාර්යභාරය ද? මේකේ තව තියෙනවා. වෙලාව නැති නිසා කියන්න විදිහක් නැහැ. මදුරු තෙල් වලට වියදම් කරලා තියෙන ප්‍රමාණය. මදුරුවෝ පැටව් ගහනවා මොරටුවේ. තමුන් ලොකුම මහාචාර්යවරයා වගේ ඉන්නේ. ඩෙංගු මර්ධනයට වියදම රුපියල් 150,000 යි. මේ අන්තිම අයවැය තමයි වසර 15 ක් තුළ නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දුගේ කැතම අයවැය. මේ අයවැයට අපි මෙතන පැය ගණන් නාස්ති කරපු එකත් අපරාධයක්. අපි පැහැදිලිව කියනවා මේ මොරටු ජනතාවගේ මුදල් විනාශ කරන්න එපා. පැහැදිලිව අවසාන වශයෙන් කියන්න තියෙන්නේ එක දෙයයි. කවුරු කවුරුත් දැනගන්න ඕන දිට්ඨ ධම්මවේදනීය කර්මය තමන් පසුපස එනවා. ඒක නවත්වන්න කාටවත් බැහැ කියා මා ප්‍රකාශ කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ඉසුරින්කිත් යසසින් බබළන දා
ඔබගේ බැනුමත් ගීයක්වේ
ඉසුරින් කිත් යසසින් පිරිහුනුදා
සිනා සුනත් ඒය වරදක්වේ.

ගරු නගරාධිපතිතුමනි, මේ සුනිල් ආරියරත්න මහතා ලියලා නන්දා මාලනි මහත්මිය ගායනා කරපු ගිතයක්. ගරු නගරාධිපතිතුමනි මුලින්ම මම සුභ පතනවා ඔබතුමාගේ 15වෙනි අයවැයට

මේ 15වෙනි අයවැය ඉදිරිපත් කරන වේලාවේ 15වෙනි වතාවටත් ඒකට පක්ෂපාතිත්වය දක්වන්න හැකියාව ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙනවා.ගරු නගරාධිපතිතුමනි කලකදි වහලු කලකදි රස වෙනවාලු. අපිට පෙනවා මේ සභාව දිහා බලද්දි මෙහෙම කාලයක් උදාවෙලා තියෙනවා.ඒකනිසා අපිට කාලෙන් කාලේට සිද්ධවෙනවා අපේ පරණ වොෂින් මැෂින් එක කැඩුනාම අලුත් වොෂින් මැෂින් එකක් පාවිච්චි කරන්න.ඒකනිසා අපි වොෂින් මැෂින් කථා පැත්තකින් තියලා ගරු නගරාධිපතිතුමනි අයවැය විවාදය විශේෂයෙන්ම මම මතක් කරනවා සුනිල් නන්දසිරි ගරු මගේ සහෝදර මන්ත්‍රීතුමා මගේ කළ්‍යාන මිත්‍රයා. ඒතුමාගේ කථාවේදි මුලින්ම කිව්වා මේ සභාවට එන කොට අපි මොන්ටිසොරියේ ඔබතුමා ඔලේවල් කියලා. ඔව් අපි ඒක පිළිගන්නවා. ඔබතුමා අපිට උදව්කරා බොහෝම අපි නවක මන්ත්‍රීවරු වේලා ආවාම ඒ දවස්වල මේ ඉන්ධන දිමනා ගරු නගරාධිපතිතුමනි මේ සභාවේ නිකම් අත්සන් කරලා දුන්නේ නැහැ.ෆෝම් එකක් පුරවන්න ඕනේ. අපි අලුතින් ආව මන්ත්‍රීවරු විදියට අපි දන්නේ නැහැ ඔසඳ මන්ත්‍රීතුමා මම ගොඩක් වේලාවට සහෝදර නිලධාරින් උදව්කරා. ඒ හිතවත්කම් අපිට එහෙම ඉතිහාසය මතක මිනිස්සු. අපිටත් ඒක මතකයි. ඒ මතකයත් එක්ක තමයි යන්නේ සුනිල් නන්දසිරි මන්ත්‍රීතුමිට මතක් කරන්න ඕනේ. ඒතුමාගේ කථාවේ ගරු නගරාධිපතිතුමනි කථාකරේ ලුනාව රෝහල පිළිබඳව. ඇත්ත ලුනාව රෝහලේ අඩුපාඩු තියෙනවා. හැබැයි ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට මේකට දොස් කියන්න ඕනද නැද්ද කියලා අපි කල්පනා කරන්න ඕනේ.ඔබතුමාගේ විෂය පථයක් තුල නෙමෙයි ලුනාව රෝහල තියෙන්නේ.ඒක බස්නාහිර පළාත් සභාවට අයිති මධ්‍යම ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් හෝ තමයි ක්‍රියාත්මක වෙන්න ඕනේ.ඔබතුමාලා ගෙනාවා මතක ඇති. ඒකට සුනිල් නන්දසිරි මන්ත්‍රීතුමත් අපේ අනුරසිරි මන්ත්‍රීතුමත් ඒදා විවාදයක් තිබුනා ඉරාන් ඇමතිතුමා මොරටුවට ගෙනාවේ ඒතුමන්ලා කියලා හැබැයි යහපාලන ආණ්ඩුව ඇතුලේ අවුරුදු ගානක් රජයේ ප්‍රබල ඇමතිවරයෙක් විදියට හිටියා අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමාලා,රාජිත සේනාරත්න ඇමතිතුමාලා අරගෙන ඇවිල්ලා මුල් ගලක් තිබ්බා. ඔන්න ලුනාව හැදුවා ඒදත් කිව්වා නෑ මුල්ගල පැලවෙනවා. අදටත් ලුනාව රෝහල එහෙමයි.අපේ අශෝක ඉන්ද්‍රතිලක මන්ත්‍රීතුමා කිව්වා වගේ ගරු නගරාධිපතිතුමනි මොරටුවට අත්‍යාවශයම කාරණයක් මේ නගර සභාවේ ඇතුලේ අපිට පාලනය කරන්න බැරි වුනත් අපි මේක විශාල මැදිහත් විමක් කරලා මධ්‍යම ආණ්ඩුව මැදිහත් කරගෙන කලයුතු කාරණයක් බව අපි අවිවාදයෙන් පිළිගන්නවා.

ගරු නගරාධිපතිතුමනි මේ සභාවේ අදහස් ඉදිරිපත්වුනා අපේ පෙර පාසල් ගුරුවරු සම්බන්ධයෙන්. ඒ ගුරුවරියන් අලුත් තාලේට කටයුතු කරන්නේ නැති කාරණයක් පිළිබඳව. හැබැයි අපේ පාලන කාලය ඇතුලේ ගරු නගරාධිපතිතුමනි NQ ලේවල් 4 දක්වා ගුරුවරු 12ක් මේවෙනකොට ඒ මට්ටමට ගෙනල්ලා තියෙනවා.ඒවගේම එම් ජේ එෆ් ආයතනයත් එක්ක ළමා අපචාර සම්බන්ධයෙන් ඒ අවශ්‍ය පුහුණු වැඩසටහන් රාශියක් සම්බන්ධකරලා තියෙනවා. ලෝක බැංකු වැඩසටහන් ඇතුලේ සියලුම ගුරුවරු අද පවතින පෙර පාසල් විෂය ධාරාවට අනුව අපි අද පවතින පෙර පාසල් මුල් ළමාවිය සංවර්ධනයට අවශ්‍යකරන මූලික දැනුම ලබාදීලා තියෙනවා.අපි පළිගන්නවා අපෙත් පෙර පාසල් වල දරුවන් පැමිණීමේ යම් අඩුවක් තියෙනවා.හැබැයි ඒකට කරන්නට ඕනේ අපි කවුරුවත් ඒක විවේචනය කර කර ඉන්න ඒක නෙමෙයි.ඒකට යම් මැදිහත්විමක් කරන ඒක.ඔබතුමත් දන්නවා ගරු නගරාධිපතිතුමනි පහුගිය කාලේ ඇතුලේ මේක සෞඛ්‍ය කමිටුවට ද අයිති මේක වෙන කමිටුවකටද අයිති කියලා නෙවෙයි. හැබැයි අපි පුස්ථකාලය වෙනුවෙන් මැදිහත්විය යුතු වේලාවට පුස්තකාලය වෙනුවෙන් මැදිහත්වුනා.පෙර පාසල වෙනුවෙන් මැදිහත් විය යුතු වේලාවට අපේ මන්ත්‍රීවරු අර කමිටුව මේ කමිටුව කියලා බල බල හිටියේ නැහැ. ඒකට මැදිහත් වුනා.ඒක මිනිස්සුන්ගේ අවශ්‍යතාවය තේරුම් අරගෙන මහජන නියෝජිතයෝ විදියට ඒකට අවශ්‍ය මූලික කටයුතු අපි අපිට පුලුවන් විදියට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විදියට ඒ අවශ්‍ය කටයුතු කරලා තියෙනවා.මම ස්තුතිවන්ත වෙන්න ඕනේ ගරු නගරාධිපතිතුමනි අපේ කටුකුරුන්ද සාගරිකා පෙර පාසල අවුරුදු ගානක් අපිට පවත්වාගෙන යන්න නොහැකි තත්වයක තිබුණා.නමුත් අද එය අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් විදියට පත්වෙලා. ඔබතුමාගේ නායකත්වයෙන් අපි ඒ පෙර පාසල විවෘත කරලා කටයුතු කරගෙන යනවා.අපි ඒවායේ අඩුපාඩු අනෙක් පෙර පාසල්වලත් අඩුපාඩු තියෙනවානම් එකත් හොයා බලලා අවශ්‍ය කටයුතු කරන්නට ඕනෙ.ඒවගේම මේ හෙම්බත්වෙන,බිම්බත්වෙන,හාමත්වෙන වෙන

කාරණා ගැන සජිත් මන්ත්‍රීතුමා කථාකරා.හැබැයි එහෙම කියපු අද වල්මත්වෙලා ඉන්න සමහර හිටපු ඇමතිවරු දැන් පින්බත් කකා ඉන්න නැහැ කියලා හෙට අනිද්දා ඇමතිකමක් ගන්න තියෙන ආරංචියත් එනවා. ගරු නගරාධිපතිතුමනි ඒකත් අපි එතුමාට මතක් කරන්නට ඕනේ.ඒ යකඩ මිනිසා තව නොබෝ දිනකින් ආණ්ඩුවේ ඇමතිවරයෙක් බවට පත්වෙන බවත් මේ මොහොතේ මතක් කරන්නට ඕනේ.ඒවගේම ගරු නගරාධිපතිතුමනි මේ සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයා විදියට මම විශේෂයෙන් මතක් කරන්නට ඕනේ. අපිට පහුගිය සභාවකත් චෝදනාවක් ඒල්ල වුනා. මේ ගොඩනැගිලි හදන්නේ කොහොමද සෞඛ්‍ය කමිටුවේ කියලා. ඒවගේ කොන් කැල්ලක් දැම්මා.ගරු නගරාධිපතිතුමනි සෞඛය කමිටුව අපේ සායන පවත්වන ගොඩනැගිලි ඒවා අඩුපාඩු කියන්නේ. අපේ සායන වලට අපි සතුටු වෙනවා ගරු නගරාධිපතිතුමනි පහුගිය අවුරුද්ද ඇතුලත මොරටුව මහා නගර සභාවේ සායන වල අඩුපාඩු විශාල ගණනාවක් සෞඛ්‍ය කමිටුව මැදිහත්විමෙන් අපිට නිවැරදිකරන්න පුලුවන්වුනා. අපිට දැනට තියෙන ටිඑල්සි පුස්ථකාලය තියෙන සායනයත්,කඩලාන සායනයේ අඩුපාඩුත් ඇතුලු සියලු සායනවල මූලික අවශ්‍යතාවයන් ටික අපි අවසන් කරලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි.මේ රටේ ඇත්තටම ප්‍රශ්ණයක් තියෙනවා මේ රටේ මිනිස්සු අමාරුවෙන් ජීවත්වෙන්නේ.හැබැයි අමාරුවෙන් ජීවත්වෙනවා කියලා කවුරුවත් තාත්තලා අම්මලා තමන්ගේ දරුවෝ බඩගින්නේ තියන්නේ නැහැ නගරාධිපතිතුමනි.තාත්තලා අම්මලා දුක් මහන්සිවෙලා පුලුවන් දෙයක් කරලා හොයලා තමන්ගේ දරුවෝ පෝෂණය කරනවා. හැබැයි තමන් රස්සාවක් කරලා දරුවන්ට කන්න දෙන්නේ නැතිව කාගේ හරි ටික්ටොක් එකක් බලාගෙන ඉන්න තාත්තලාට එහෙම ප්‍රශ්න ඇති. හැබැයි කොයි තාත්තත් පුලුවන්නම් තමන්ගේ දරුවෝ පෝෂණය කරන්න තමන්ගේ දරුවන්ට කන්න දෙන්නේ නැතිව ලෝකේ ගැන කථාකරන තාත්තලාට ඒහෙම ප්‍රශ්න ඇති.ඒක නිසා ගරු නගරාධිපතිතුමනි හැබැයි අපේ දරුවෝ අපි බෝහොම අමාරුවෙන් හරි පෝෂණය කරනවා.මොරටුවේ දරුවන්ව පෝෂණය කරන්න ඒ අම්මලා තාත්තලා කටයුතු කරනවා.හැබැයි මොරටුව මහා නගර සභාව ගරු නගරාධිපතිතුමනි මොරටුව මහා නගර සභාව විශාල වශයෙන් මැදිහත්වෙන්න ඕනෙයි කියන කාරණාව අපි අවිවාදයෙන් පිළිගන්නවා ගරු නගරාධිපතිතුමනි. විශේෂයෙන්ම අපේ නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා මීට කලින් සභාවකත් මතු කරා අපේ අයවැයේ තියෙනවා පාසල් දරුවන්ට පොත්බෙදා දෙන්න.නමුත් මේ වසරේ පහුගිය කාලේ තිබ්බ තත්ත්වයන් ඇතුලේ අපිට ඒ කටයුත්ත යම් ප්‍රමාදයක් සිද්ධ වුනත් දැන්මේ අවශ්‍යම සුදුසුම වේලාව කියලා පෙරේදා පලමුදා අපිත් ඒක්ක සාකච්ඡාවේදි කිව්වා.අපි මේ වර්ෂයේ තියෙන මුදලුත් ලබන වර්ෂයේ වෙන්කරලා තියෙන මුදලුත් ඒ සියල්ල එකතු කරලා ඉතාම ඉක්මණින් මොරටුවේ දරුවන් වෙනුවෙන් ඒ පොත් බෙදා දිම මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා ඔබතුමා ඉතාම හොද පුරුවාදර්ශයක් දුන්නා පොත් ලබාදිමේදි ආණ්ඩු පක්ෂය විපක්ෂය කියලා හිතන්නේ නැතිව ඒ විපක්ෂයේ මන්ත්‍රිවරුත් මහජන නියෝජිතයෝ ඡන්දයෙන් ආවාද නැද්ද ඒ කාරණා සිතන්නේ නැතිව ඒ අයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි අද මේ මොරටුවේ කසල කලමනාකරනය පිළිබදව කථාකරලා තියෙන නිසා මම ඒගැන වැඩිය කථාකරන්නේ නැහැ.මේ සභාවේ අදහසක් ඉදිරිපත්වෙච්ච නිසා මෙහෙවර නමින් මොරටුව මහා නගර සභාවේ සෞඛ්‍ය කමිටුව ප්‍රධානත්වය අරගෙන මොරටුවෙ සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ග්‍රාම සේවා වසම් 42ක අපි මේ ක්‍රියාත්මක කරනවා පැල බෙදාදිමේ වැඩසටහන.අද ඒ වැඩසටහනට විශාල ජනතා ප්‍රසාදයක් තියෙනවා ඒකට හේතුව තමයි ඔවුන් විසින් අපිට භාරදෙන කසල ටික අපි පොහෙර බවට පත්කරලා ඔවුන්ට ලබාදෙන වැඩසටහන මේක ඇතුලේ තියෙනවා.නිකම් පැල ටික දෙනවා ඔවුන්ට දැනුම දෙනවා.ඒ වැඩසටහන ගැන මිනිස්සුත් එක්ක ජීවත්වෙන මිනිස්සුත් එක්ක කටයුතු කරන මිනිස්සුත් එක්ක ගණුදෙනු කරන අය දන්නවා ඒකේ වටිනාකම. ඒහෙම නැතිව මම සතුටින් කියනවා මේ මොහොත වෙනකොට ග්‍රාමසේවා වසම් 42න් 21ක අපි මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා තියෙනවා. ඉදිරි මාස දෙක ඇතුලත මුලු මොරටුවම ආවරණය වන පරිදි අපි මේ වැඩසටහන අවසන් කරනවා. ගරු නගරාධිපතිතුමනි.ඒවගේම ඒහි පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක කරලා එයත් ඉතා හොදින් ක්‍රියාත්මක වෙන වෙලාවක්. නැවත වතාවක් විශේෂයෙන්ම මේ සභාවේ ඔබතුමා ගෙනාව අයවැයට අපේ සුභාශිංශන ඉදිරිපත් කරන ගමන් මේ වර්ෂය තුලත් අපිට අවශ්‍ය කටයුතු කරගෙන යන්නට ඔබතුමත් නියෝජ්‍ය නගරාධිපතිතුමත් විපක්ෂ නායකතුමා ප්‍රධාන මේ මන්ත්‍රිවරුත් නාගරික කොමසාරිස්තුමා ප්‍රධාන සියලුම නිලධාරින්

අපිට ලබාදෙන සහයෝගය විශේෂයෙන්ම අපේ වැඩසටහන ඇතුලෙත් ප්‍රධාන මහජන පරික්ෂකතුමා ඒ ලබාදෙන සහයෝගයත් අපි නැවත වතාවක් සිහිපත් කරමින් ඔබ සියලු දෙනාටත් මොරටුව ජනතාවටත් ජයවේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මා විශේෂයෙන්ම සතුටට පත්වෙනවා හා සංතෝෂයට පත්වෙනවා මේ අවස්ථාවේ 2002 මැතිවරණයේදි ඔබතුමාලා සුරංග මන්ත්‍රිතුමා එදා මැතිවරණයට ඉදිරිපත්වෙලා මේ සභාව වසර 19ක් නියෝජනය කරනවා. සුලු ප්‍රමාණයක් ඡන්ද ප්‍රතිඵල අඩුවුන නිසා මටත් ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමාටත්, සුජිත් මන්ත්‍රිතුමාට, තිලකසිරි මන්ත්‍රිතුමාට මේ සභාවට එන්න බැරිවුනා.ඊට පස්සෙ මහ මැතිවරණට එනවා මහා මැතිවරණයේ දි වන්දන කත්‍රිආරච්චි මැතිතුමාව හමුවුනාම ඔබතුමා කියනවා එයාලට දේශපාලන වශයෙන් උදව් ගන්න අවශ්‍ය වුනාම ඔබතුමාගෙන් ඇහුවාම ඔබතුමා මාව හඳුන්වලා දුන්නා මොරටුවේ ඉන්න හොඳම පරාජිතයා සමන්ත සිල්වා. ඒතුමාව හම්බවෙන්න කියලා. ඒ මොකද අපේක්ෂකයෝ විශාල පිරිසක් එක්ක තරග කරලා ප්‍රබලයෝත් එක්ක තරග කරලා ඡන්ද දෙසිය ගානක් අඩුවුනා. නමුත් අද සංතෝශවෙනවා අද ඔබතුමාලා දෙපල මෙතන ඉන්නවා අපි පෞද්ගලිකව අගය කරනවා සතුටුවෙනවා.ඉතින් ඒවගේම තමයි අවුරුදු 15ක් මේ සභාවේ මන්ත්‍රිවරයෙක් වශයෙන් නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් අයවැය වාර්තාවන් 15ක් සම්මත කරගන්නට අපි හැමදෙනාම දායකවුනා.යම් අවස්ථාවලදි විවිධ මත වාද අපි තුල තිබුණා.අයවැය පැවැත්වෙන අවස්ථාවලදි ඒතුලදිත් විවිධ ගැටලු අපිට වෙච්ච සිදුවීම් නිසා සමහර දේශපාලනික හානි නිසා විවිධ මතවාද තිබුණත් අපි අවසානේදි එකතුවෙලා අපි අයවැය සම්මත කරගෙන මේ ගමන මේ දක්වා ආවා.මම හිතනවා පැහැදිලිවම ඉදිරි වසරේ අයවැයක් ඉදිරිපත් කරන්න කලින් අපිට මැතිවරණයකට යන්න වෙනවා කියලා මම විශ්වාස කරනවා.ඒනිසා මම විශේෂයෙන්ම සුභ පතනවා ඔබතුමාටත් ඒවගේම මේ සභාව නියෝජනය කරන ජෙෂ්ඨ මන්ත්‍රිවරු,අපේ විපක්ෂ නායකතුමා ඇතුලු ජේෂ්ඨ මන්ත්‍රිවරු,ඒවගේම නවක මන්තිවරු සමග අද යම් යම් ගැටලු මොන මොන මතවාද තිබුණත් අපි එකා වගේ මේ සභාවේ මහන්සිවෙලා අපි හැම දෙනාම ජනතාව වෙනුවෙන් වැඩ කරන්න පක්ෂ ජනතා විමුක්ති පෙරමුණ, ඒවගේම එක්සත් ජාතික පක්ෂය,සමගි ජනබලවේගය නියෝජනය කරන අය ඒවගේම අපේ ජාතික නිදහස් පෙරමුණ,පිවිතුරු හෙළ උරුමය ඒ සියලුම මන්ත්‍රිවරු අපි හැමදෙනාම උස්සාහ කරේ හැම අවස්ථාවේම නිලධාරින් සමග වාද විවාද වෙලා රණ්ඩු කරගෙන මත ප්‍රකාශකරලා මිනිස්සුන්ට උපකාර කරන්න.ඒනිසා අපි කවුරුත් මහජන නියෝජිතයෝ වශයෙන් ගොඩාක් උත්සාහ කරනවා මහජනතාවට උදව් කරන්න.අපි අයවැය අවස්ථාවන් 15කට මුහුණ දුන්නත් මම විශ්වාස කරනවා මගේ මේ පෞද්ගලික තරහක් මුකුත් එහෙම නෙමෙයි. අපි ප්‍රකාශ කරන්නේ මේ අවස්ථාවේ මම දේශපාලනික වශයෙන් ජනතාවට මගේ පැත්තේන් මම උදව් කරලා තියෙනවා.මොන දේ තිබුණත් අපි යම් යම් අඩුපාඩුකම් මැද්දේ විවිද දේවල් සමග අඩුවෙන්ම වැඩ කොටසක් කරන්නට ලැබුණු නියෝජ්‍ය නගරාධිපතිවරයා මම කියලා මම විශ්වාස කරනවා.නමුත් ඒ පිළිබඳව මගේ කිසිම තරහක් කහටක් මේ කිසිකෙනෙක් සමග නැහැ. නමුත් අද යම් බාධක වලට මුහුණ දුන්නත් උදාහරණ වශයෙන් මම කියනවා පසුගිය කාලේ අපි අයවැයෙන් වෙන්කරන ප්‍රතිපාදන ටික ඔබතුමා සමග ආරවුලකුත් ඇතිවුනා. අපේ ප්‍රදේශයෙ අඩි 20ක පමණ කාණු කැල්ලක් දාන්න ඒවට ලොකු වශයෙන් මහන්සි වෙන්න සිද්ධවුනා.ඔබතුමත් එක්ක රණ්ඩු කරන්න සිද්ධවුනා. මට ඒවගේම ඉංජිනේරු මහත්තයත් එක්ක ටීඕ මහත්තයත් එක්ක රණ්ඩු කරන්න සිද්ධවුනා.හැබැයි ඒ ඒවෙලේට විතරයි.මොකද අපි මිනිස්සුන්ට වැඩකරන්න අන්න ඒවගේ විවිධ ගැටලුත් ඒක්ක මේ ගමන ආවා.ඒනිසා කොහොම වුනත් අපි හැමදෙනාම උස්සාහ කරන්නේ මිනිස්සුන්ට උපකාර කරන්න.ඉතින් අපි මේ ගමන ඉස්සරහාටත් මම හිතනවා මේ මොරටුවේ දේශපාලනය කරපු අය වශයෙන් අපි හැමදෙනාම ඉදිරි සභාව නියෝජනය කරනවානම් මම ඇත්තටම මම පෞද්ගලිකව කැමතියි.හැමකෙනෙක්ම මොරටුවේ ජනතාවට උදව් කරන්න තමයි ඉන්නේ.ඉතින් ඒනිසා මගේ අවංක සුභ පැතුම් මේ අවස්ථාවේ පුදකරනවා. මොකද අපිට අපේ මන්ත්‍රිවරු හැමදෙනාම මේ ගමන ආපු එක පිළිබඳව අපේ සුභපැතුම මේ අවස්ථාවේ පුදකරනවා.ඒවගේම ගරු නගරාධිපතිතුමනි,මෙහි තක්සේරු කරපු දේපල සංඛ්‍යාව 67568ක් වශයෙන් මේ අවස්ථාවේ සඳහන්වෙනවා අයවැය ලේඛනයේ.ඒවගේම අපේ පවුල් සංඛ්‍යාව 42402ක් වශයෙන් සඳහන්වෙනවා.අපේ ජනගහනය වශයෙන් ගත්තොත්

179514ක් මේ මොරටුවේ ජනගහනය වශයෙන් නියෝජනය වෙනවා.ඉතින් ඒනිසා අපි දන්නවා මේ අවස්ථාවේ අපි ලොකු ලොකු සංවර්ධන වැඩ වලට මේ අයවැය නොගියත් ගිය නැත්තේ මොනවාහරි අපේ තියෙන අරමුණු මධ්‍යම රජයෙන් ලැබෙන ප්‍රතිපාදන පිළිබඳව අපිට බලාපොරෝත්තුවක් නැතිනිසා අපේ සභාවේ අරමුදලින් අපි බිලියන 30ක තිබුණු අයවැය බිලියන 1.28 අපි ගිහිල්ලා තියෙනවා.මම විශ්වාස කරනවා මේතුලින් අපේ සුරේශ් ඉන්දික මන්ත්‍රීතුමාත් ප්‍රකාශකරා සමහර මන්ත්‍රීවරුන්ගෙන් මේ අදහස් ආවා.අපි මේ ලංකාවේ ආර්ථිකය දියුණු කරන මේ රටට මේ රටේ ආර්ථිකය නංවන්න පුලුවන් වැඩපිලිවෙලකට අපි මොරටුවක් වශයෙන් ඒ මුදල් යොදවලා අන්න ඒවගේ වැඩ සටහන් වලට යමු කියන ඒක මගේ අදහසක් වශයෙන් මම ප්‍රකාශකරනවා.විශේෂයෙන්ම අපි නිකම් කල්පනාකරලා බලමු 1948 සුද්දාගෙන් නිදහස ලැබුණාට පසුව ඩී.එස්. සේනානායක මහත්තයාගේ පුත්‍රයා අපේ ඩඩ්ලි සේනානායක මැතිතුමා ඒතුමා අපි අහලා තියෙනවා ඒතුමාගේ කාලේ විශාල වශයෙන් වැඩ කොටසක් කරලා කෘෂි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත වෙලා තිබුණා.නමුත් ඒ වැඩසටහන අද ගලාගෙන ආවේ නැහැ.ඒ දියුණුවෙච්ච දේ අපි රැක ගත්තේ නැහැ.ඉන් එහාටත් බිහිවෙච්ච දේශපාලඥයන් ඉන් එහාට පත්වෙච්ච අපේ රාජ්‍ය නිලධාරීන් මේ අය මේක පවත්වාගෙන ආවානම් අපි අද මේවැනි ආර්ථික ආහාර හිඟතාවයන්ට මුහුණ දෙන්න සිද්ධවෙන්නේ නැහැ.ඒනිසා ඒවගේම තමයි අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒතුමිය අරගෙන ආපු කර්මාන්ත ව්‍යාපෘති ටික අද අපි මේ ආර්ථික හානියට මේ මුදල් හිගයට අපි මුහුණ දෙන්නේ නැහැ.ඇයි අපිට බැරිවුනේ කියන ඒක තමයි අපි හොයන්න ඕනේ.විශේෂයෙන්ම ඉන්පස්සේ ජෙ ආර් ජයවර්ධන මහත්තයා විශේෂයෙන් වගකියන්න ඕනේ එතුමා.විවෘත ආර්ථිකය ඇතිකිරිම තුල ඕනවටත් වඩා අන්න එතනින් කඩා වැටුනා කියලා විශ්වාසය තියෙන්නේ. අපි එකතුවෙලා අපි හැමදෙනාම ඒ අඩුපාඩු මොනවාද අපිට එහෙම වුනේ ඇයි අපි එහෙමනම් ඊලගට ගමන්කරන්න ඕනේ මොකක්ද ඊලගට මේ රට මින් එහාට මේ තත්වය ඇතිකරනවාද කියන අරමුණ ඇතිව කටයුතු කරන්න ඕන කියලා මම විශ්වාස කරනවා.ඒනිසා මේ අයවැයෙන් අපි වෙන් කරපු මිලියන 1.27 මුදල අපි එකත් අරමුණු කරගෙන කටයුතු කරමු කියන ඒක මම බලාපෝරොත්තුවෙනවා.ඒ අනුව යම් වැඩසටහන් දියත් කරලා අපි මොනවාහරි වැඩසටහනක් මොරටුවේ හදලා දැන් ඉදිරියේදි ඇතිවෙන ජාතික ප්‍රතිපත්තියට සමගාමීව අපිත් වැඩපිළිවෙලක් කරමු කියන ඒක අපි සභාවක් වශයෙන් නියෝජ්‍ය නගරාධිපති වශයෙන් ඉල්ලීමක් කරනවා.ඒවගේම ආදායම් මාර්ග වශයෙන් අපි සභාවට මීට වඩා ආදායම් මාර්ග හදන්න පුලුවන් කම ගොඩාක් තියෙනවා. මම මගේ පෞද්ගලික අදහසක් වශයෙන් මම විශ්වාස කරනවා කාණුවෙන් අයින් කරන පස් ටිකෙනුත් අපිට මුදලක් අයකරගන්න පුලුවන් තත්වයක් තියෙනවා.ඒවගේම තමයි දැන් ඔබතුමා අපේ ආණ්ඩුකාරතුමා අපිට ලබා දීලා ඒ ක්‍රෂර් දෙකක් ගෙනල්ලා තියෙනවා. ඒ ටයිල් කැලි විදුරු කැලි මේ ඔක්කෝම ක්‍රෂ්කරලා මේකෙන් ලොකු දෙයක් සිද්ධවෙනවා ඇත්තටම.ඒනිසා ඒ පස්ටික ඒවගේම මේ කාණුවලින් ඉතිරිවෙන පස්ටික මේ මොරටුව පුරා තැනින් තැන් වල කොන්ක්‍රීට් කැලි,කලු ගල් කැලි,කබොක් කැලි,ගොඩනැගිලි ද්‍රව්‍ය දාලා පැත්තකට දාලා තමන්ගේ ඉඩම ඉස්සරහා සමහරු විසිකරලා දාලා තියෙනවා.පාරවල්වල හැමතැනම තියෙනවා.අපිට පුලුවන් ඒ අයගේ යම් මුදලක් අරගෙන ඒ පස්ටික අපේ සභාවේ කොහෙහරි පෙදු තැනකට ගිහිල්ලා දාලා පස්කඳු ගහලා මේවා විකුණන්න පුලුවන්. අපිට අද එහෙම ව්‍යාපෘති කරන කට්ටිය ඔබතුමාට දකින්න පුලුවන් උදාහරන වශයෙන් කුණුවත්ත පැත්තට යනකොට පස් කඳු ගහලා එගොල්ලෝ ටිපර්දාලා ඒ ජෙසිබි අරගෙන අපිට සම්පත් තියෙනවානේ.අපිට වසරකට කෝටි ගානක් හොයාගන්න පුලුවන් තත්වයක් තියෙනවා.අන්න එවැනි ආදායම් මාර්ගයක් අපි ලැස්තිකරමු.සුදානම් කරන්න පුලුවන්නම් ඒක හොඳ වැඩසටහනක්. එවගේම අපි ඇත්තටම අපේ කොම්පෝසට් ව්‍යාපෘතියක් අපි හැමදාම කථාකරා. මම ඉල්ලීමක් කරනවා මේ ව්‍යාපෘතියත් අපි ඉක්මණට පටන් ගමු පටන්ගෙන මේ රටේ තියෙන පොහොර ප්‍රශ්නයට රසායනික පොහොර වෙනුවට අපි අපේ කාබනික පොහොර නිෂ්පාදනය කරන වැඩසටහනක් අරගෙන අපි දායක වෙමු.ඒකත් ඔබතුමාගේ අවධානයට ගන්න විශේෂයෙන්ම අපිට පුලුවන් මේවා ජලසම්පාදන මණ්ඩලයේ අපේ එහා පැත්තේ තියෙන පොම්පාගාර ඒක මොරටුව තුලම තියෙන්නේ.ඒකෙන් ඔබතුමා අපි පරික්ෂණ චාරිකාවට ගිය වෙලාවේ දැක්කා විශාල කොටසක් පොහොර සදහා ගන්න පුලුවන් දෙවල් තියෙනවා.ඒ අය ඒවා අහක දාලා කඳු ගහලා තියෙනවා.මේ ටික එකතු කරලා ඉවරවෙලා අපි කොම්පොස්ට් ව්‍යාපෘතියට ගත්තා නම් අපිට ලොකු දෙයක් ඒතුලින් නිෂ්පාදනය කරන්න පුලුවන්.ඒවගේම අපි

දකිනවා අද බොල්ගොඩ ගග ගත්තෝත් මේ බොල්ගොඩ ගගේ විශාල වශයෙන් ජපන් ජබර කියන ශාකය වැවෙනවා.මේ ජපන් ජබර ශාඛය ඇත්තටම හොදම අමුද්‍රව්‍යයක් වශයෙන් සදහන් කරන්න පුලුවන්. කියලා අපිට දැනගන්න ලැබිලා තියෙනවා. මේ කොම්පොස්ට් පොහොර නිෂ්පාදනයෙන්.එනිසා ඒවා අපිට ගන්න පුලුවන් ලේසියෙන්ම අපි ගාව බෝට්ටු තියෙනවා අපි ගාව යාන වාහන තියෙනවා.මේවා එකතු කරලා අරගෙන මේ කොම්පොස්ට් නිෂ්පාදනයට මේවා දායක කරගන්න පුලුවන්.අන්න ඒවැනි වැඩ සටහන් ටිකක් කරන්න.එතකොට සභාවේ ආදායම් මාර්ග වැඩි කරගන්න පුලුවන් කියන ඒක මම විශ්වාස කරනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි අපි ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා සදහන් කරා. ඒතුමා වගා වැඩ සටහන පිළිබදව අපිව දැනුවත් කරා. මම හිතනවා අපේ සභාවේ පොදු ස්ථාන තියෙනවා අපි අපේ සභාව සතු ඉඩ කඩම් තියෙනවා. ඒවායෙන් අපිට වගා ව්‍යාපෘති කරන්න පුලුවන්.ඒවැනි වැඩසටහන් දියත් කරන්න කියලා මම ඉල්ලිමක් කරනවා. කසල කලමනාකරන වැඩසටහනේ ඇත්තට ඒ පිළිබදව ලොකු අගයකිරිමක් කරන්න ඕනේ ඔබතුමාගේ මහන්සිය එවගේම අපේ සෞඛ්‍ය කමිටු සභාපතිතුමන්ලා හිටපු ඔසඳ මන්ත්‍රිතුමා අපේ ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා ඒ සෞඛ්‍ය කමිටුව නියෝජනය කරපු සභාපතිවරු මේ සදහා දායකත්වය ලබා දුන්නා. ඉතින් එකේ හොද වැඩ කොටසක් වෙනවා. අපි අගය කරන්න ඕනේ.ඒවගේම තමයි ඒකේ සිදුවෙන යම් දෙයක් තියෙනවා මේකේ විකුණන කොටස් ටික ඔබතුමා යම් දෙයකට සිරගතවෙලා ඉන්න වෙලාවේ තින්දුවක් ගත්තා මෙහි මිලගණන් කැදවලා මේක දෙන්න.ඇත්තට එතකොට වැඩි ප්‍රතිලාභයක් සේවකයන්ට දෙන්න පුලුවන්. සභාවටත් ගන්න පුලුවන් පත්තරයේ දානවානම් මීට වඩා ගානකට යන්න පුලුවන්. එහෙම නැත්නම් ප්‍රාදේශිය වශයෙන් මිල ගණන් කැදෙව්වෝත් ඒ අපිට ඇතිවෙන මේකෙන් ගසාකනවා මේකෙන් යම් අයට සල්ලියනවා කියන ඒ මතවාදය දුරු කරලා කාටත් සභාවේ මන්ත්‍රිවරු කිසිකෙනෙක්ට අපකිර්තියක් නොවන ආකාරයෙන් මේ වැඩ කොටස කරන්න ඔබතුමාගේ අවධානය යොමුකරන්න කියලා ඉල්ලිමත් කරනවා. ඔබතුමා මේ සභාව නියෝජනය කරපු නැති අවස්ථාවක ඔබතුමා ඇතිකරපු ඉන්ධන පිරවුම්හල ඇත්තට අපි ඒක අගය කරන්න ඕනේ මොකද ඒක නොතිබුනානම් විශාල අපහසුතාවයට පත්වෙනවා.මේ කටයුතු ඩීසල් ටිකෙන් ඔක්කෝම කරගෙන යනකොට අපිට පෙට්‍රල් ටික ගන්න විශාල වශයෙන් මහන්සිවුනා. කොමසාරිස්තුමා දන්නවා අවස්ථා ගානක අපි ෂෙඩ් එකත් එක්ක රණ්ඩු කරන්න සිද්ධවුනා. කොහොම හරි පෙට්‍රල් ටික ගන්න බැරිවුනා. අපිට ඉන්ධන පොම්පේ තිබ්බේ නැත්නම් අපිට මේ සභාවේ කටයුතු කරගෙන යන්න බැරිවෙනවා. අපි ඇත්තට අන්න ඒ වැඩ කොටස අගය කරනවා.අවසන් වශයෙන් ඉල්ලිමක් කරනවා අපේ කොමසාරිස්තුමා ඇතුලු නිලධාරින් විශාල වශයෙන් කැපකිරිම් කරනවා,උනන්දු වෙනවා,මහන්සි වෙනවා. ඒ අයවෙනුවෙන් මගේ යෝජනාවක් තියෙනවා. රක්ෂණ ක්‍රමයක් දවසකට රු 3ක් වැනි මුදලක් තමයි අවුරුද්දටම රු1500ක් වගේ මුදලක් යටත්ව යම් රක්ෂණ ක්‍රමයක් මම හදුනගෙන තිබෙනවා.ඒ වැඩකොටස කරන්න සේවකයෙක්ගෙන් දවසකට යන්නේ රු30 ක් වගේ පොඩි මුදලක්. ඒතුලින් කොමසාරිස්තුමා ඇතුලු පහල සේවකයා දක්වාම යම් රක්ෂණාවරනයක් ලබා දෙන්න යම් වැඩ කොටසක් තියෙනවා. ඒ සදහා සහයෝගය දෙන්න කියන ඉල්ලිම කරමින් ලබන්නාවූ නත්තල සහ ලබන්නාවූ නව වසර හැම දෙනාටම සාමය සතුට සෞභාගය සපිරි ආර්ථික හිහකමින් තොර වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රි - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2002 හා 2006 කාල සිමාවේදි මම නගරාධිපතිවෙලාපසුව ඔබතුමා ජයග්‍රහනය කරලා මේ ස්ථානයට ආවාට පස්සේ මා විපක්ෂයේ වාඩිවෙලා හිටියේ එදා ඉදලා මම අනුගමනය කරපු ඒක දෙයක් තිබුණා. ඒක තමයි ඒ හැම අයවැය විවාදයකදිම මම දැරුවේ එක මතයයි. මම අදත් ඒ මතය දරණවා.විපක්ෂ නායක වුනත් ඒක තමයි මම දන්නවා නගරාධිපතිවරයෙකුට අයවැයක් ඉදිරිපත් කිරිමේදි වැඩ කලයුතු රාමුව මොකක්ද කියලා.ඒ රාමුවට හිරවෙලා අවුරුදු 4ක් මමත් අයවැය ඉදිරිපත් කෙරුවා.ඒම නිසා මම දන්නවා මේ ඉලක්කම් එහාට මෙහාට කරලා තමයි මේ කටයුත්ත කරන්න පුලුවන්. පාර්ලිමේන්තුව වගේ බලයක් නැහැ. ජනතාවට විවිධ ආකාරයේ වරප්‍රසාද අපිට දෙන්න.ඉන්කම් ටැක්ස් අඩුකරන්න. අපේ වෙන වෙන ටැක්සස් අඩුකරන්න අපිට එහෙම බලයක් නැහැ.නමුත් නගරාධිපතිවරයාට විශේෂ වරප්‍රසාධයක් තියෙනවා. ඒක තමයි හදිසි අවස්ථාවකදි කිසිම කෙනෙකුගේ අවසරයක්

නොමැතිව හරි තමාගේ අභිමතය පරිදි ඒ හදිසි අවස්ථාව අනුව අපදාවකදී තමුන්ට මුදල් පාවිච්චිකරන්න පුලුවන් ඒක පමණයි අපට මේ මහා නගරසභා ආඥා පනත යටතේදී නගරාධිපතිවරයෙකුට තම අභිමතය පාවිච්චිකරලා කරන්න පුලුවන් දේ.ඉතින් ඒක නිසා තමයි මම බෝහොම ප්‍රවේශමෙන් මේ අයවැයේදී මම කථාකරන්නේ.ඔබතුමා සහ ඔබේ පක්ෂය අවුරුදු 15ක් මෙහි පාලනය කරගෙන ගියා.අපි දන්නේ නැහැ ඊළග මැතිවරණයේදී ඔබතුමන්ලා මෙහෙ ඉන්න පුලුවන්. අපි ඒ පැත්තේ ඉන්න පුලුවන්.ඒක ජනතාවගේ අතේ තියෙන දෙයක්.නමුත් කවුරුහෝ ඒ බලයට එන ඒ කණ්ඩායම මා හිතනවා මා කියන දේ ප්‍රයෝජනවත් වෙයි කියලා.විශේෂයෙන් අපි අතර ඉන්නවා නවක තරුණ අත්දැකීම් ටිකක් අඩු මන්ත්‍රීවරු ඔවුන්ගේ යහපත පිණිස මට මේ ටික කියන්න කරුණාකරලා අවසර දෙන්න.නගරාධිපතිතුමනි මම විශ්වාස කරනවා සහ එක්සත් ජාතික පක්ෂය විශ්වාස කරනවා අපි සම්ප්‍රදායික විපක්ෂයක් හැටියට වගේ හැම දෙයකටම විරුද්ධවිය යුතු නැහැ කියලා.ඒක මගේ පුද්ගලික මතයයි.මම දන්න තරමට එක්සත් ජාතික පක්ෂය මතයත් එකමයි.ඔබතුමන්ලා යම් හොද දෙයක් කරනවා නම් අපි ඒ හොඳ දේ හොදයි කියලා කියනවා. යම් දෙයක් වැරදිනම් අපි ඒක වැරදි කියනවා.ඒ වැරැද්ද පෙන්නන්න පුලුවන් ශක්තියක් අපිට තියෙන්න ඕනේ.අපි නිකම් වැරදි කියලා වැඩක් නැහැ. නගරාධිපතිතුමනි මට මතකයි 1989 පමණ මම පළාත් සභාව නියෝජනය කරන කොට මගේ ප්‍රධාන ඇමති සුසිල් මුණසිංහ මම තමයි කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන භාරව හිටපු අධික්ෂණ මන්ත්‍රී අපිට තිබුණා ඒ දවස්වල ජේවිපි ඒකේ විශාල ප්‍රශ්න තිබ්බ නිසා තරුණ අය මැරේනවා. ගම්වල ලොකු ප්‍රශ්න තිබුණා. ඒම නිසා අපි සුසිල් මුණසිංහ මහා ඇමතිතුමාට කිව්වා අපිට ජනාධිපති ආර් ප්‍රේමදාස මහතාව හම්බවෙන්න ඕනේ කියලා.ඒ පාර සුසිල් මුණසිංහ ප්‍රධාන ඇමතිතුමා ඒවුවා මොකටද හේතුව ඒ පාර අපි කිව්වා අපිට දැන් කථාකරන්න ඕනේ මේ වැඩේ හරියන්නේ නැහැ අපිට ප්‍රේමදාස ජනාධිපතිතුමාට මුහුණට මුහුණ හමුවෙලා කෙලින් කථාකරන්න ඕනේ කියලා. අපේ ප්‍රශ්න තියෙනවා අපි එයාට කියන්නම් කියලා.ඒ පාර සුසිල් මුණසිංහ ප්‍රධාන ඇමතිතුමා රැස්වීමක් කැඳෙව්වා. අපේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ට සිරිකොතේ.මේ රැස්වීම පවත්වපු අවස්ථාවේදී අපි පස්දෙනෙක්ව තේරුවා ජනාධිපතිතුමාට කථා කරන්න.ඒක් කෙනෙක් මම අනෙක් එක්කෙනා ලෝරන්ස් මාදිවල හිටපු අමාත්‍යතුමා. අනෙක් එක්කෙනා මහින්ද සමරසිංහ ගරු අමාත්‍යතුමා. හිටපු අනෙක් එක්කෙනා දිවංගත දමින්ද මෙන්ඩිස්. පස්වෙනි කෙනා මට මතක නැහැ.කොහොම හරි මේ කථාවේදී දෙවෙනි කථාව තුන්වෙනි කථාව කරලා ඉවර වෙනකොට ජනාධිපතිතුමා අපෙන් අහපු එක ප්‍රශ්නයක් තිබුණා. එතුමා ආවේ රැස්වීමට රන්ජන් විජේරත්න ආරක්ෂක ඇමතිතුමත් එක්ක. අපේ කථාව අහලා එතුමා ඇහුවා ගරු මන්ත්‍රීවරුනි ඔබතුමන්ලාගේ විවේචනය මම අහගෙන හිටියා. දැන් ඔබතුමන්ලා මම වැරදි කියලා කියනවා. මම හරිගස්වා ගත යුත්තේ මොකක්ද? අපි එක මන්ත්‍රීවරයෙකුටවත් ඒකට උත්තරයක් දෙන්න බැරිවුනා. ඒවෙලාවේ හිටියා ඇල්මන් පිරිස් වගේ ජ්‍යොෂ්ඨ ඇමතිවරු. අපි එක්කෙනෙක්ටවත් උත්තරයක් දෙන්න බැරි වුනා.විනාඩි පහයි රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා කිව්වා ඔබතුමන්ලාගේ ගම්වල ගොඩක් වැඩ තියෙනවා මේ අවස්ථාවේදී. කරුණාකරලා ගම්වලට ගිහිල්ලා වැඩ කරන්න.ඔබතුමන්ලා සාකච්ඡාකරලා මෙයට විකල්පයක් තියෙනවා නම් මට කථාකරන්න. මමයි රන්ජනුයි නැවත වතාවක් එන්නම් කියලා.එකෙන් අපි ඉගෙන ගත්තේ ගරු නගරාධිපතිතුමනි කෙනෙක් විවෙචනය කරනවා නම් ඒ විවේචනය කරන වෙලාවේදී අපි ඒ විවේචනය කරන දේ මොකක්ද? ඒකට විකල්ය මොකක්ද? කියලා අපිට කියන්න පුලුවන්කමක් තියෙන්න ඕනේ.මෙයයි පණිවිඩය. මේ නවක මන්ත්‍රීවරුන්ට දෙන්න කැමති.ඊළගට ගරු නගරාධිපතිතුමනි තව දෙයක් මම ප්‍රේමදාස ජනාධිපතිතුමාගෙන් ඉගෙන ගත්තා. අපේ නායකයා ආර් ප්‍රේමදාස ජනාධිපතිතුමා. එතුමා ජනාධිපතිවෙලා ඉන්නකොට කිව්වා විපක්ෂය කියන නම භාවිතා කරන්න එපා කිව්වා. විපක්ෂය කියලා කියන්නේ හැමවේලේම හැම දෙයකටම විපක්ෂ වෙන ඒක නෙමෙයි කිව්වා. මම පාවිච්චි කරනවා මින්පස්සේ තමුන්නාන්සේලා ප්‍රතිපක්ෂය කියන නම පාවිච්චි කරන්න කිව්වා. ඒදා ඉදලා අපේ හැම අවස්ථාවේදිම බොහොදුරට පාවිච්චි කෙරුවේ ප්‍රතිපක්ෂය. දැන් නැවත වරක් විපක්ෂය කියනවා විපක්ෂය කියන නම පාවිච්චි කරපුවාම හැම වෙලේම විරුද්ධව යන ගතියක් තමයි පෙන්නේ. ඉතින් මම හිතනවා නැවත වරක් අපි හිතට ගතයුතු කාරණාවක් අපි වැරැද්දක් දැකපු තැන වැරදි කියමු. නමුත් ඒවගේම අපි හැම වේලේම ඒ වැරැද්ද නිවැරදි කරන්නට අවශ්‍ය අපිට දෙන්න පුලුවන් උපදේශත් අපි දෙන්න පුලුවන් වෙන්න ඕනේ. නගරාධිපතිතුමනි අපේ වේලපහින් කථාකරන වේලාවේදී අපේ ගරු මැක්සි මන්ත්‍රීතුමා කිව්වා මේ මොරටුව එදා ඉදලාම

තාම ඒවගේ කියලා මාත් ඒක පිළිගන්නවා. මම හිතන්නේ ඔබතුමත් ඒක පිළිගන්නවා. අපි අවට තියෙන අනෙක් නගර කැස්බෑව, පානදුර මේ සියල්ලක්ම පුදුම පිළිවෙලකට දියුණුවෙලා මම දන්නේ නැහැ. මොකක්ද මොරටුවට වෙලා තියෙන අකරතැබ්බය කියලා. මට මතකයි මම නගරාධිපති වෙන අවස්ථාවේදි මොරටුවේ සුපර්මාකට් කියලා තිබුන් නැහැ. ඔබතුමන්ලාට මතකනම් පලවෙනි සුපර්මාකට් ඒක ආවේ ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඉස්සරහා පිට කාගිල්ස් ෆුඩ් සිටි එක.ඒ අය මාව ඇවිල්ලා හම්බවුනා. මම ඉතාමත්ම සංතෝශවෙලා කිව්වා අනේ බෝහොම හොදයි එන්න. ඒක මොරටුවේ එක සුපර්මාකට් එකක්වත් නැහැ. කරුණාකරලා එන්න මගෙන් මොකක්ද වෙන්න ඕනේ කියලා. ප්ලෑන් එක අනුමත කරලා දෙන්න පුලුවන්ද කියලා. මම වහාම ඉංජිනියර්ස්ලා ගෙන්වලා අවශ්‍ය ෆෝම්ස් ටික දිලා අපි ඒ සැලැස්ම ගරු නගරාධිපතිතුමා පාස් කරලා දුන්නා ඔක්කෝම නිත්‍යානුකූලව. අපිට වුවමනා වුනා මොරටුව දියුණු කරන්න.ඉන් පස්සේ තමයි මේ මොරටුවේ ගොඩාක් සුපර්මාකට් එන්න පටන් ගත්තේ මම ඔබතුමාට කියනවා අපිට අවශ්‍ය වෙනවා මේ මහා නගර සභාවට මුදල් උපයාගන්න අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමා කිව්වා වගේ  අපිට ගොඩක් සම්පත් තියෙනවා අපි මේවායින් මුදල් උපයාගන්න ක්‍රම හොයාගන්න වෙනවා. විශේෂයෙන්ම අපිට මධ්‍යම රජය සහ මධ්‍යම රජයේ ඉන්න මැති ඇමතිවරුන්ගෙන් ලැබෙන මුදල් ගැන අපිට විශ්වාසයක් හැමවේලේම තබන්නේ නැතිව අපිට අපේ ශක්තියෙන්ම අපිට මුදල් උපයාගන්න ක්‍රම අපි හොයාගන්න ඕනේ. දැන් අපි ගත්තෝතින් එක දෙයක් තමයි අපි පිට රට අපේ රජය කියනවා පිට රට ආයෝජකයින්ට ලංකාවට එන්න කියලා. ඇවිල්ලා ලංකාවේ ඔවුන්ගේ මුදල් ආයෝජනය කරන්න කියලා ෆොරින් ඩිරෙක්ට් ඉන්වෙස්ට්මන්ට් දැන් අපිට කරන්න පුලුවන්. අපේ නගරය ඇතුලත විවිධ ව්‍යාපාර කරන්න එන අයව අපි රස්තියාදු කරන්නේ නැතිව එගොල්ලන්ගේ බිල්ඩින් ඇප්ලිකේෂන් එකක් ආවාම වහාම මෙය ගැන බලලා පුලුවන් ඉක්මණින් මෙය අනුමත කරලා ඒ අයව රස්තියාදු කරන්නේ නැතිව මේක එක අංශයක්. මේ ගැන මූලිකත්වයක් දෙන්න පුලුවන්නම් නගරාධිපතිතුමනි එකක් නගරය දියුණුවෙනවා. අනෙක් පැත්තෙන් ඒ ඒ ආයතනවලට මොරටුව ජනතාවට රැකියා අවස්ථාවන් ලැබෙනවා. මෙන්න මෙය ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලනවා.මම දන්නවා තව ක්‍රමයක් තමයි ඔබතුමා මේ මධ්‍යම වෙළදපොල සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.මෙන්න මේ  ආකාරයට අපිට සංවර්ධනයන් කරන්න පුලුවන්නම්. මේවායින් ලැබෙන මුදල් වලින් අපිට පුලුවන් වෙනවා මේ නගර සභාවට අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා ගන්න ඒවගේම අපිට පුළුවන් වෙන්න ඕනේ. අලුත් ප්‍රඥප්ති ඉදිරිපත් කරලා ඒ ප්‍රඥප්ති තුලින් අපිට දේවල් කරලා අපේ  බලය මේ නගරය තුල තහවුරු කරන්න.2003 වර්ෂය වෙනකොට අපිට වුවමනා වුනා පවර් ප්ලාන්ට් එකක් මේ නගරයේ ඇති කරන්න.ඒවෙලාවෙදි අපි විවිධ රටවල් වලින් ලංකාවට ආපු සමහරු කිව්වා ඒ අයට පවර් ප්ලාන්ට් එක කරන්න බැහැ. ඒ අය මොරටුවේ තියෙන ලී කුඩු අරගෙන ජපානය, එංගලන්තය, ජර්මනිය, ප්‍රංශය වැනි රටවල් වලට මේ ලී කුඩු වලින් ලි දඬු වගේ හදලා බ්‍රිකට්ස් හදලා අපනයනය කරන්න පුලුවන් කියලා. දැන් මෙය කරන්න ගරු නගරාධිපතිතුමනි අපිට බලයක් තිබුනේ නැහැ. අපි ප්‍රඥප්තියක් පාස්කෙරුවා මොරටුව මහා නගර සභාවේ ඉතිහාසයේ මොරටුව මහා නගර සභාවේ තමයි පලවෙනි ප්‍රඥප්තිය සම්මත කරලා අපේ කාලේ නගරාධිපතිතුමත් මේ සභාවේ එතුමාටත් ඒ ගෞරවය යනවා. අපි තමයි ඒක පාස්කෙරුවේ. මුළු බස්නාහිර පළාතේම එවකට පාස්කරපු එකම ප්‍රඥප්තිය ලී කුඩු සම්බන්ධව මොරටුව මහා නගර සභාව අපි ඒගැන ඇත්තටම ආඩම්භරවෙන්න ඕනේ.මොකද දැන් මේ ලී කුඩු නගර සභාව දැන් නගර සභාව සතු සම්පතක්. මේකේ විශාල මුදලක් අපනයනය කරලා මුදලක් ලබාගන්න පුලුවන්. මේ සම්බන්ධව නගරාධිපතිතුමනි මතක් කරන්න ඕනේ. මේක පාස් කරපු වෙලාවේ මා මිත්‍ර සේනක දමයන්ත මන්ත්‍රීතුමා පළාත් සභාවේ ඉදලා එතුමා පළාත් සභාවේ ලස්සන කථාවක් කරලා තිබුණා. එතුමා පළාත් සභාවේදි එතුමා ආඩම්බරයෙන් කියලා තිබුණා මගේ පක්ෂය අපේ මොරටුව පළාත් සභාව බිහිකරපුවාට පස්සේ පාස් කරපු මේ ප්‍රඥප්තිය ගැන ඒතුමා සංතෝශයෙන් බස්නාහිර පළාතේ කථාකරලා තිබුණා.  මම එතුමාට ස්තූතිවන්ත වෙනවා අද ඒ කටයුත්ත එදා කෙරුවේ. ඉතින් එතුමාටත් එක සංතෝශයක් වුනා. බස්නාහිර පළාතේම පලවෙනි ප්‍රඥප්තිය අපි පාස්කරපු එක ගැන. ඉතින් නගරාධිපතිතුමනි අපි කථාකරේ මොරටුව සංවර්ධනය කිරිම ගැන. ටිරෝන් ප්‍රනාන්දු ගරු ඇමතිතුමා මොරටුව සංවර්ධනය කිරිමට ප්ලෑන් එකක් තිබුණා. මොරටුව ඩිවලොප්මන්ට් ප්‍රෝගෑම් කියලා ඒ ප්ලෑන් ඒක ලස්සනට හදලා ඔක්කෝම කරලා තිබුණා. නමුත් ඒක ක්‍රියාත්මක වුනේ නැහැ.මම

ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අඩු වශයෙන් ඔබතුමා ස්ටාට් එකක් දෙන්න UD එකත් එක්ක කථාකරලා මොරටුව ඩිවලොප්මන්ට් ප්ලෑන් එකක් හදලා මොරටුව සංවර්ධනය කරන්න. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය වහාම යොමු කරන්න. අපි ඊළග ඡන්දයකට යන්න ඉස්සේල්ලා අවසාන වශයෙන් මේ මහා නගර සභාවේ වැඩ කටයුතු පාලන වැඩකටයුතු අපි වෙනත් අවස්ථාවකදි කථාකරන්න. අපි දැන් ඉන්නේ අලුත් ලෝකයක හැම දෙයක්ම ටෙක්නොලෝජිවලින් පාවිච්චි වෙන්නේ. තාක්ෂණය සහ කම්පියුටර්ස්. මා සංතෝශයි ඔබතුමාගේ නායකත්වයෙන් දැනට කම්පියුටර්ස් ඔපරේට් කරන්න පුලුවන් නිලධාරින් කිහිපදෙනෙක් ඉන්නවා. මේ ළගදි ඔවුන් සමග වැඩකටයුතු කරන්න සිද්ධවුනා. ඒ අය ඉතාමත්ම දක්ෂයි. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපි ඉස්සරහාට යන්න ඕනේ. මම යෝජනාවක් කරනවා අවශ්‍ය ස්ථානවලින් අවසර ලබාගෙන හෝ කම්පියුටර් ඩිවිෂන් එකක් ඇතිකල යුතුයි.මම හිතන්නේ දැන් ඉන්න නිලධාරින් වෙනම දෙවල් වලින් අනුයුක්ත කරලා තියෙනවා. මම කියන්නේ කම්පියුටර් ඩිවිෂන් එකක් තියෙන්න ඕනේ. එකක් කැඩෙන කම්පියුටර්ස් හදන්න. ඒවගේම කම්පියුටර්ස්වල තියෙන ඩේටා අප්ඩේට් කරන්න. ඒවගේ දේවල් සියල්ලම කරන්න විශේෂ කම්පියුටර් ඩිවිෂන් එකක් ඇතිකරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, සුජිත් පුෂ්පකුමාර ගරු මන්ත්‍රිතුමා කථා කලා මහජන උපයෝගි සේවා කොහොමද එකපාරටම මිලියන 30 වුනේ කියලා. ඒ මිලියන 30 තමයි මේ සම්බන්ධයෙන් ලිහිණි මන්ත්‍රිතුමිය කථාකරන කොට කාරක සභා අවස්ථාවේදි මන්ත්‍රිතුමිය කියනවා ඇයි ඔබතුමා අවුරුදු 4කට පාරක් එකතු කරන්නේ. අපි වාහනයක් ගත්තාම ඒ වාහනයට අවුරුද්දක් පාසා කැඩුනොත් හැප්පුනොත් නැතත් අපි ගෙවනවා. මේක අවුරුද්දක් පාසා එකතු කරනවා. මම කිව්වා එහෙම කරන්න ඕනේ නැහැ. මේක ක්ෂය විමට ඇති කාලය ගිණි නිවන ඇදුම්වල. ඒක නිසා ක්ෂය වන කාලේට විතරක් අපි ගමු කියලා තමයි අවුරුදු 4කට ගත්තේ. එතුමිය කියනවා අවුරුද්දේන් අවුරුද්දට මේක කරන්න කියලා. සාමාන්‍යයෙන් අපි වාහනයක් ගත්තත් රක්ෂණය කරනවා. ඒවගේ ගිණි රක්ෂණයක් මේ තියෙන්නේ. ඒකනිසා අවුරුදු 4න් 4රට ගියා. ලබන අවුරුද්දේ පලවෙනි පියවර තියනවා.එතන ලක්ෂ 200කුත් ඒවගේම මධ්‍යම කටුබැද්ද වෙළදපොල ඒක අපිට ප්‍රාග්ධනයක් වැය වෙච්ච මුදලක් නෙමෙයි. ඒ වියදම දැරුවේ යහපාලන ආණ්ඩුව නමුත් ඒ ආණ්ඩුව වැය කරපු මුදලත් එක්ක තක්සේරු කරලා ලබාදෙන මුදල 103 ක් වෙනවා.ඒ මුදල තමයි මිලියන 30.3ක්වෙන්නේ. හරියටම ලක්ෂ 303ක් වෙන්නේ. ඉතින් ඒනිසා ඒ මුදල හරි. ඊළග එක තමයි මොකටද නිතිඥ ගාස්තු මෙතන වැඩි කරන්නේ කියලා. නිතිඥ ගාස්තු වැඩිකරන්න ප්‍රධාන හේතුව තමයි අපිට හිමි ධනස්කන්ධයකින් යුක්ත ඉඩම වටිනාකම ලක්ෂ තිස්අටදාසක් වටින ඉඩමක් තමයි ඔය ක්‍රිඩාංගනය එක.ලක්ෂ 40ගානේ පර්ච් එක තිබ්බොත් ලක්ෂ 38000ක් අක්කර 6 160වැඩිකිරිම 6 එක වැඩි කිරිම ලක්ෂ 40 ගාන එනවා බිලියන 3.84ක් අන්න ඒක බේරගන්න ජනාධිපති නිතිඥ සාලිය පිරිස් මහතාට

**(සභා ඝෝෂා)**

මේ ඔප්පුව අපිට ලබා නොදෙන්න කටයුතු කරපු නායකයෝමේ ඔප්පුව අද ස්ටේඩියම් එක අපිට එවලා තියෙන ලිපිවල තියෙන්නේ මොරටුව මහා නගර සභාවට දීලා තියෙන්නේ පරිපාලනමය අයිතියක් විතරයි. අයිතිය තියෙන්නේ ක්‍රිඩාංගනය ඒක තියෙන්නේ මොරටුව එස් සි එකට කියලා.

ගරු සේනක දමයන්ත මන්ත්‍රිතුමා අහනවා මොනවද අපි කරලා තියෙන්නේ කියලා. අධ්‍යාපනයට මොනවද කරේ. සුසන්ත මහත්තයා ඉන්න කාලේ කරපු දෙයක් විතරයි. ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ඉන්න කාලේ කරපු දෙයක් විතරයි. අපි කියනවා ඒගොල්ලෝ කරා තමයි. අපි නැහැ කියන්නේ නැහැ. ගරු මන්ත්‍රිතුමා ඔය 1977 කියන කාලේදි සිංගප්පූරුවේ නායකත්වයට එන කණ්ඩායම කියනවා ලංකාව වාගේ රටක් හදන්න අපිට ඡන්දය දෙන්න. අපි අවුරුදු විස්සකට පස්සේ කියනවා සිංගප්පූරුව වගේ රටක් හදන්න අපිට ඡන්දය දෙන්න. සිරිමාවෝ බණ්ඩාරනායකගේ විදේශ ප්‍රතිපත්තිය ඒ තරම් හොද නිසා සල්ලි උනලා තිබුණු රටක

සිංගප්පූරුව එදා 1977 ඡන්දයේදි එහෙම කියපු වේලාවේදි වැඩ කරන්න සල්ලි ඕන තරම් තිබ්බා. මහවැලිය ආරම්භ කරා. මේ ඔක්කෝම වැඩ කරන්න සල්ලි තිබුණා මේ රටේ. ඊට ප්සසේ අධ්‍යාපනයත් එක්ක පාසල් ආරම්භකරා. අපි දන්නවා පාසල් ආරම්භකරා කියලා. ජන ජය, පොදු ජය ආරම්භ කරා අපිත් විල්ලෝරවත්ත ඉස්කෝලේ ඉදලා ආවා. අපි පයින් ආවේ. ඊට පස්සේ ජාතික ප්‍රතිපත්තියක් ජාතික පාසල් හදලා ඒ ප්‍රතිපත්තියත් එක්ක වේල්ස් කුමර විද්‍යාලය, වේල්ස් කුමරි විද්‍යාලය, ශාන්ත සෙබස්තියන් විද්‍යාලය වගේම මෙන්න මේ ප්‍රතිපත්තිය නිසාත්මේ මොරටුවේ අපි යනකොට ඉස්කෝල 42ක් තිබ්බා. ප්‍රයිවට් ඉස්කෝල 2ක් එක්ක 42ක් තිබ්බා. අන්තිමට දැන් ගණන් බලනකොට මේ ජාතික පාසල් දෙකයි ජතික පාසල් නොවන මේ පාසල් දෙකයි එ පාසල් දේකේ සංඛ්‍යාවයි සියලුම පාසල්වල සංඛ්‍යාවයි ගත්තාම ඒ හතරේ ඉන්නවා අර සියලුම පාසල් වලට වඩා. මෙන්න අධ්‍යාපනය කඩා වැටුනු තැන්. පාසල් වැහිච්ච තැන්.අපි ඉස්කෝලේ යන්නේ විල්ලෝරවත්ත ඉස්කෝලේ. අපි යනකොට ළමයි 900-1000 හිටියා. කඩලාන ශාන්ත අන්තෝනි විද්‍යාලයේ ළමයි එක්ස්දහස් එකසිය ගානක් හිටියා.මම මේ දෙකේම ඉගෙන ගත්තා. මේ ඉගෙනගන්න කාලේ පාසල් එකපාරටම ළමයි පළවෙනි වසර යන්න ගියා සම්පූර්ණයෙන්ම ජාතික පාසල් වලට. ඒ හේතුව නිසා පාසල් කඩා වැටෙන්න පටන් ගත්තා. සේනක දමයන්ත මන්ත්‍රීතුමා අහනවා මොනවද කරේ කියලා. UNP හොදට කලා. අරගොල්ලන්ගෙත් ඇතුලුවන්නාවූ 62000ක් නැති කරලාම කලා. අපි කරපු දේවල් කියනවා නම් ධීවර වරාය අපේ,නව ගාලු පාර කල්දේමුල්ල දක්වා කාණු දාලා අපේ. ඔබතුමන්ලා කියනවා මේක අවසන් ඒක. ඔව් අවසාන එක වෙන්න ඇති. මේ අවසාන විදියටම නගරාධිපතිවෙච්ච අවස්ථාව වෙන්න ඇති.හැබැයි ඕක කියනකොට එදා තුන්දෙනෙක් එක්ක මොරටු වාදේදි කියන කොට ජනාධිපතිත් හිටියා ආණ්ඩුවත් අපේ නෙමෙයි මේ ඔක්කොම තියෙද්දි ඕක කියලා වෙච්ච දේ අපි දන්නවානේ.

**(සභා ඝෝෂා)**

පානදූර නගර සභාවේ ඒ ඇරුණු කොට ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වැලිගම මහරගම මේ වගේ එකොලහක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තරග නොකරන තැනක එකම එක මන්ත්‍රීවරයෙක් එනවා පානදුරේන්.ඒච්චරයි එන්නේ.නැතිවෙලාවෙත් බැරිනම් කොහෙ කරන්නද අපි එන එක අපි තිරණය කරගන්නම්.ගරු මන්ත්‍රීවරුනි,ලිහිණි මන්ත්‍රීතුමිය කියනවා ඔබතුමා කරපු එකම දේ තමයි පර්චස් 2-3ට ගෙවල් හදන්න බිල්ඩින් හදන්න දුන්නා කියලා. මේක මම දිපු එකක් නෙමෙයි. මේක නාගරික සංවර්ධන අමාත්‍යංශයෙන් සංවර්ධන සැලැස්මෙන් දිපු එකක්. මේක මම කරපු එකක නෙමෙයි.මේක 2005 ඉදලා පර්චස් දෙකට දිලා තියෙනවා.මේක දිලා තියෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. ගරු මන්ත්‍රීවරුනි 2015 ජනවාරි මාසෙ 9 පසු දිනක මේ මොරටුව මහා නගර සභාවට නාගරික මන්ත්‍රීවරු නොවන කණ්ඩායමක් සමග ඇවිල්ලා මේ මොරටුව මහා නගර සභාවේ කැඩැස්තර සිතියම් සදහා ලබා දෙන ලද අනුමැතින් සම්බන්ධයෙන් ෆයිල් 2000ක් විතර ගෙනිච්චා. හරිම සන්තෝෂයෙන් මම හිටියේ මොකද ඕනතරම් නිති තියෙනවා කියනවානේ අපිව යම් යම් නිතිවලට කොටු කරන්න පුලුවන් බලාගෙන හිටියා 2015 ජනවාරි මාසේ 9 පසුවත් කරයිද කියලා හෙටත් ගිය හැකි ඕන කෙනෙකුට කිසි ගැටලුවකුත් නැහැ.එදා යහපාලන ආණ්ඩුව කාලේත් ඒකට බයවුනේ නැහැ. දැනුත් බය නැහැ. යාලුකමක් මේවාට නැහැ.දැනට අල්ලස් දූෂණ එකට ගිහිල්ලා තියෙනවා 5 වතාවක්. යහපාලන ආණ්ඩුවේ එෆ්සිඅයිඩියට ගියා හතර වතාවක්. ජනතාවට උදව් කරන්න ගියාම ඒ ෆයිල් අරගෙන ගියාම එතනින් ආපු උත්තරය මොකක්ද කියලා එගෝල්ලෝ දන්නවා ඇති.12 දෙනෙක් ගියා අන්තිමට සාක්ෂි දෙන්න කට්ටිය නැති නිසා මට ලියුමක් එවනවා ඔබේ එවන ලද තොරතුර පිළිබදව ඉදිරිපත් වෙච්ච අය එන්නේ නැති නිසා ඉවත් කරගනු ලැබේ කියලා. විශේෂයෙන්ම මොරටුව මහා නගර සභාවේ 2006 අපි භාරගන්න කොට මිලියන 100ක් විතර තිබ්බ බජට් එක මේවෙනකොට මිලියන 1272 දක්වා වැඩි කරගනිමින් මා ඉදිරිපත් කරන ලද මේ අයවැය ලේඛණය සුවිශේෂී තත්වයක් තියෙන්නේ මේ අයවැය ලේඛනයේ පුන පුනා කියන්න ගියේ නැහැ අර ලක්ෂ 650ක් වියදම් කරලා ලුනාව කලපු මන්ත්‍රීරුව හදපු එක මේකේ නැහැ.මේකේ සදහන් කලේ නැහැ.කවුරුහෝ හදපු හදලා දිපු යම් යම් දේවල් මේ අයවැය ලේඛනයට ඇතුලත් කරලා නැහැ.හෙට අනිද්දා රජයෙන් ලැබෙයි කියලා හිතෙන පළාත් සභාවෙන් ලැබෙයි කියලා හිතන ඒවා මේකේ ඇතුලත් කරලා නැහැ.ලක්ෂ 90 විතර වියදමක් දරලා බේල් මැෂින් තුනයි,ක්‍රෂර්

මැෂින් දෙකයි දිපු ඒවා මේකේ ඇතුලත් කරලා නැහැ.මේ බජට් එකේ නැහැ.එහෙම නැතිව හදලා ලබන පාර මේ අපිට පුලුවන් වුනොත් විශේෂයෙන්ම මන්ත්‍රිවරු හොයලා බලන්න ඕනේ මුදල් වැඩිවෙලා තියෙන්නේ කොහෙද? ඒ වැඩිවෙලා තියෙන මුදල් දැන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රභාෂිණී මන්ත්‍රිතුමිය ඒවුවා මට හරි බයක් තියෙනවා බැරි වේලාවත් යම රජ්ජුරුවෝ නිශාන්ත ජරදිනාන්දුම වුනොත් මට ගිහිල්ලා කියන්න පුලුවන් වැය ශිර්ෂයක් නැති බජට් එකක් නැති ඔබතුමාගේ මන්ත්‍රිතුමිය කිව්ව නිසා මම ලැබ් එකක් හදන්න වියදම් කරා. අනේ යම රජ්ජුරුවනි ඒකට සමාව දෙන්න කියලා. මෙයා යම රජ්ජුරුවො වුනොත්. ඒක නිසා එහෙම කරන්න පුලුවන්. හැබැයි මේ වැය ශිර්ෂ නැති ඒවා පනතේ තියෙන විදියට ජනතා සුභ සිද්ධියට කරන්න පුලුවන් ඒවා කරනවා කරනවාමයි. විශේෂයෙන්ම යම් යම් මුදල් වැඩි උනේ කොහොමද කියන එක සමහර වේලාවට සුජිත් පුෂ්පකුමාර ගරු මන්ත්‍රිතුමා අහනවා කොහොමද මේ මුදල් වැඩිවෙන්නේ ලක්ෂ 20 කොහොමද 150 දක්වා වැඩිවෙන්නේ.එතුමා දන්නවානම් එතුමා කාරක සභාවට ආවානම් එතුමා ඒ පිළිබඳව අවබෝධයක් ගන්නවා. මට මේ බජට් එකක් දිලා බජට් ඒකේ එක අකුරෙන් අකුර පැහැදිලිකරලා දෙන්න මට වුවමනාවක් නැහැ.හැබැයි ඒක වැඩි වෙන්නේ මෙහෙමයි පානදුර නගර සභාව,පානදුර ප්‍රාදේශිය සභාව,කැස්බෑව නගර සභාව,බොරලැස්ගමුව නගර සභාව, බණ්ඩාරගම නගර සභාව මේ යනාදියෙන් මේ සියලුම අය අපිත් එක්ක එකඟතාවයට එනවා ඔවුන්ගේ ගිනි නිවිමේ ප්‍රධාන ආයතනය විදියට අපිව සලකන්න. ඒ අනුව ව්‍යාපාරික ස්ථාන වලින් ගන්න මුදල මෙහෙ මුදල් වගේ නෙමෙයි වැඩි කරලා ගන්න මුදල තමයි ලක්ෂ 150 අපි ටාගට් වලට අපි යන්න ඕනේ. අර ලිහිණි මන්ත්‍රිතුමිය කිව්වා තව අය කිව්වා පුන පුනා කැගැහුවා අපි ඒ ඉලක්කයට යන්න සුදානම්වෙලා හිටියා.ඒ ඉලක්කයට යන්න රටේ තියෙන තත්වයත් එක්ක බැරිවුනා.අද ඒක පෙන්නලා නැතිවුනාට හෙට දවසේදි මැලේෂියානු රජයේ නියෝජිතයෝ කට්ටියක් ඇවිල්ලා මේවා බලලා ගියා හෙට ඔවුන්ට පුලුවන්වුනොත් අපි මේ යෝජනාව නැවත පටන් ගන්නවා .නතර කරන්නේ නැහැ මේවා එකක්වත් කසල එදා අපිට මිලියන 400යි.ලක්ෂ 4000ක් යන වැඩේ අද ලක්ෂ 6000ක් යන්න පුලුවන් හෙට සල්ලි හම්බවුනොත් ආයේ පටන් ගන්නවා බජට් කියන්නේ ඉලක්කයක්.ඉලක්කයක් කරා යන බජට් එකක් තමයි මේක. රජයටත් වේවා මේක ගත්තාම ප්‍රංශයේ,ජර්මනියේ කර්මාන්ත ශාලා වල් ඇදගෙන වැටිම තුල වැටිලා තියෙන ආර්ථික අහේනියත් එක්ක වැටිච්ච යුරෝපයේ රටවල් සංඛ්‍යාව අතිශායින්ම වැඩිවෙලා තියෙනවා. ඒක නිසා විශේෂයෙන්ම ලෝකයේ එන්ගලන්තයේ, ජර්මනිය,ඉතාලිය වගේ රටවල් වල ඒ නගරවල ඉන්න නගරාධිපතිවරු කොච්ඩ් වලින් වලින් වැටෙන වේලාවක අපිට පුලුවන් කම ලැබුණා හයියට ඉන්න. කොහොම වුනත් වියදම් දැරිම වියදමක් කියන්නේ ආදායමක් කියන්නේ නොලැබෙන එක වෙන්න පුලුවන්. ලැබෙන එකක් වෙන්න පුලුවන්. ඒ සදහා අදාල වෙන්නාවූ නිතිමය විදියට ඒ ලියවිල්ල ගැසට් කරලා ඒ ලියවිල්ල පුවත් පත් වල දාලා ලියවිල්ල ජනතාවට බලන්න දිලා කරපු ලියවිල්ල. මේ ලියවිල්ල හොර රහසේ හදලා හොර රහසේ සභාවට ගෙනාපු ලේඛනයක් නෙමෙයි.මේ ලේඛනයේ තියෙන්නාවූ ඕනෑම දෙයකට මේ ලේඛනය ඉදිරිපත් කරලා සම්මත කරගන්නනට පෙර ඒ සම්බන්ධයෙන් විරෝධය පාන අධිකරණයට යන්න දින 14 කට පෙර ගැසට් කරපු ලියවිල්ලක් මේ.දින 14 පෙර පුවත් පත් දැන්විම් දාපු ලියවිල්ලක් මේ. ඒකනිසා මිනිස්සු ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා ඇති ඊලග මැතිවරණය කවදා හෝ වේවා හැබැයි මගේ සහෝදර මන්ත්‍රිවරු,කොට්ඨාශය දිනපු මන්ත්‍රිවරු, කොඨ්ඨාශ පැරදිලා නැවත දිනන්න බලාගෙන ඉන්න මන්ත්‍රිවරු සියලුම දෙනා ඒ අපේක්ෂාව තුල ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන ලාංඡනයෙන් නැවත ඉදිරිපත්විම පිළිබඳව අපිට ගැටලුවක් නැහැ. අවසාන එක වෙන්නට පුලුවන්. හැබැයි ගෙදර ගියත් යන්නේ මම ඡන්දය දාන බූත් එකෙන්ම ඡන්දය ඉල්ලලා.ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා ගෙදර යන්නේ,සමන්ත සිල්වා නියෝජ්‍ය නගරාධිපතිතුමා ගෙදර යන්නේ තමන් දාන ඡන්දේ පොලේන්ම ඡන්දය දාලා තමයි එකෙන් පැරදිලා ගෙදර යන්නේ. මම අනිවාර්යෙන්ම ආඩම්බරවෙනවා මේ අයවැයේදි නොලැබෙන ඉලක්කම් ලියලා ඒ නොලැබෙන ඉලක්කම් වලින් ගාන වැඩි කරනවාට වඩා මා විශ්වාස කරනවා මැතිවරණයට දින ප්‍රකාශ කිරිම කෙසේ වෙතත්,

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, ගිය අවුරුද්දට ඉස්සෙල්ලා අවුරුද්දේ ඡන්ද 16කිනුත්,ගිය අවුරුද්දේ ඡන්ද 21කිනුත් ජයග්‍රහණය කරපු අපි මේ ගමන ඡන්ද 24 කින් දිනන බව ප්‍රකාශ කරමින් 2023 කෙටුම්පත් අයවැය ලේඛනයට ඡන්ද විමසීම සිදු කරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩ සටහන් අයවැය ලේඛණය අනුමතකිරිමට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

ඒ අනුව, 2023 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩ සටහන් අයවැය ලේඛණය අනුමත කිරීමට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍රරංගන ප්‍රනාන්දු මහතා |

ඒ අනුව, 2023 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩ සටහන් අයවැය ලේඛණය වැඩි ජන්දයෙන් සභා සම්මත විය.

සභාවේ වැඩ කටයුතු මෙතනින් නිමාවිය.

අ.කළේ - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2022.11.25 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.